ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2014 ක් වූ ඔක්තෝබර් 26 ඉරිදා 149 වෙළුම 22 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## “නවීන නායකයා” භාග්‍යවරයට!

ස්වර්ගස්ථ වී වදාළ අති උතුම් සවැනි පාවුලු ශුද්ධෝත්තම පියතුමාව ඉකුත් ඉරිදා වතිකානයේ සාන්ත පීතර බැසිලිකාවේදී අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් විසින් භාග්‍යවරයට ඔසොවන ලදි.



ලෝක රදගුරු සංසදය පවුල පිළිබඳ විශේෂ සමුළුව අවසන් කිරීමෙන් අනතුරුව ඊට සහභාගි වූ රදගුරු හිමිපාණන්ගේ ද සහභාගිත්වයෙන් පැවැති මෙහෙයට විශ්‍රාමික අති උතුම් සොළොස්වන බෙනඩික් සසුන් පියා ද සහභාගි විය.

අති උතුම් 23 ජුවාම් ශුද්ධෝත්තම පියතුමා කැඳ වූ දෙවන වතිකාන කතිකාව උන්වහන්සේ ස්වර්ගස්ථ වීමත් සමග ඇණ හිටින්නට ඉඩ තිබුණත් අති උතුම් කාදිනල් මොන්ටිනි හිමිපාණන් සසුන් පිය ධුරයට පත්වීමෙන් අනතුරුව දෙවන වතිකාන කතිකාව දිගටම පවත්වා ගෙන යන්නට පියවර ගත් අතර ශුද්ධාසනයට පත් වූ “නවීන නායකයා” ලෙස එතුමාව හඳුන්වා දුනි.

භාග්‍යවර මෙහෙයට 1970 දෙසැම්බර් මාසයේ දී පිලිපීනයේ ගුවන් තොටුපළේ දී අති උතුම් සවැනි පාවුලු සසුන් පියාට පිහියෙන් ඇනීමේ සිදුවීමේ දී ගලාගිය රුධිරය තැවරුණු කමිසය ශුද්ධවූ වස්තු ලෙස අල්තාරය මතට රැගෙන ආවේය.

## සෑම මිනිත්තු පහකට වරක් කතෝලිකයකු දංගෙඩියට

# මානව හිමිකම් ක්‍රියාකාරීන් දෙලක්ෂයක් යෝධ පෙත්සමක් බාර දෙති

ශිරාන් මෛත්‍රි විසිනි

**ලෝකය පුරා පීඩාවට පත්ව ජීවිතයත් - මරණයත් අතර කල් ගෙවන කිතුනුවන් සඳහා සැබෑ ආධාරයක් වන්නට නම් යුරෝපා නායකයන් ඔවුන් වෙනුවෙන් නැගී සිටිය යුතු යැයි දෙලක්ෂයකට අධික මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් අත්සන් කර ඉදිරිපත් කර ඇති යෝධ පෙත්සමකින් ඉල්ලා සිටිති.**

යුරෝපා සංගමයටත්, යුරෝපා මහද්වීපයේ බලවත් රටවල නායකයන්ටත් ඉදිරිපත් කර ඇති මේ පෙත්සම මඟින් මැද පෙරදිග කලාපය ප්‍රමුඛව ලොව විවිධ රටවල කිතුනුවන්ට සිය ආගම කිතු දහම වීම නිසාම බරපතල ගැටලු වලට මුහුණ පාන්නට සිදුවී ඇති බව මේ පෙත්සම මඟින් අවධාරණය කර ඇත. පාකිස්ථානයේ කිතුනු කාන්තාවක, දරුවන් පස් දෙනෙකුගේ මවක වන ආසියා බිබිට එරෙහි මරණීය දඬුවම ආගම් අපහාස නීතිය යටතේ පනවා ඇති බව පෙන්නා දෙන අතර මෙවැනි බොහෝ සිදුවීම් ලොව තැනින් තැන සිදුවූවත් ඒ පිළිබඳ ඇඩි අවධානයකට ලක් වී නැතැයි පැවසේ.

ජාත්‍යන්තර මානව හිමිකම් වාර්තාවන්ට අනුව ලෝකයේ ආගමික හිංසනය එල්ල වන්නේ කිතුනුවන්ට බවත්, ඇමෙරිකා එක්සත් ජනපද වාර්තාවලට අනුව වසරකට කතෝලිකයන් ලක්ෂයකට අධික පිරිසක් දහම නිසා සිය ජීවිත පූජා කරන බවත්, එය සෑම මිනිත්තු පහකටම සිදුවන එක් මරණයක් බවත් ගණන් බලා තිබේ.

මේ අතර නොවැම්බර් 25 වැනිදා යුරෝපා පාර්ලිමේන්තුවේදී අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා පවත්වන දෙසුමේ දී ආගමික නිදහස පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ඇතැයි පැවසේ.



නයිජීරියාවේ විවාහ මංගල දිව්‍ය පූජාවක දී බොකො-හරාම් මුස්ලිම් ත්‍රස්තවාදීන් පැමිණී සියල්ලන් ඝාතනය කරන ලදි.

## මළවුන් සිහි කිරීම

උතුරු කොළඹ දිසාවේ සියලුම සැදැහැවත් ජනතාව විසින් 2014 නොවැම්බර් මස 02 වන ඉරුදින මාදම්පිටිය කතෝලික පොදු සුසාන භූමිය තුළ තම මිය ගිය ඥාති මිත්‍රාදීන් සිහි කරන අතර මෙදින දිව්‍ය පූජා යාගය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ දිසාවේ සියලුම පූජා ප්‍රසාදිතුමන්ගේ සහභාගිත්වයෙන් එදින සවස 4.00 ට පැවැත්වේ.
සවස 3.30 ට ජපමාලය උච්චාරණය කරනු ලැබේ.
**(සුසාන භූමි පරිපාලක පියතුමා)**

හලාවත, මාදම්පේ ප්‍රදේශයේ දේවගැතිවරයකු යැයි හඳුන්වාගත් අයෙක් තම යාච්ඤා මධ්‍යස්ථානයට පැමිණි දැරියන් දෙදෙනකු දූෂණය කර අනතුරුව තමන්ද වස පානය කොට මිය ගිය පුවත පසුගිය දිනවල මාධ්‍ය වාර්තා කොට තිබිණි.
මේ පුද්ගලයා කතෝලික පූජාප්‍රසාදිතුමකු නොවන බවත් මේ රටේ හතු පිපෙන්නා සේ විවිධ තැන්වල බිහිවී ඇති ආගමික කණ්ඩායමක දේවගැතිවරයකු යැයි තමන් විසින්ම හඳුන්වා ගන්නා ලද පුද්ගලයකු බවත් අවධාරණය කරමු. ඔහු විසින් සිදුකර ඇති මේ මහා අපරාධය කතෝලික සභාව ලෙස අපිදු පිළිකුළින් හෙළා දකිමු.
**(ජා.කතෝලික ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු සිරිල් ගාමිණී පියතුමා)**

## ජාතික තලයේ බැබළෙන කතෝලික අපේ දූ දරුවෝ



ජාතික ශිෂ්‍ය භට බලකායේ සමස්ත ලංකා තරගාවලියේදී අනුශූරතාවය කඳාන ද මැසනඩ් විදුහල දිනාගත් අතර මෙය වසර ගණනාවකට පසුව කතෝලික පාසලක් ලද විශිෂ්ට ජයග්‍රහණයකි. කුසලානය අතැතිව විදුහලේ ක්‍රීඩා සම්බන්ධීකාරක ගරු පුබුදු රාජපක්ෂ සහෝදරතුමා, හිටපු ක්‍රීඩා ආචාර්ය උපාලි සිල්වා මහතා, ශිෂ්‍ය භට කණ්ඩායම් භාර කපිතාන් ෆ්‍රැන්ක් මර්තිනු මහතා, ශිෂ්‍ය භටයින් සමග ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. **(ගාමිණී රණවීර)**



වැල්ලවත්ත සා. ලෝරන්ස් කන්‍යාරාමය 2014 රාජ්‍ය ළමා නාට්‍ය උළෙළේ හොඳම නාට්‍ය අනුශූරතාවය දිනා ගැනීමට සමත් විය. 2008 වසරේ සිට නොකඩවා ජයග්‍රහණ අත්කර ගනිමින් මෙවර ද විදුහල්පතිනි ගරු මේරි චන්ද්‍රිකා පෙරේරා පැවිදි සොයුරිය විසින් රචනා කර ඉදිරිපත් කරන ලද “අලුත් කරත්තේ” නාට්‍යයට මේ සම්මාන හිමිවිය. වසරේ දක්ෂතම ළමා නිළිය ලෙස නටාෂා බෙන්ජමින් සිසුවිය ද, රංගන කුසලතාවය සඳහා ජූරියේ කුසලතා සම්මානය බුහුනි අකුරුගොඩ සිසුවිය විසින්ද දිනා ගන්නා ලදි. **(ශ්‍යාමලි හික්ගොඩ)**

Please Like pope visit sri lanka official facebook page.
www.facebook.com/popevisitsrilanka2015 ■ www.popefrancissrilanka.com

පදවියෙන් පදවියට

# ලේඛන කලාව තුළින් මිනිස් ගෞරවයේ උතුම්කම පහදා ජීවිත වඩාත් ලස්සන කළ යුතු!

## අගරදගුරු හිමිපාණෝ කතෝලික සාහිත්‍ය උලෙළේදී අවධාරණය කරති

**ආගම් අන්තවාදය අද ලොව පුරා පැතිර යමින් පවතිනවා. එයින් නැති භේද ඇති වෙනවා. කිසිම ආගමක එහෙම කියා නෑ. සමහර විට භාෂාව මිනිසුන් පාගන්න යොදා ගන්නවා. ජාතිය, ආගම, භාෂාව මගින් බෙදීම් ඇති කිරීම තහනම් කළ යුතුයි. ලේඛන කලාව තුළින් මිනිස් ගෞරවය උතුම්කම පහදා දීමත් මිනිස් ජීවිතය වඩාත් ලස්සන කිරීමත් විය යුතුයි. රට තුළ මාධ්‍ය නිදහස නැති වුණේ 1960 ගණන් වල පුවත්පත් පාලනය කිරීමේ පනත නිසයි හැම රජයක්ම මාධ්‍ය මර්ධනය කරන්න කටයුතු කළා.**



කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් එසේ අවධාරණය කළේ, පසුගියදා 6 වන පාවුළු මධ්‍යස්ථානයේ මුළුදුන් ජාතික කතෝලික ලේඛක හවුලේ 29 වන සංවත්සරය හා කතෝලික සාහිත්‍ය උලෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වෙමිනි.

තේමා දේශනය කරන ලද්දේ ප්‍රවීන චිත්‍රපට හා වේදිකා නාට්‍ය අධ්‍යක්ෂ කලාසූරි ධර්මසිරි බණ්ඩාරනායක මහතා විසිනි. ජාතික කතෝලික ලේඛක හවුල මගින් (Face Book) මුහුණු පොත පිටුවක් විවෘත කිරීම කාදිනල් හිමිපාණන් අතින් සිදුකැරිණ. මේ උලෙළට අනුශාසක හා ජාතික කතෝලික ජනසංනිවේදන අධ්‍යක්ෂ ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු, ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන සංස්කාරක ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි, කොටුගොඩ මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු, භක්ති ප්‍රබෝධන සංස්කාරක ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි, ගරු ජූඩ් සමන්ත පියවරුන් ඇතුළු ගිහි පැවිදි රැසක් සහභාගී වූහ.

ජාතික කතෝලික ලේඛක හවුලේ සභාපති ලෙනාඩ් කුරේ මහතා පිළිගැනීමේ කථාවද ලේකම් ජෝශප් ජයසිරි ප්‍රනාන්දු මහතා ප්‍රගති වාර්තාවද ඉදිරිපත් කළහ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**



දියතලාව මීසම් සේවක ගරු මාලන් ඇන්තනි පියතුමාගේ මඟපෙන්වීමෙන් කොළඹ සා. බ්‍රිජට් කන්‍යාරාමයේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය සිසුවියන් සහ ගුරුවරියන් එක්ව තෝරාගත් අසරණ පවුල් 25 කට වියළි ආහාර බෙදා දෙන ලදි..

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**



නාගොඩ දිව්‍ය හෘදය සමිතියේ අනුපස් වන සංවත්සරික සැමරුම ඉකුත්දා මීසම් සේවක ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ඒ නිමිත්තෙන් තුති පිදීමේ දිව්‍ය යාගය නාගොඩ ශු. ස්නාවක ජුවාම් දෙව් මැදුරේදී පැවැති අතර නවක සාමාජිකාවන් සය දෙනකුට නිල ලාංඡන පැළඳවීම ගරු පියතුමන් විසින් සිදුකරන ලදී. දේව මෙහෙයෙන් අනතුරුව සාමාජික පිරිස ගරු පියතුමන් සමග ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

සටහන - **ඩී. ඩී. මේරි රීටා ;** සේයා - **ජූඩ් පීරිස්**

## ස්වර්ණ අසිපත අද රද්දෙළුවේ

රද්දොලුව සා. සිසිලියා දහම් පාසල් ගොඩනැගිලි අරමුදලට ආධාර පිණිස පන්ජය නිර්මාල් නිර්මාණයක් වන සාන්ත අන්තෝනි මුනි ජීවන පුවත වටා 'ස්වර්ණ අසිපත' ඔක්තෝබර් 26 ඉරිදා රාත්‍රි 7.30 සිට සා. සිසිලියා දෙව්මැඳුරරු බිමේ එළිමහන් රංග පීඨයේදී වේදිකා ගත කෙරේ.

මීසම් සේවක ගරු දෙව්ශාන් අසංක ප්‍රනාන්දු පියතුමාගේ මගපෙන්වීම අනුව රද්දොලුව සා. සිසිලියා තරුණ සමිතිය නාට්‍ය දැක්ම සංවිධානය කරයි.

**රන්ජිත් ලොකුපෝතාගම**



මොරටුව උයන ශුද්ධ වූ ජුසේ මුනිඳුන්ගේ දේවස්ථාන භූමියට පිවිසෙන ස්ථානයේ අලුතින් සාදන ලද ගේට්ටු ආසිරිගන්වා විවෘත කිරීම මොරටු මීසම් සේවක ගරු බර්ට්‍රම් රංජිත්, ගරු ලූෂන් ප්‍රනාන්දු නිමනි පියතුමන් විසින් සිදුකරන ලදී. උයන දිව්‍ය හෘදය සමිතියේ 25 වන සංවත්සරය සිහිකිරීම පිණිස ඉදිකරන ලද මෙයට උයන සභාවේ සැදැහැවතුන්ගේ සහය ලැබිණ.

සටහන - **ඩොරින් පෙරේරා ;** සේයා - **සුවිනිතා ප්‍රනාන්දු**



සාන්ත වින්සන් ද පාවුලු සමිතියේ ආරක්ෂක මුනිවර සාන්ත වින්සන් ද පාවුලු මුනි දින සැමරුම පිටකොටුව සයවන පාවුලු මධ්‍යස්ථානයේ දෙවන මහලේදි ජාතික අධ්‍යක්ෂ ගරු ලියෝ පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. දේව මෙහෙයට රත්නපුර, ගාල්ල, මහනුවර, කුරුණෑගල, කොළඹ, මඩකලපුව, ත්‍රිකුණාමලය, බදුල්ල පදවි නියෝජනය කරමින් නියෝජිතයන් රැසක් සහභාගි වුහ.

**තියබෝල්ඩ් සමරතුංග**

## මරිය වසර නිමිත්තෙන් ප්‍රදර්ශනයක්

පල්ලියවත්ත මීසම් සභාව මරිය වසර නිමිත්තෙන් දහම් පාසල් දරු දැරියන්ගේ දැනුම කුසලතා ආකල්ප උපයෝගි කරගෙන චිත්‍ර හා අත්කම් ප්‍රදර්ශනයක් වැල්ල පල්ලිය කාර්මෙල් දේව මාතා දේවස්ථාන පරිශ්‍රයේදී පැවැත්විය.

මීසම් සේවක ගරු ෆීලික්ස් මල්ලව ආරච්චි (දො.බො.නි) පියතුමාගේ මග පෙන්වීම යටතේ දහම් ගුරු භවතුන්ගේ මෙහෙය වීමෙන් එය පැවැත්වූ අතර පාසල් ළමෝ හා දෙමව්පියෝ එය නැරඹීමට පැමිණ සිටියහ.

**ඒ. ඩී. සුනිල්**

## වැලිවේරියෙන් මැදිරිගිරියට සරණ සේවා

වැලිවේරිය සාන්ත වින්සෙන්තිද පාවුලා සමිතියේ සාමාජික / සාමාජිකාවන් විසින් නොබෝදා හිඟුරක්ගොඩ මීසම් සේවක ගරු එරික් ප්‍රනාන්දු පියතුමන් සමග දැඩි නියගයෙන් පීඩා විඳින මැදිරිගිරිය අඹගස්වැව් ගම්මානයේ පවුල් 65 කට වියලි ආහාර පාර්සල් සහ ජල බඳුන් බෙදා දීමෙහි නිරත විය. මෙම සත් කාර්යය සඳහා වැලිවේරිය ප්‍රදේශයේ ජනතාවගේ නොමඳ සහයෝගය ලැබුණි. ආහාර පාර්සල් බෙදා දීමෙන් පසුව එම පියතුමන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.



සටහන - **ඩබ්. එම්. නිලානි පීරිස් ;** සේයා - **මෙරීනා චන්ද්‍රසේකර**

## අගරදගුරු පදවි පූජක ධර්ම විවේකය -3

කොළඹ අගරදගුරු වසමේ පූජක ධර්ම විවේකය 03 නොවැම්බර් 03 සඳුදා සිට නොවැම්බර් 08 සෙනසුරාදා දක්වා තේවත්ත ධර්ම විවේකාගාරයේදී පැවැත්වේ

දේශක - ගරු බොබ් බ්‍රිසන් පියතුමා

සහභාගි වන පියතුමන්ලා

ගරු ලින්ටන් ජෝශප්, සුනිල් වේරගොඩ, ඇන්ටන් දිනේෂ්, ඇනටන් රංජිත් (කණිටු), දිනේෂ් ප්‍රසාන් අප්පුහාමි, අරුණ ශ්‍රී කමල්, බී. ඇන්සලම් ශිරාන්, මැල්කම් කන්දප්පා, ලක්නාත් කුරේ, ජයන්ත නිමල්, ගීතාලි ඇනස්ලි, ශිරාන් දසා, සුනිල් ද සිල්වා, රොහාන් ද සොයිසා, ඇලෙක්සිස් බෙනඩික්. එච්. ඩී. ඇන්තනි, බෙනඩික් ජෝශප්, ක්‍රිස්පින් ලියෝ, ජූඩ් ලක්ෂ්මන්, ක්ලේරියන් හයින්ස් ප්‍රනාන්දු, සිරිල් ගාමිණී ප්‍රනාන්දු, එල්මෝරාජ් ප්‍රනාන්දු, ජෝෂප් බෙනඩික් ප්‍රනාන්දු, මංජුල නිරෝෂන්, කුයින්ටස් ප්‍රනාන්දු, සමිත් රංගන ප්‍රනාන්දු, ඔගස්ටින් ප්‍රනාන්දු පුල්ලේ, ආනන්ද ප්‍රනාන්දු පුල්ලේ, සුරංග නිරෝෂන් ෆොන්සේකා, සුදත් ගුණතිලක, මහේන්ද්‍ර ගුණතිලක, නලීන් සුරාජ්, ඇන්තනි ජයකොඩි, දර්ශන ජයමාන්න, ජූඩ් සුරේශ් රංගන, රංජිත් මදුරාවල, ටෝනි මාටින්, සම්පත් තුෂාර, හියුගෝ පලිහවඩන, පැතුම් සමිඳු, සිසිල් ජෝයි පෙරේරා, ගිහාන් රිඩ්ලි පෙරේරා, හයිසින්ත් පෙරේරා, ඉඳුනිල් සම්පත් පෙරේරා, ලියෝ පෙරේරා, ප්‍රසන්න රොහාන්, ප්‍රියාන් සුභාශන, රසික ඉවාන්ස්, කසුන් ඉන්ෂාරා, රෙජිනෝල්ඩ් සපරමාදු, රසික ලෝරන්ස් සිල්වා, තුසිත ගයාන් සෝලංග ආරච්චි, කිත්සිරි තිරිමාන්න, ජුලියන් තිසේරා, ඉග්නේෂස් වර්ණකුලසිංහම්, බර්නාඩ් නිශාන් විලත්ග මුවගේ, වින්ස්ටන් ගයාන් පියතුමන්ලා.



මීගමුව මූලික රෝහලේ වෛද්‍යවරියන්ගේ ප්‍රධානත්වයෙන් කටුවපිටිය සාන්ත සෙබස්තියන් දහම් පාසල් ශාලාවේදී නොමිලේ වෛද්‍ය සායනයක් පවත්වන ලදි. මීසමේ දිව්‍ය හෘදය සමිතිය විසින් සංවිධානය කරන ලද එම වෛද්‍ය සායනයේ වෛද්‍ය ජීවනි මහත්මිය හා වෛද්‍ය මානෙල් මහත්මිය රෝගීන් පරීක්ෂා කරන අවස්ථාවයි මේ.

**ඇග්නස් සියඹලාපිටිය**

## දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමි අනුස්මරණය ඔක්තෝබර් 29 දා

දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ස්වර්ගස්ථවීමේ 26 වන අනුස්මරණ දිව්‍ය යාගය තේවත්ත ලංකා අප ස්වාමිදු ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ දී ඔක්තෝබර් 29 වැනිදා පෙ.ව. 9.00 ට කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.



මග්ගොන ප්‍රැන්සිස්කන් මුල් ආරාමයේ ශු. ප්‍රැන්සිස් අසීසි මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල උලෙළ සමගින් එම නිකායේ ගරු එරික් මදුරාවල පියතුමන්ගේ සහ ගරු අනුරාධ වින්සන් සහෝදර තුමන්ගේ රජත ජයන්තියත් ගරු බර්නාඩ් කුරේරා, ගරු ජෙරම් ප්‍රනාන්දු පියතුමන් දෙදෙනාගේ ස්වර්ණ ජයන්තියත් පවත්වන ලදි. මංගල දේව මෙහෙය, ප්‍රැන්සිස්කන් නිකායේ ප්‍රාදේශියාධිපති ගරු එරික් මදුරාවල පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ගරු සහෝදරවරුන් ඇතුළු අවට මීසම් ජනතාවද මෙම මංගල උලෙළට සහභාගි වූහ.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



තලංගම දේවස්ථානයේ ඔක්තෝබර් මාසය පුරා කිතුනු ඒකක මට්ටමින් දේව මාතා ප්‍රතිමා 21 ක් පවුල් වලට වැඩම කිරීම පසුගියදා ආරම්භ විය. තලංගම මීසම් සේවක ගරු සංජීව මෙන්ඩිස් පියතුමන් අතින් ආසිරි ගන්වන ලද දේව මාතා ප්‍රතිමා කිතුනු ඒකක නායකයින් අතර බෙදා දුන් අයුරු.

**ධනුෂ්ක ඇන්ජලෝ**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 ඔක්තෝබර් 26 ඉරිදා

# උභතෝකෝටිකය

මේ දිනවල දේශපාලන තලය එකම හෙයියම්මාරුවකි. ලබන වසරේ මුල් මාසය තුළ කඩිනම් ජනාධිපතිවරණයක් පැවත්වෙන්නට ඉඩ තිබෙන බව කණින් කොනින් ඇසෙන රාවයත්, ඒ පිළිබඳව දනවන ඉඟි පළවීමත් අරබයා අද විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය තුළ විවිධ පුවත් මැවීම ඇරඹී ඇති සෙයකි. මෙවන් මැතිවරණයක නීතිමය පැතිකඩය මෙන්ම එය අතීතයට මෙන්ම අනාගතයට බල පැවති, පවතින ආකාරයේ විවරණයන් පිළිබඳව අර්ථ දක්වන්නෝද මෙකල හිඟ නොවෙති. අළු ගසා දමා හැම තැනකම අලුත් ආරක සූදානමක් නම් පැහැදිලිවම දැකිය හැකියි. මේ සියල්ලම භෞතික සමාජයේ බාහිර හැලහැප්පීම් තුළින් පෘතග්ජනයින් අතරම සිදු වන ක්‍රියාදාමයන්ම වන අතර මැතිවරණ පවත්වා හසල අත්දැකීම් සම්භාරයක් ඇති රටකට මෙයින් කිසිදු අරුමයක්ද නැති ගානය.

නමුත් මෙහිදී එක්තරා පිරිසකට යම් උභතෝකොටිකයක් නම් ඉපිද ඇති හැඩයි. එය කිව යුතුමයි. මේ පිරිස නම් මෙරට ජීවත්වන වන සිංහල - දෙමළ, බර්ගර් යන ජනවර්ග තුනටම අයිති කතෝලික ජනතාවයි. මේ ජන කොටස සුළු ජන කොටසක් නම් නොවේ. මන්ද කතෝලික යනු ජන වර්ගයකට ලබාදී ඇති නමක් නොවන නිසයි. බහුතර සිංහල ජාතිය තුළත්, එමෙන්ම දෙමළ, බර්ගර් ජාතින් අතරත් කතෝලික දහම අදහන්නෝ වෙති. අද මුස්ලිම් ජන වර්ග යා අතරත් සුළුතරයක් කතෝලික දහම අදහන බව විවිධ වාර්තා එළි දක්වා ඇත. එලෙස බැලු කල මේ ධර්මද්වීපයේ වෙසෙන සියලුම ජන කොටස් නියෝජනය කරමින් කතෝලික දහම අදහන ජනතාවක් වෙසෙන අතර හින්දු ආගම අදහන ජනතාව අතරින් සුළුතරයක් බෞතිස්ම නොවී කතෝලික දහමට නැඹුරුවක් ඇතිව ජීවත් වන බවත් ප්‍රකට කරුණකි. ඒ අතර පිළිගත් ක්‍රිස්තියානි සභා අතරත් කතෝලිකත්වයට නැඹුරු වූ ආභාෂයක් ඇති අතර ඒ සැම කරුණකින්ම ගම්‍ය වන, පිළිගත යුතු සාධකයක් ඇත. එය නම් ලෝක වාසි සමස්ත ජනතාව අතරින් කතෝලික දහම අදහන බිලියනයකට වැඩි ජනතාව නියෝජනයට ශ්‍රී ලංකාද්වීපයේ කතෝලික ජනතා සංයුතියද වැදගත් ක්‍රියාදාමයක් ඉටු කරන බවයි. ගණනින් බැලූ කල සියල්ල එකතුව අපේ බහුතර බෞද්ධ ජනතාව හා හින්දු ජනතාව සමග සමාදානයෙන්, අවබෝධයෙන් හා විශ්වාසයෙන් යුතුව ලක්ෂ විසිපහකට අධික කතෝලික ආභාෂය තුළ දිවි සරිකර ගන්නා ජනතාවක් මෙරට වෙසෙන බව සත්‍යයක් සේ පසක් කොට ගත යුතුයි.

එවන් පිරිසක් දැඩි ආධ්‍යාත්මික සන්තෘෂ්ටියකින් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකා රජය හා දේශිය කතෝලික සභාව වසරකට පෙර සිටම වරින් වර දැනුම්වත් කළ අයුරින්ම ලබන වසර මුල් මාසයේ බිලියනයකට අධික සැදැහැවත් ලෝක වාසි කතෝලිකයන්ගේ දෘෂ්‍යමාන නායකයා වන අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ ලංකා ගමන ඒ සැටියෙන්ම ඉටුවන අයුරු දැක ගැනීමටයි. ආගමිකත්වයේ සනහලීමකින් හා පිබිදුනු පහන් සිතකින් ළමා ලපටි තරුණ මහළු මේ සියලු කතෝලික පිරිස් සැනසුම් හසරැල් පා මේ පුදැදුරාණන් මේ සිරිලක් පින් බිමට පිළිගන්නට සූදානම් වෙති. යැදුම් යදිති. ගීතිකා හඬ ශබ්දය නිනාද කරති. ලක් පොළව අමදිති. පැහැපත් කරති. එපමණක් නොවේ. අපේ සහෝදර බෞද්ධ ජනතාව පවා මේ නිරහංකාර ආධ්‍යාත්මික නායකයාගේ බැල්මට මොහොතකට හෝ හසුවන්නට අපේක්ෂා කරති. එය ආධ්‍යාත්මික සිත් හැරවීමකට නොව උත්තුංග මනුෂ්‍යත්වයේම නාමයෙනි.

බෝ මළුවේ සිලි සිලි හඬින් සුපින්වත් මේ රමණීය දිවයිනට, බුදු පහසින් අමන්දානන්දයට පත් ඓතිහාසික බොදු පිළිවෙතේ නිරහංකාර ජීවිත පැවැත්මක් උරුම කර ගත් අසිරිමත් සංස්කෘතියකින් සුපෝෂිත මේ රන් දිවයිනට ප්‍රැන්සිස් සසුනිසුරාණන් හට වඩින්නට ඇරයුම් කළෝ අප ජනපති උතුමාණෝය. අප ආගමික නායකයෝය. අප කාදිනල් හිමිපාණන් ප්‍රමුඛ සියලු රදගුරු තුමන්ලාය, උතුරේ කතෝලිකයෝය, දකුණේ කතෝලිකයෝය, විදෙස් රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයෝය, ශ්‍රී ලාංකික කතෝලිකයෝය, ඔවුන් හා අත්වැල් බැඳ ගත් අන් ලබ්ධිකයෝය.

ඉදින් මේ පිරිසට දැන් උභතෝකෝටිකයක් හටගෙන ඇති බවක් කියවෙන්නේද? සැබවින්ම කියැවෙති. ඒ අන් කිසිවක් නිසා නොව මේ සුදුතුම් පියාණන් සැපත් වන ඒ ජනවාරියේ මුල මැද අග මැතිවරණයක් පැවත්වේද යන අඩහැරය නිසයි. හීංසැරේ ආ හඬක් දැන් තිව්‍ර වෙමින් පවති. කසකාරයින් පෙරටුව යන ගමනේ පෙරහරක් සූදානම් බව ඉඟිවේ. මුද්‍රිත මාධ්‍යයේ පිටු පුරා එකම සිත්තමක විවිධ සායම්ය. විද්‍යුත් මාධ්‍යයේ නිනාද ශබ්දඅතර එකම අලකලංචියකි. ඒ මැතිවරණයක් පැවැත්වේද? සුදුතුම් ගමන ඇණ හිටිද? යන තොරතෝංචියක් නැති ප්‍රශ්න වැලකිනි. ප්‍රදීපයට ලැබෙන ඇමතුම් ඉමහත් සේ ඉහළ යමින් පවති. ලැබෙන ලියුම් මේස පුරා ඉහිර යමින් පවති. අසන්නෝ කතෝලිකයෝ පමණක් නොවෙති. දේශපාලනය නොකරන්නෝ පමණක් නොවෙති.

විටෙක විචිකිච්ඡාවකි. විටෙක උභතෝකෝටිකයකි, නමුත් අරුමයකට පත් විය යුතු නැත. කණින් කොනින් පුවත් මිසක් කිසිදු නිල පුවතක් නිල වශයෙන් කොතැනකවත් සඳහන් නොවේ. ප්‍රකාශ නොවේ. එසේනම් ඇයි මේ විලම්භිත තැති ගැන්වීම්.

ශ්‍රී ලංකා රජයේ ඇරයුම් වචනය එලෙසින් පවතිනු ඇත යන්න විශ්වාස කරමු. සභාවේ වගකීම ඇරයුම මූලික කොට ඉටුකරනු ඇත. සුදුතුම් පිය ලංකා ගමනේ පෙර සූදානම අඩාල නොකර ගමු. පැවසු ලෙස ඒ යුතුකම් ඉටුකරමු. දේශපාලන අඬහැරයේ යම් හඬක් වේද එය භෞතිකව විසිර ගියාවේ. ආධ්‍යත්මික එකමුතුවේ සංතෘෂ්ටිය මිල කිරීම කා හට තරම්ද? එසේනම් යැදුම බලවත් බව සපථ කරමු.

"ආදර පියාණනි, එතුමන්ගේ මෙම එඬේරික බැහැදැකීම තුළ අපට එතුමන් දැකීමට හා එතුමනට සවන් දීමට දුන් මේ මහඟු අවස්ථාව වෙනුවෙන් අපි ඔබවහන්සේට කෘතඥපූර්වකව පුදන තුති පැසසුම් බාරගත මැනව. ඔබවහන්සේ එතුමන් එඬේරික හදවතකින් ආශිර්වාද කිරීම ගැන තුති පුදමු. එතුමන්ගේ මෙම එඬේරික බැහැදැකීම අපගේ රටට වරප්‍රසාදයෙන් පිරි අවස්ථාවක් වේවා."

# පාප් නිලයේ බලතල

පාප් නිලයේ බලතල ගැන සඳහන් කරන සාසන නීති සංග්‍රහයේ 331 වෙනි වග න්තිය, 'පාප්තුමාට සභාව තුළ, එතුමාගේ නිල බලයෙන්ම, උත්තරීතර, සම්පූර්ණ, සෘජු හා විශ්ව නිලබලය හිමිවේ" යනුවෙන් සඳහන් කරයි. අපි මෙම නීති වගන්තිය සරලව විග්‍රහ කිරීමට උත්සාහ කරමු.

උත්තරීතර (Supreme) යනුවෙන් අදහස් කරන්නේ එතුමා සභාව තුළ වෙනත් කිසිම අධිකාරියකට යටත් හෝ උපකාරක නොවන බවයි. පාප්තුමාගේ බලය සම්පූර්ණ (Full) යන්නෙහි අදහස නම්, සභාව තුළ කුමන හෝ ක්ෂෙත්‍රයක ගැටලු හා ප්‍රශ්න නිරාකරණය කිරීමට එතුමාට ඇති බලයයි. එම බලය සෘජු (Immediate) බලය ලෙස හැඳින්වේ. එනම්, එම බලය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිම අතරමැදියෙකුගේ අවශ්‍යතාවයක් නොමැති බවයි. එකී බලය සමස්ත සභාවටම බලපාන නිසා එය විශ්ව (Universal) බලය ලෙස නම්කෙරේ. එසේම එය නිල (Ordinary) බලයකි. එනම් එකී බලය සභාවේ වෙනත් කවුරුන් හෝ විසින් එතුමාණන් පිට පැවරුවක් නොව ක්‍රිස්තුස් වහන්සේගෙන්ම ලැබෙන බලයකි. එමනිසා එය අසාමාන්‍ය නොව සාමාන්‍යය නිල බලයකි.

මේ බලය කුමක් සඳහාද? සාමාන්‍ය මෙලොව පවතින, සමාජීය හෝ දේශපාලනික හෝ බලතල හා සම්බන්ධ කරමින් පාප් නිලය හා එහි බලතල ගැන විග්‍රහ කරන්නට උත්සාහ කළහොත්, කෙනෙකුට එය අත්තනෝමතික බලයක් හෝ නායකත්වයක් ලෙස පෙනී යා හැක. නමුත් එය එසේ නොවේ. පාප් ධූරයේ බලතල නිර්වචනය කළ හැක්කේ කිතුනු නායකත්වය නමැති අඩිතාලම මත පිහිටුවා පමණි. කිතුනු නායකත්වය කුමක්ද යන ප්‍රශ්නයට කදිම පිළිතුරක් ශුද්ධවූ ජුවාම් තුමාගේ සුවිශේෂයේ මෙලෙස සඳහන් වේ. "මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා සිය බැටළුවන් උදෙසා ස්වකීය ජීවිතය පූජා කරයි" (10:11). එමනිසා කිතුනු නායකත්වය රැඳී තිබෙන්නේ ජනතාව වෙනුවෙන් කැපවීමට, වැයවීමට, සේවය කිරීමට, අවසානයේ ජීවිතය වූවත් පූජා කිරීමට එකී නායකත්වය සඳහා කැඳවනු ලැබුවන්ගේ සූදානම හා කැමැත්ත මතය. බැටළු රැලක පැවැත්ම, ආරක්ෂාව, පෝෂණය මේ හැම දෙයක්ම මුළුමනින්ම රැඳී පවතින්නේ එඬේරා මත මෙන්ම, පාප් නිලය ජනතාව මත රැඳෙන අතර, කිතුනු විශ්වාසිකයෝ පාප් නිලය මත රැඳෙති. මෙම එඬේරික දූත සේවාව සඳහා පාප්තුමා පන්නරය ලබාග න්නේ ක්‍රිස්තුස් වහන්සේ මත යැපීමෙන් හා එතුමන් අනුග මනය කිරීමෙනි. "මා ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබද මා ආදර්ශයට ග

**සුදුතුම් පිය ලංකාගමන 2015 නිමිත්තෙනි**

POPE FRANCIS Sri Lanka 2015

**ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා**

න්න"යි තමාගේ නායකත්වය ක්‍රියාත්මක කිරීමේදී ශුද්ධ වූ පාවුළුතුමා ජනතාවට ආරාධනය කර සිටියේ ඒ නිසාය (1 කොරින්ති 11:1). එබැවින් පාප් නිලයේ බලතල යනු පාප්තුමා ක්‍රිස්තුස් වහන්සේ අනුසාර කරමින්, එම අනුගාමිකත්වයෙන් ජනතාව ක්‍රිස්තුස් වහන්සේ කරා යොමුකිරීමේ දූත සේවාවය.

ක්‍රිස්තුන් වහන්සේ තම නායකත්වය ස්ථිර කරමින්, තමන්ගේ සභාව තුළ නායකත්වය ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේදැයි කියා හුදෙක් වචනයෙන් හා දේශනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්ද පෙන්වා දුන්සේක. "ගුරු දේවයිනි, ස්වාමිනි යි කියා ඔබ මා අමතනු අමතන්නහුය. එසේ කීම හරිය, මම එසේම වෙමි. ඔබේ ස්වාමියාණන්ද, ගුරුදේවයාණන්ද වන මම ඔබේ පාද සේදුවේ නම්, ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය"යි පවසමින් උන්වහන්සේ කිතුනු නායකත්වයේ නියම අරුත පෙන්වා දුන් සේක.

තමන් සතු නායකත්වය කුමක් දැයි ප්‍රැන්සිස් පාප් තුමන් හොඳින් අවබෝධ කරගෙන සිටින බව එතුමාණන් විසින් විවිධ අවස්ථාවන්හි කරන ලද ප්‍රකාශන වලින් ඉතා පැහැදිලිව දැකගත හැක. මේ වසරේ පෙබරවාරි මස 23 දින, නවක කාදිනල් තුමන්ලා පත් කිරීමෙන් පසු, එතුමන්ලා සමග පැවැත්වූ හවුල් පූජා මෙහෙයේ දේශනය පවත්වමින්, පාප්තුමන් කාදිනල් තුමන්ලා අමතා කිතුනු නායකත්වය පිළිබඳ ඉතා පැහැදිළි, එමෙන්ම සරල දැක්මක් ඉදිරිපත් කළේය. එහිදී අදහස් දැක්වූ පාප්තුමා කියා සිටියේ, නවක කාදිනල් තුමන්ලාගේ කාර්යභාරය වනුයේ ලෞකික බහුමානය නොව, නිහතමානි සේවය හා පරිත්‍යාගය බවය. එහිදි තව දුරටත් අදහස් දැක්වූ පාප්තුමා කාදිනල් තුමකු ඇතුල් වන්නේ රාජ්‍යය සභාවට නොව රෝම සභාවටය යනුවෙන් සඳහන් කරමින්, සභාව තුළ නායකත්වය යනු පාලනය නොව සේවය බව පැහැදිළිව පෙන්වා දුන්නේය. එසේම කූටෝපාය කුමන්ත්‍රණයන්, කේලාම්කීම්, කල්ලිගැසීම්, පක්ෂභජනය, වැඩි සැලකිල්ල වැනි රාජ්‍ය සභාවක පවතින පුරුදු හා ආකෘතීන්ගෙන් තමනුත් වැලකී, අන් අයවද වලක්වා ගන්නා ලෙස එකී නවක කාදිනල් හිමිපාණන් වහන්සේලාට අවවාද කරමින්, සභාව තුළ ක්‍රියාත්මක විය යුත්තේ ලෞකික නායකත්වය ඉක්මවා යන අධ්‍යාත්මික නායකත්වයක් බව පෙන්වා දුන්හ.

පාප්තුමා සභාව තුළ ස්වකීය නායකත්වය ක්‍රියාත්මක කරන්නේ සභාවේ එකමුතුකමේ හා සාර්වත්‍රිකත්වයේ (Universality) සේවකයකු වීමෙනි. එමනිසා එතුමා සමස්ත සභාවට දයාවේ නායකත්වය දෙමින් සභාව තුළ ඒකත්වය ගොඩ නැගීමටත්, ඒ තුළ ඇති විවිධත්වය, ඒකත්වය කරා යොමුකරවීමේ දූත සේවාවේ යෙදී සිටිති. මන්ද එතුමාගේ නායකත්වය තමන් විසින්ම සොයා ලබගත්තක් හෝ ජනතාව විසින් එතුමාට පවරා දෙනු ලැබුවක් නොව, ක්‍රිස්තුස් වහන්සේම ශු. පේදුරුතුමාටත්, එතුමන්ගෙන් පසු එම නායකත්වයට පත්වූවන්ටත් ලබාදුන් බලයකි. 'මාගේ' බැටළුවන් පෝෂණය කරන්න, 'මාගේ' යතුර ඔබට දෙමි යි වදාරමින් ක්‍රිස්තුන් වහන්සේ පේදුරුතුමා පිට බලය පැවරුවේ ඒ නිසාය. තම ස්වාමියාණන් වන ක්‍රිස්තුන් වහන්සේට පක්ෂපාතිව, එතුමන් විසින් තමන්ට පවරා දුන් බලය, එකී ගුරු දේවයාණන්ගේ ජනතාවේ යහපත වෙනුවෙන් වැය කිරීම පාප්නිලය සතු බලයේ වග කීමයි. එබැවින් ජනතාව ගැන පාප්තුමන් සෘජුවම වගකිව යුත්තේ ක්‍රිස්තුන් වහන්සේටයි. පාප්තුමා අන් හැමටම පෙර කීකරුවිය යුත්තේ හා සවන් දිය යුත්තේ ක්‍රිස්තුස් වහන්සේටයි.

පාප් නිලයේ බලතල ගැන සඳහන් කරන දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ශුද්ධ වූ සභාව නමැති විශ්ව ලේඛනය: "ශුද්ධෝත්තම පියතුමන් වන රෝමයේ රාජගුරු ප්‍රසාදින් වහන්සේගේ ශ්‍රෙෂ්ඨත්වය පිහිටුවීම හා ඒ ශ්‍රෙෂ්ඨත්වයේ නිත්‍යතාව ගැනද, ඒ ශ්‍රෙෂ්ඨත්වයෙන් ලැබෙන බලය හා එයට හේතුව ගැනද, එතුමන්ගේ නොවරදින ගුරු බලය ගැනද, ශුද්ධ වූ සභාව උගන්වන ධර්මය සියලු විශ්වාසකයින් විසින් ස්ථිර ලෙස පිළිගත යුතු බව මේ පූජ්‍යය සංසදය නැවත යෝජනා කරයි" යනුවෙන් සඳහන් කරයි (අංක 18). එබැවින් පාප් නිලය කෙසේවත් ලොව තුළ අනිකුත් ලෞකික බලතල හා තානාන්තර පසුබිමේ තබා තේරුම් ගත නොහැක. එය එයටම ආවේනික වූ බලයක් හා බල අධිකාරියකි. මේ ගැන තව දුරටත් කතා කරන කතෝලික සභා විශ්ව ධර්මෝපදේශය, "සාමාජිකයින් විශාල සංඛ්‍යාවකින් යුත් මෙම සංසය දේව ජනතාවගේ විවිධත්වයේ හා විශ්වීය බවේ ප්‍රකාශනයකි. එකම නායකත්වයක් තුළ එක්වන නිසා ක්‍රිස්තුස් වහන්සේ බැටළු රැළේ එකමුතුවට සාක්ෂියකි."

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# ලක් සසුනට ලවණක් වෙමින් දේව රාජ්‍යය ගොඩනගන්න

## ඇතුගල්පුර රදගුරු හිමිපාණන්ගෙන් ඇරියුමක්!

**ජනතාව අතරින් තෝරාගෙන ජනතාව වෙත යවනු ලැබූ මෙම පැවිදි සොයුරියන් විශ්වාසවන්තව දේව මහිමය සඳහාම තම සේවාව ලබා දුන්නා. ඉදිරියටත් ජනතාව අතරට ගොස් ඔවුන්ගේ හදගැස්ම හඳුනාගෙන දූත සේවාව තුළ ප්‍රඥාවෙන් සමෘද්ධව දේව මහිමය සඳහා දහම් පණිවිඩය බෙදාහරිමින් පැවිදි හවුලටත්, පදවියටත්, ලක් කිතුනු සසුනටත් ලවණක් වන්න. ආලෝකයක් වන්න.**

ශ්‍රී ලංකා සුරදූත නිකායේ ගරු මේරි ඔදිලියා, ගරු මේරි ඇලෝසියුස්, ගරු මේරි මර්සලින්, ගරු මේරි ක්‍රිස්ටෝපර් සහ ගරු මේරි වෙනාසියුස් පැවිදි සොයුරියෝ 'සියල්ල දේව මහිමය සඳහා' යන තේමා පාඨය අනුව යමින් සුරදූත නිකාය තුළින් දේව ජනතාව හට වසර 50 ක් පුරා කරන ලද මහඟු සේවාව වෙනුවෙන් සහ ඔවුනට පියාණන් වහන්සේ දෙන ලද සියලු වරම් වරප්‍රසාදයන් වෙනුවෙන් කුලියාපිටිය සා. ජෝශප් දේවස්ථානයේදී පැවැත්වූ තුති පිදීමේ දෙව් පුද මෙහෙයේදී කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ එසේ පැවසූහ. පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් ප්‍රනාන්දු, පදවි පරිපාලන නාහිමි අතිගරු පියල් ජානක ප්‍රනාන්දු, පදවි භාණ්ඩාගාරික අතිගරු බැසිල් රොහාන් ප්‍රනාන්දු පියතුමන් ඇතුළු ගරු පියවරුන්, ගරු පැවිදි සොයුරියන් නෑ හිතවතුන් විශාල පිරිසක් මෙම අවස්ථාවට එක්වී සිටියහ.

කුලියාපිටිය මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් ලියනගේ, සහයක ගරු ගෝමිදිවාකර, මිල්ලව මීසම් සේවක ගරු තරංග දිලෙක්ෂික පියවරුන්ගේ සහයෝගයෙන් කුලියාපිටිය සුරදූත කන්‍යාරාමයේ සහ සුරදූත නිකායේ ගරු සොයුරියන් විසින් මෙහි සංවිධාන කටයුතු සිදුකරන ලදී.

**රීටා සේනානායක**

## කඩලාන ලේ දන්දීම නොවැ. 02 දා

කඩලාන ශාන්ත අන්තෝනි දේවස්ථානයට අනුබද්ධ සාන්ත දොන් බොස්කෝ සමිතිය සංවිධානය කරන ලේ දන්දීමේ වැඩ සටහනක් නොවැම්බර් 02 ඉරිදා දවස පුරා දේවස්ථාන සමිති ශාලාවේදී පැවැත්වේ.

**සුමිත් මාර්ක් ද සිල්වා**



හලාවත පදවි සාන්ත වින්සන්ද පාවුලා දයාවේ සේවාවට අයත් බණ්ඩාරවත්ත ශුද්ධවූ ජපමාල දේවමාතා කොන්පරසය විසින් බණ්ඩාරවත්ත ප්‍රාථමික විදුහලේ දරු දැරියන් සැමට අභ්‍යාස පොත් බෙදා දෙන ලදි. මෙම අවස්ථාවට බණ්ඩාරවත්ත මීසම් සේවක ගරු රොහාන් ගයිස් පියතුමාද, සාන්ත වින්සන් ද පාවුලා හලාවත පදවි මධ්‍ය මණ්ඩල ලේකම් සී. ජේ. රාජපක්ෂ හා බණ්ඩාරවත්ත සා.වි.පා සමිතියේ නිළධාරීන්ද සහභාගී වූහ.

## දුක වේදනාව මැද සතුට කරා ගමන් කරන්න

දුක, වේදනාව, සතුට, කටුක බව, පරාජය තුළ නොසිතූ සැලැස්මකට අපව ගෙන යන උන්වහන්සේ කැමති ආකාරයකට අඹන්න ඉඩ දිය යුතුයි. කිසිම දෙයක් පහසුවෙන් ලැබෙන්නේ නැත. තුවාලය පවිත්‍ර කරන තරමටයි වේදනාව නැතිවන්නේ. බණ්ඩාරවෙල 'සිදුපිය නිල' දෙව්සත්හලේ අදියුරු ගරු රොෂාන් සිල්වා නි.ම.නි පියතුමා එසේ පැවසුවේ හල්දුම්මුල්ල සා. සෙබස්තියන් මුනිඳුන්ගේ වාර්ෂික මංගල්ල දේව මෙහෙයේදීය.

මංගල්ලයට පෙර දින සන්ධ්‍යා මෙහෙය හපුතලේ 'ඇඩිෂම්' හි ගරු මයිකල් ඒකනායක පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ අතර මංගල දේව මෙහෙයෙන් පසු ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර හල්දුම්මුල්ල නගරයේ සංචාරය කළේය. ජනතාවගේ පිපාසය සංසිඳවා ගැනීමට සිසිල් බීමද කුසගිනි නිවාගැනීමට දිවා ආහාරය ලබාදීමෙන්ද, කුඩා මීසමක් වූවත් පැමිණ සිටි විශාල පිරිසට ආගන්තුක සත්කාර කිරීමට හල්දුම්මුල්ල මීසම් ජනතාව සමත් වූහ. මීසම් සේවක ගරු ටයිටස් ෆොන්සේකා පියතුමාට ජනතා සහාය නොමඳව ලැබුනි.

**ශ්‍රී කාන්ති ගුණවර්ධන**

## මනුෂ්‍යත්වය තුළින් දේවත්වය සොයා යමු

ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට බිහිකිරීම සඳහා දෙවියන් වහන්සේ විසින් නිහතමානි, ධාර්මික, මනුෂ්‍ය ගතිගුණවලින් පිරිපුන් මනුෂ්‍ය දියණිය වූ මරිය තුමිය තෝරා ගත්තා. ඒ මහානුභාව සම්පන්න කිතු උපත මගින් මරිය තුමිය මුළු කිතුනු සංහතියේම ගෞරවයට, වන්දනීයත්වයට දේවත්වයට පත්වූවා. මනුෂ්‍යත්වය, අන්තයටම පිවසි, විනාශ වී යන මේ සමාජයේ ප්‍රසාද ස්නාපනය ලැබූ අපටත් එතුමිය මෙන් මනුෂ්‍යත්වය මගින් තමකම නසා ගෙන, හිස්වී, පිපාස වී, දේවත්වයට, ශුද්ධත්වයට, පත්විය හැකි යැයිද ඒ සඳහා පිපාස හෘද සාක්ෂියක් ඇතිකර ගැනීම සඳහා දැන් කාලය එළඹ ඇතැයි මහවැව මට්ටාකොටුව ශුද්ධ වූ සින්ද්‍රාති මාතා දේවස්ථානයේ වාර්ෂික මහා මංගලයට සහභාගි වූ මීසමේ කුළුදුල් පූජක පුත්‍ර වෙන්නප්පුව දිසානායක අතිගරු පයස් කෙනඩි පියතුමා පැවසීය.

මට්ටාකොටුව මීසම් සේවක, කුඩා කිතුනු සංඝ පදවි අධ්‍යජ්ෂ ගරු නෙවිල් සෙබස්තියන් පියතුමා ප්‍රමුඛ මට්ටාකොටුව කිතුනු සංගය මංගල්‍ය කටයුතු ඉතා බැතිබරව සංවිධානය කර තිබිණ. 150 වෙනි ජුබිලි මංගල්‍යය 2015 වර්ෂයේ පවත්වනු ලබන බවද මෙදින මීසම් සේවක විසින් ප්‍රකාශයට පත්කරන ලදි.

**ඇන්ටනි ස්ටැන්ලි කීර්තිසිරි පෙරේරා**

## නයිනමඩමේ තුන්දින තරුණ වැඩසටහනක්!

නයිනමඩම ශාන්ත අන්තෝනි දේවස්ථානයේ තුන්දින 'චොයිස්' තාරුණ්‍ය වැඩසටහන දිව්‍ය යාගයෙන් පසු සාර්ථකව නිමා කැරිණ.

මෙහිදී කතා කළ හලාවත පදවි ජනවන්දනා අධ්‍යක්ෂ ගරු ජූඩ් නික්ලස් පියතුමා තම ජීවිතයේ සුළු කොටසක් හෝ දෙවියන් වහන්සේට නොදුන්නොත් ඔබ හොරෙක් මංකොල්ලකාරයෙක් වන බවත් තරුණ ජීවිතය හරියට අබලන් පාලමක් මතින් යන ගමනක් බවත්, පෙන්වා දුනි.

මේ තුන්දින වැඩසටහන නයිනමඩම මීසම් සේවක ගරු ලයිලි ප්‍රනාන්දු සහ සහායක ගරු ජනිත් කෞශල්‍ය පියතුමන් විසින් සංවිධානය කරන ලදි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**



සුවිශේෂක මතෙව් අපෝස්තුළු තුමාට කැපකළ ඒකල දෙව්මැඳුරේ මංගල්‍යයට කොඩිගස් සිටුවීම. දෙව්මැඳුර අභියස මඩම හංදිය සහ පාසල් හංදියේදි වාර්ෂිකව සිදුකෙරේ. පාසල් හංදියට වැඩමකළ ඒකල ශ්‍රී වාලුකාරාමයේ රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ගල්කිරියාගම විමලානන්ද හිමි සැදැහැවතුන් අමතන අයුරු. ඒකල ධර්මවිජයාරාමයේ පියරතන හිමි සහ මීසම් සහයක ගරු ජූඩ් සුරේෂ් පියතුමාද සිටී.

සටහන - ක්‍රිස්ටි පෙරේරා; සේයා - ඒකල ප්‍රභාත් අරවින්ද

## කුලියාපිටියේදී මරිමවුන් සමග පැයක්

ඔක්තෝබර් මාසය පුරා දේවමාතාවන්ගේ ප්‍රිතමාව ගෙයින් ගෙට වැඩම කරවමින් යාච්ඤාශීලිව පැයක් ගත කිරීමේ වැඩපිළිවෙලක් කුලියාපිටිය දේවස්ථාන සංඝය තුළ කුඩා කිතුනු සංඝ හරහා ක්‍රියාත්මක කෙරේ.

මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් ලියනගේ, සහයක ගරු ගෝමි දිවාකර පියවරුන්ගේ මගපෙන්වීම තුළ සිදුවිය.

**රීටා සේනානායක**

## මීගමුව මහ රෝහලේ මංගල උලෙළක්



මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ ආරෝග්‍ය මාතා දේව මව්න්ගේ මංගල්‍යය කොළඹ විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් උත්සවශ්‍රීයෙන් පවත්වන ලදි. රෝහලේ සියලු කතෝලික හා බෞද්ධ කාර්ය මණ්ඩලවල සහයෝගයෙන් මෙම මංගල මහෝත්සවය පැවැත්වුණු අතර ඒ සඳහා ප්‍රදේශවාසී සැදැහැවත් ජනතාවද සහභාගි වූහ.

රෝහල් උපාධ්‍ය ගරු නිකලස් පියතුමන්ගේ මඟපෙන්වීම මත රෝහල් කතෝලික සංගමය මගින් මෙම මංගල කටයුතු සංවිධානය කරන ලදී. සියලුම වාට්ටු ආවරණය කරමින් සන්ධ්‍යා මෙහෙය දින සවස ආරෝග්‍ය මාතා දෙව්මව්ගේ ප්‍රතිමාවෙන් සියලුම රෝගීන් ආසිරි ගන්වන ලද අතර රෝහලේ වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩල වල සෑම දෙනෙක්ම මෙම අවස්ථාවට සහභාගි වූහ.

**රොබට් ප්‍රනාන්දු**

## කරිකට්ටිය ගුවාඩලූපේ අප ස්වාමිදු දෙව්මැඳුර

පුදබිමක අසිරිය



පුත්තලම කරිකට්ටිය ගුවාඩලූපේ අප ස්වාමිදු දෙව්මැඳුරු ඉතිහාසය ආශ්චර්යවත්ය. එවකට කරිකට්ටිය ග්‍රාමයේ කිතුනු පවුල් ඉතා සීමිත ප්‍රමාණයක් සිටි නිසාත්, ඉතා දුෂ්කර ගම්මානයක් වූ නිසාත් අවට දේවස්ථානයන්හි දිව්‍ය පූජාව සඳහා කි.මි. 3, 4 දුර පයින් යෑමට ජනතාව පුරුදු වී සිටියහ. ජනතාව වැඩිවන්නට වූ බැවින් ග්‍රාමයේ ප්‍රජාශාලාවේ දිව්‍ය පූජාව පැවැත්වීමට කටයුතු කළ අතර මිශ්‍ර ආගම් සහිත ග්‍රාමයේ එම කටයුත්ත දිගින් දිගට සිදු කිරීම අසීරු විය.

පසුව කිතු බැතිමතකු වූ ජෙරමියස් මහතා තම ඉඩමක් දේවස්ථානය සඳහා පරිත්‍යාග කළ අතර පොල් අතුවලින් සෙවිලිකර දේවස්ථානයක් තැනූ අතර එහි දිව්‍ය පූජාව ඔප්පු කෙරිණි. මිනිසුන් නොගැවසෙන ප්‍රදේශයක එම ඉඩම පිහිටි බැවින් දේවස්ථානයේ භාණ්ඩ සඳහා ආරක්ෂාවක් නොවූ අතර නිතර සොරකම් සිදුවිය. පසුව වර්තමානයේ දේවස්ථානය පිහිටි ඉඩම ග්‍රාමයේ කිතුනු බැතිමතකු වු මිල්ටන් ප්‍රනාන්දු මහතා විසින් පරිත්‍යාග කරන ලදි.

1987 ජුලි මස 06 දින මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස් පියතුමා මුල්ගල තබා දෙවස්ථානයේ වැඩ කටයුතු ආරම්භ කළේය.

වත්මන් මීසම් සේවක ගරු වින්සන් ජෙයරාසා පියතුමාගේ මඟ පෙන්වීම තුළ ගරු ප්‍රෙනිල්ක හා නිමන්ත යන පියතුමන්ගේ උනන්දුව මත 2012 සැප්තැම්බර් 12 දින ප්‍රාතිහාර්ය ගුවාඩලූපෙ අප ස්වාමිදු කන්ද සෑදීම ආරම්භ කිරීමත් සමග දේවස්ථානය කරා එන බැතිමතුන් ක්‍රමයෙන් වැඩි විය. ප්‍රාතිහාර්ය කන්ද ආසිරි ගැන්වීමත් සමග ග්‍රාමයේ ජනතාව දිනපතා ජපමාලය උච්චාරණය කිරීමට යොමු විය. පසුව සිකුරාදා දිනවල දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව ඇරැඹිය.

ගුවාඩලූපේ අප ස්වාමිදුගේ ප්‍රාතිහාර්යමය කන්ද අසල ජපමාලය උච්චාරණය කිරීමත් සමගම දේවස්ථාන භූමිය තුළ යාච්ඤාවට මුල් තැනක් හිමිවිය. ගුවාඩලූපේ අප ස්වාමිදුගේ මැදිහත්කම සොයා පැමිණෙන සියලු දෙනා එතුමියගේ මැදිහත්කම තුළ පුදුමාකාර ලෙස ප්‍රාතිහාර්යයන් අත්දකින බව වාර්තාවේ.

කල්පිටිය සහායක ගරු මංජු බර්නාඩ් පියතුමාගේ ඉදිරිපත් වීම මත මෙක්සිකෝවේ ගුවාඩලූපේ අප ස්වාමි දු දර්ශනය වූ දේවස්ථානයේ සිට ප්‍රතිමාවක් වැඩම කරන ලදි.

මීසම් සේවක ගරු වින්සන් ජෙයරාසා සහයක ගරු ප්‍රභාත් සංජය හා විරාජ් එරංග යන පියතුමන්ගේ මඟ පෙන්වීම මත නව දේවස්ථාන ගොඩනැගිල්ල සඳහා මුල්ගල තබා වැඩකටයුතු ආරම්භ කර ඇත. වාර්ෂිකව දෙසැම්බර් 12 දින උත්කර්ෂවත් අයුරින් මංගල්‍යය පැවැත්වේ.

**මෙල්කා රංජනි**



බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල මහතාගේ අනුග්‍රහයෙන් ප්ලාස්ටික් පුටු තොගයක් බලගල මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් පියතුමා වෙත භාරදුන් අවස්ථාව. මීසම් සභාවේ ලේකම් බෙන්ජමින් අල්ගම සහ භාණ්ඩාගාරික මෙරිල් වික්‍රමසිංහ යන මහත්වරුද ඡායාරූපයේ වෙති.

**නිමල් පෙරේරා**



# ශුභ මරණයක සිහිනය සැබෑවක් කර ගනිමු

අපි සියල්ලෝම විවිධ අපේක්ෂාවන්ගෙන් යුතුව ජීවත් වෙමු. මේ ජීවිත අපේක්ෂාවන් අප සිතන පතන ආකාරයටම ඉෂ්ට සිද්ධ වන්නට අපි ආසා වෙමු. ඒ වෙනුවෙන් අපි සුභ සිහින දකිමු. සුභ ප්‍රාර්ථනාවන් පතමු.

මියගිය ආත්මයන් සමරන මේ සමයේදී අපගේ මරණය ගැන ද සිතන අපි ශුභ මරණයක් ප්‍රාර්ථනා කරමු. සුභ මරණයක් අරබයා එකිනෙකා තුළ පවතින නිර්වචනය එක හා සමාන නොවේ. තමාගේ සමාජ තත්ත්වය හා පෞරුෂය හීන නොවී පවත්නා මොහොතක මිය යාම කෙනෙකුට ශුභ මරණයයි. ඇතැමෙක් ප්‍රාර්ථනා කරන්නේ තවත් අයෙකුගේ සහායකින් තොරව තමන්ගේ කාර්යයන් තමන් විසින්ම කරගත හැකි තත්ත්වයක දී මිය යන්නටය. තවකෙකු සුභ මරණයක් යයි සිතා සිටිනුයේ ශාරීරික වේදනාවක්, දුකක්, අසනීපයක් නැති අවස්ථාවක මිය යාමය. බොහෝ දෙනකුගේ ප්‍රාර්ථනාව වනුයේ දීර්ඝායුෂ විඳ දරු මුණුබුරන් දැක ඔවුන් ඉදිරියේ නිශ්චලව දෑස් පියා ගැනීමය.

තමන් පතන මේ කොයි ආකාරයකට මිය ගිය ද තම ආත්මය සදාකාල ජීවිතය අයත් කරගන්නට සුදුසු නොවන්නේ නම් කිනම් සුගතියක් ද? එහෙයින් ඉතාම පැහැදිලිව කියතහොත් සුභ මරණයක් යනු දේව මිත්‍රත්වය හා මෝක්ෂ සුගතිය අයත් කරගන්නට සුදුසු අවස්ථාවක මිය යාමය. දුකකින් තොරව මිය යාම සුභ මරණයක් නම් ප්‍රාණ පරිත්‍යාගිවරයන්ගේ මරණය සුබදායක විය නොහැකිය. ජේසු සමිඳුන්ගේ කටුක වූ කුරුසියේ මරණය ද සුභ මරණයක් විය නොහැකිය. එබැවින් බොළඳ වූ ලෝක මිම්මට අනුව යමින් අපගේ ජීවිතය හෝ මරණ මොහොත හෝ තක්සේරු කරන්නට යාම අනුවණ කමක් බව ඉඳුරා පසක්කොට ගත යුතුය. එබැවින් ශුභ මරණයක් ලැබීමට සුදුසුම අවස්ථාව වශයෙන් හඳුනාගත යුත්තේ සහ ප්‍රාර්ථනා කළ යුත්තේ දේව සහ සම්බන්ධතාවෙන් බැඳුනු දේව ප්‍රසාද නිධානයන්ගෙන් ශක්තිමත් වූ හා අන්ධකාරයේ බලවේගය ඉඳුරාම ප්‍රතික්ෂේප කළ හැකි එළඹගත් සිහියෙන් යුතු අවස්ථාවක් පමණි. මරණය පැමිණෙනුයේ සොරෙකු මෙනි. දෙවියන් වහන්සේගේ සැලැසුම තුළ අපගේ මරණය කිනම් මොහොතක, කිනම් ආකාරයට සිදුවේදැයි අපට නිගමනය කළ නොහැකිය.

එබැවින් මරණයට නියමිත වයසක් නොමැති බව ද මතක තබා ගත යුතුය. ඕනෑම මොහොතක් මරණ මොහොත විය හැකි බව සිතා ශීලධර්මයෙන් යුතුව ජීවත් වීම වඩාත්ම වැදගත් කරුණක් වන්නේ ය. එබැවින් මහළු වියේදී තපස් රැකීමේ බොළඳ අදහස කිතුනු උගැන්වීමට පටහැනි බව තරයේ සිහිතබා ගත යුතුය. “එළඹගත් සිහිය” යන්න සඳහා වන ක්‍රිස්තියානි නිර්වචනය සුවිශේෂී අර්ථයක් ගනී. එයට නිශ්චිත මොහොතක් නැත. එකී පැය වේලාව දන්නේ දෙවි පියාණන් පමණි. කොයි මොහොතක හෝ පැමිණෙන මනාලයකු මෙන් මරණය සිදුවිය හැකිය. ක්ෂණික හෘදයාබාධයක් හෝ හදිසි අනතුරක වේශයෙන් පැමිණෙන වේලාවක දී සිත සිතා සිටින්නට හෝ වේලාවක් නොමැති විය හැකිය. මෙවැනි මරණ වලදී “සුබ මරණයක්” යනුවෙන් ඒවා හඳුන්වන්නට ඇතැමුන් පෙළඹේ. එහෙත් එම අවස්ථාව වන විට ඔහු මරණීය පාපයෙන් යුතු වූ දෙවිඳුන් ප්‍රතික්ෂේප කරන තත්ත්වයක පසුවනුයේ නම් එහි ඇති යහපත කුමක් ද? එබැවින් මරණය ගැන ද ඉන් අනතුරුව පැමිණෙන විනිශ්චය හා සදාකාලික ජීවිතය ගැන ද දෙවිපියාණන්ගේ අනන්ත වූ කරුණාව ගැන ද නිතොරව කල්පනා කළ යුතුය. සෑම මොහොතකම දේව දරු බව තුළ ජීවත් වීමට සූදානම්ව සිටිය යුතුය. මෙවන් ජීවිතයකට පැමිණෙන මරණය ගැන බිය වීමට හේතුවක් නැත. එළඹගත් සිහිය යනු එයයි. වෙනත් වචනයෙන් කිවහොත් නිරන්තරයෙන් අවදිව සිටිමින් ජීවත් වීමයි. මෙහි අවදිව සිටීම යනු නිරන්තර සූදානම ය.

ශුභ මරණයක් ගැන කියැවෙන විට නිතැතින්ම අපගේ සිහියට නැගෙනුයේ ඒ සඳහා ශුද්ධවූ ජුසේ තුමන්ට කියැවෙන යාච්ඤාවයි. “ඔබගේ සුරක්ෂණ පුත්‍රයා හා ප්‍රිය කාන්තාව වන කන්‍ය මරියතුමිය ළඟ හිඳ අත්වල වඩා වලඳවා ශ්‍රී හස්තයෙන් නෙත් පියවා දයාධික ක්‍රියා වලින් ඔබ සැනසුවා වේද“ කියා එහිදී අපි මෙනෙහි කරමු. කිතුනු දිවියේ පරමාදර්ශය ශුද්ධවූ පවුලයි. දේව විශ්වාසය, දේව ගරු බිය හා යහපත් සමාජ ජීවිතය එහි ගැඹුරු හා ප්‍රබල අඩිතාලමයි. අපගේ ජීවිත ද මෙකී පරමාදර්ශය මත ගොඩනඟා ගන්නේ නම් ජීවිතයෙහිදී ද මරණයෙහිදී ද ශක්තිමත් එඩිතර බවක් අප තුළ ද හටගන්නවා ඇත. මේ එඩිතර බව අවශ්‍ය වන්නේ කුමකට ද? ඒ අන්කිසිවක් සඳහා නොව අන්ධකාරයේ බලවේගයට මුහුණ දෙනු සඳහා ය.

අපගේ ආත්මය පැහැර ගැනීමේ දුෂ්ට චේතනාවෙන් මැඩනා ලදුව දුව පැන ඇවිදින අඳුරේ බලවේගය අපගේ අන්තිම මොහොත දක්වාම ඒ සඳහාම උපරිම වෙහෙසක් දරන්නේ ය. බිය ගැන්වීම, අවිශ්වාසය ඇති කිරීම, කලකිරීමට පත් කිරීම හා ප්‍රාර්ථනා නැති බවට පත් කිරීම ආදි උපක්‍රම හේ ක්‍රියාවට නංවයි.

ශුද්ධවූ පවුලේ සියලු චරිතාදර්ශයන් හා වරප්‍රසාදයන් අපව යොමු කරවන්නේ මෙකී යක්ෂ පරික්ෂාවන් ජයගැනීමේ ක්‍රියාන්විතය දෙසටය. අප මෙලොව හැර යන්නේ කොයි මොහොතේ ද කිනම් ආකාරයට ද යන්න සාතන් හට ප්‍රශ්නයක් නොවේ. ඔහු ඕනෑම මොහොතක සූදානමින් සිටී. ඔහුව ජයගන්නට නම් අප ද ඔහුට එදිරිව සූදානමින් සිටිය යුතුය. එබැවින් “මාගේ මරණ වේලේදීත් මා ළඟට කැඳවා යක්ෂ පරික්ෂා දුරුකොට මා සනසනවා සොඳේ.” යනුවෙන් යාච්ඤා කිරීම අතිශයින්ම සුදුසු වන්නේ ය.

තවද මලා වූ ආත්මයන් සිහිකොට දානා දි පුණ්‍ය ක්‍රියාවල යෙදීම ද පෙරදිග අපගේ පුරුද්දකි. එහෙත් මළවුන්ගේ නමින් දානය දී එයින් ලබා ගන්නා පින් මිය ගිය අයගේ ගිනුමට බැර කිරීමේ ක්‍රමවේදයක් ගැන අපගේ ධර්මයෙහි සඳහන් වන්නේ කොතැනකදැයි අපි නොදනිමු. එනමුදු මේ ක්‍රියාවන්ගේ යහපත් පැත්ත අප උකහාගත යුතුය. එනම් අපගේ ද මරණය ගැන සිතීම, මියගිය අය පිළිබඳව කෘත ගුණ පූර්වකව සිහිකිරීම, දානය දීම ආදිය මගින් අපගේ මසුරුබව දුරු කර ගැනීම, සහෝදර දයාව වර්ධනය කර ගැනීම, කරුණා ගුණය අයත් කර ගැනීම ආදි ගුණාත්මක කරුණුය. ඒ හැර මලවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා දිව්‍ය පූජා සිද්ධ කිරීම ආදි ධර්ම ක්‍රියාවන් ගැන ද සිතා බැලිය යුතුය.

මෙය නම් අගය කළ යුතුය මන්දයත් “සාන්තුවරයන්ගේ සමෝක්ෂ ධර්ම ලාභය ” නම් වූ විශ්වාසයේ ප්‍රතිපදාවට මේ මගින් ආයකත්වය සැලසෙන හෙයිනි. මියගිය ආත්මයන් ස්වර්ගලාභය ලැබුවා වුවද, ශුද්ධිකාග්නිස්ථානයේ සිටිනවා වුවද ඔවුන් හා අප හා දෙවිපියාණන් අතර සහ සම්බන්ධතාව ජීවමානව පවතී. කිතුනු ජීවිතය මරණයෙන් කෙළවර නොවන්නේ යයි කියනුයේ එබැවිනි. එකී ජීවමාන සම්බන්ධතාවය අර්ථවත් කරන ප්‍රබල බලවේගය දිව්‍ය පූජාවයි. එබැවින් යාච්ඤාවේ හා දිව්‍ය පූජාවේ ධර්මක්‍රියා තුළ වඩ වඩා නියැලීම අපගේ ම මෙලොව පරලොව යහපත සඳහා හේතුවන බව අනවර්තයෙන්ම සැලකිය යුතුය.

☛ 15 පිටුවට

✍ **හිල්ටන් රුද්‍රිගු**
හපුගොඩ

# මරණය අභියස ජීවිතය පිළිබඳ දෙවරක් සිතන්නට...

**මළවුන් සැමරීම සඳහා ශු. සභාව නොවැම්බර් මාසයම වෙන් කර තිබීමෙන් මළවුන්ට පිං පමුණුවන අතරම ජීවතුන් අතර සිටින සැමට ද තමන් මළවුන් අතරට යන බව සිහිකර ගැනීමට ද අවස්ථාවක් උදා කර දී ඇත.**

කොයි කවුරුත් මළවුන්ට ගරු බුහුමන් දැක්වීමට විශේෂ උනන්දුවක් ඇති නිසාදෝ ජනතාව ගෙන්වා ගැනීමේ උපක්‍රමයක් ලෙස ගමේ පල්ලියේ මංගල්‍යයට කොඩිගස ඔසවන දිනදී ද මළවුන් සිහිකර දිව්‍ය පූජාවක් පැවැත්වීම නිසා එදිනද අලුතින් එක් වූ මළවුන් සිහිකිරීමේ දිනයක් බවට පත් වී ඇත. එය ද ගරුකටයුතුය. මන්ද? මළාවූ අය ද ගමේ දේවස්ථානයේ උන්නතියට ඇපකැප වී ආගමික කටයුතු වලට සහභාගි වී ඇති බැවිනි.

මළා වූ ආත්මයන් දේව විනිශ්චය අනුව නිරයට ශුද්ධිකාගිනිස්ථානයට හෝ ස්වර්ගයට යෑමට නියමිත බව අපේ විශ්වාසයයි. ශුද්ධිකාගිනිස්ථානයේ සිටින අය සිය පව් වලට අච්චු විඳීමෙන් හා ජීවතුන්ගේ යාච්ඤාවල පිං බලෙන් ස්වර්ගයට යෑමේ අවස්ථාව උදා කරගනිති. ඔවුන් ස්වර්ගයට ගිය විට අපට ද පිහිට වනු ඇත. ඒ නිසා මළවුන් සැමරීම. සෑම දිව්‍ය පූජාවකදී ද, දිනපතා යාච්ඤාවලදී ද, අනිවාර්යයෙන්ම සිදුවේ. බොහෝ දෙනා මාසිකව, ත්‍රෛමාසිකව, වාර්ෂිකව, දානමාන දෙති. තව සමහරු ළමා නිවාස, වැඩිහිටි නිවාස වලට වියළි ආහාර ඇතුලු අත්‍යවශ්‍ය භාණ්ඩ සහ මුදල් ද පරිත්‍යාග කර මළවුන් සිහිකර පිං දෙති. ඒ දානය ලබන්නා වූ අය ලවා ද තමන්ගේ මලා වූ ඥාතින් සිහිකර පිං දෙවති. යාච්ඤා කරවති. තව සමහරු ඡායාරූප සහිත පුවත්පත් දැන්වීම් පළකර පාඨකයන් ලවා පිං දෙවති. යාච්ඤා කරවති. තව සමහරු ජීවතුන් අතර සිටියදී මළගිය අයට සලකාගත නොහැකි වූ නිසා ඔවුන් සිහිකර පිං දෙති. තව සමහරු මළගිය අය ජීවතුන් අතර සිටියදී නොසැලකූ නිසා හා හිරිහැර කළ නිසා බිය වී සමාව යදින්නා සේ පිං දෙති. යාච්ඤා කරති. ඔවුන්ට සමාව පිං හා පිහිට ලැබෙනු ඇත.

දූවිල්ලෙන් මැවූ මිනිසා නැවත දූවිල්ලටම හැරෙන්නේ ය යන කියමනට ද අනුව අප කොයි මොහොතේ කොයි ලෙසකින් හෝ “මැරෙනවා. අපි මැරෙනවා” යන සිතුවිල්ලෙන් ජීවිතය ගත කිරීම අගනා බව ලෝකෝත්තර සැපතක් පතන අය සිතා ගත යුතුය. අප මැරුණ විට නරකාදියට යයි ද ශුද්ධිකාගිනිස්ථානයට යයි ද ස්වර්ගයට යයි ද අපට සිතා ගත නොහැක. ශුද්ධිකාගිනිස්ථානයට ගියහොත් අපට යාච්ඤා කරන්න පිං දෙන්න අය සිටිත් ද යන්න අපි අපෙන්ම විමසා කටයුතු කළ යුතු වෙමු. කළ කළ දේ පළ පළ දේ යන සිද්ධාන්තය ජීවතුන්ට මෙන්ම මළවුන්ට ද සාධාරණ බව පෙනේ. යහපත් පරාර්ථකාමී ධර්මිෂ්ට ජීවිතයක් ගත කර අභූත චෝදනා මත කුරුසියේ වද විඳ උකුත් වූ ජේසු ස්වාමිදරුවන් ප්‍රාණ ශරීර පිටින් ස්වර්ගාරෝහණය වූ බව අපි අදහමු. මිය යන පාපි අය සදාකාලයට නිරයට හෙලනු ලබති. එහෙත් ජීවතුන් අතර සිටින අය සටන් වදින සභාව යනුවෙන්ද, ස්වර්ගයට ගිය අය ජයග්‍රාහි සභාව යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

ජයග්‍රාහි සභාවේ මැදිහත්කමින් හා සටන් වදින සභාවේ යාච්ඤා මඟින් ඉක්මනින් දුක් විඳින සභාවේ අය ජයග්‍රාහි සභාවට යැවිය හැකිය. මැදිහත් යාච්ඤාව පල දරණ බව කානා නුවර මඟුල් ගෙදර අය දේව මෑණියන්ගේ මැදහත්කමින් වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්ය ඉටු කරගැනීමෙන් එනම් ජේසු සමිඳුන්ගේ පළමු ප්‍රාතිහාර්යය ඉටුවීමෙන් ඔප්පු වී ඇත.

✍ **ස්ටැන්ලි ජයමාන්න**
කැපුන්ගොඩ

# ජන වන්දනාව

POPE FRANCIS Sri Lanka 2015

## ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා ගමන හා. ජුසේවාස් මුනි සුදුවරයට එසැවීම

### විශ්වාසිකයන්ගේ යැදුම් 2014 ඔක්තෝබර් 26 ඉරුදින දේව මෙහෙයට





- අප බොහෝ දෙනෙක් උදාසීනව අන් අය නොසලකා ජීවත්වීමේ ආකල්පය නිසා විවිධ ප්‍රශ්න වලට මැදිවූ මිනිස් ජීවිත වලට හානි සිදුවන බව අවබෝධ කරගෙන, එම අසරණවූ, අත්හරිනු ලැබූ ජනතාව තුළින් ජේසුස් ස්වාමින් වහන්සේ හඳුනා ගනිමින්, ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා සහෝදරත්වයෙන් හා පරිත්‍යාගයෙන් ක්‍රියා කිරීමට අපට හැකියාව ලැබෙන පිණිස,
- කිතු දහම හුදෙක් යහපත් හැසිරීම හා සාමය පිළිබඳ දර්ශනයක් නොව, එය කුරුසිය මත ජීවිත පූජාවෙන් අප ගලවා ගත් ජේසු සමිඳුන් සමඟ ඇති ජ්වලිත සබැඳියාවක් බව වටහා ගන්නටද, ඒ තුළින් ජේසුස් ස්වාමින් වහන්සේ අනුව යමින් ප්‍රායෝගික ජීවිතය තුළ ප්‍රේමයේ හා පරිත්‍යාග යේ පැවැත්මකට සාක්ෂි දැරීමටද හැකිවන පිණිස,
- ''ඔබේ වස්තුව ඇත්තේ කොහේද? ඔබේ හදවතත් එතැනය'' යන කියමන ඔස්සේ අපගේ සිත් තුළට එබී බලා බලය, ධනය, රූපය ආදිය පිළිබඳ තන්හාව නැති කර ගන්නටද ගැඹුරු මෙනෙහි කිරීමක් තුළින් අපගේ හෘදය අභ්‍යාන්තරයෙහි දෙවියන් වහන්සේ පිළිබඳ සැබෑ පිපාසය හඳුනාගන්නටද ඔබගේ වරම් ලැබෙන පිණිස,
- භාග්‍යවත් ජුසේවාස් පියතුමා දෙවි සමිඳුන් කෙරෙහිවූ තම අචල විශ්වාසය හා චාම් ජීවිතය තුළින් එවකට පැවති දේශපාලන, සමාජයීය හා ආර්ථික බලවේග කෙරෙහි බලපෑමක් ඇති කළාසේ, අපටද ජ්වලිත විශ්වාසයකින් සහ සරල දිවි පැවැත්මක් තුළින් සමාජය තුළ පිබිදීමක් ඇති කිරීම සඳහා දායක වීමට හැකිවන පිණිස,

# ජීවිත වෙනසකින් දේව රාජ්‍යයේ වටිනාකම් පතල කරමු

**පසුගිය සතියෙන්**

අද බොහෝ විට අපට හමුවන්නේ;

- අහංකාරය, උඩඟුව, මෝහය තුළ ජීවත්වන අයය.
- හරි දෙයට වැරදියැයි පවසන, වැරදි දෙයට හරි යැයි පවසන අයය.
- කාමය, රාගය, සමලිංගිකත්වය, අනියම් සබඳතා පවත්වන අයය.
- දරු උපතට වඩා කුස තුළ දරුවන් මරා දමන අයය.
- සාමය වෙනුවට භේදය, සැකය, පාවාදීම, හෙළා දැකීම, චරිත ඝාතනය කරන අයය.
- තම ජීවිතය තමන්ට මෙන්ම සමාජයට ද පිළිලයක් කරගත් අයය.
- ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කුරුසිය දරා ගැනීමට නොහැකිව කුරුසියේ බර සැහැල්ලු කර ගැනීමට වෙනත් දෙවිවරු පසුපස ලුහුබඳින අයය...

කරුණු මෙසේ නම් දේව රාජ්‍යයක් ගැන හෝ එහි වටිනාකම් ගැන තේරුම් ගැනීමට අපට කිසිම දිනක හැකියාවක් නොලැබෙනු ඇත. එහෙත් දේව රාජ්‍යයේ වටිනාකම් තේරුම්ගෙන ජීවිත වෙනසක් ඇති කර ගැනීමට ක්‍රිස්තුස් වහන්සේ පැවසූ කන්ද උඩ දේශනාව, මංගල වාක්‍ය තුළ පෝෂණය විය යුතුමය.

දේව රාජ්‍යයට ඇතුළුවීමට මා කුමක් කළ යුතු ද?

''එවිට එක් ප්‍රධානියෙක් ජේසුස් වහන්සේට කතා කොට; ගුරු දේවයෙනි, දේව රාජ්‍ය උරුම කර ගන්නා පිණිස මා කුමක් කළ යුතු දැයි ඇසීය. කාමමිථ්‍යාචාරය නොකරන්න, මිනී නොමරන්න, සොරකම් නොකරන්න, බොරු සාක්ෂි නොකියන්න, නුඹේ පියාටද මවට ද ගෞරව කරන්න යැයි ඔහුට වදාළ සේක. මේ සියල්ලම මාගේ යොවුන් වියේ පටන් රක්ෂා කළෙමි, ඔහු කීය. ජේසුස් වහන්සේ ඒ අසා ඔබට තව එක අඩුපාඩුවක් ඇත. ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න. එවිට දේව රාජ්‍යයේ ඔබට සම්පත් ඇති වන්නේ ය. එන්න, මා අනුගාමී වන්න.'' (ලූක් 18:23)

දේව රාජ්‍යයට ඇතුළුවීමට අපට දේව පනත් පමණක් අනුසාර කිරීම කිසිසේත් ප්‍රමාණවත් නොවන බව එදා ක්‍රිස්තුන් වහන්සේ අපට පහදා දුන් සේක. ගෙල වටා කුරුසියක් පැළඳු පමණින්, දැත් දිගු කර දණ ගසා ජපමාලය උච්චාරණය කළ පමණින්, දිනපතා දිව්‍ය පූජාවට, ශු. පැයට, වෙනත් භක්ති අභ්‍යාසවලට සහභාගි වූ පමණින් අපට කිසිසේත්ම දේව රාජ්‍යයට උරුමකම් කීමට අයිතිවාසිකමක් නොමැත. අනිවාර්යයෙන්ම අප සියලු දෙනාම හොඳ ක්‍රිස්තු භක්තිකයෝය. ශ්‍රී ලංකා ජනගහනයෙන් 7% ක් පමණ රෝමානු කතෝලිකයෝ වෙති. මෙම සෑම පුද්ගලයෙක්ම යහපත් ක්‍රිස්තු භක්තිකයෙකි. දේව රාජ්‍ය ලබා ගැනීමට අදත් ක්‍රිස්තුන් වහන්සේ එදා පැවසූ වදන් අපට පවසන සේක. ''ඔබට එක අඩුපාඩුවක් ඇත.'' එම අඩුපාඩුව අප එකිනෙකා තේරුම් ගත් තරමට අපට දේව රාජ්‍යයට උරුමකම් කීමට හැකිවනු ඇත.

(05) ''ඔබට එක අඩුපාඩුවක් ඇත.'' ක්‍රිස්තු භක්තිකයෙක් වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ''එන්න, මා අනුගාමී වන්න'' ක්‍රිස්තු අනුසාරකයෙක් වීමට ජේසුස් වහන්සේ අප කැඳවන සේක.....

''එක්තරා විනයධරයෙක් නැගිට උන්වහන්සේ පරීක්ෂා කරමින් ''ගුරු දේවයෙනි, දේව රාජ්‍ය හිමි කරගනු සඳහා මා කුමක් කළ යුතුදැයි'' ඇසිය. ඔබත් යහපත් සමරිතානුවරයෙක් වන්න. එවිට දේව රාජ්‍ය ඔබට උරුමය'' (ලූක් 10:25).

දේව රාජ්‍යයට ඇතුළුවීමට නම්, උරුමකම් කීමට නම් අප සමඟ ජීවත්වන සෑම පුද්ගලයෙක් තුළම ක්‍රිස්තුන් වහන්සේව දැකීමට උන්වහන්සේ අප කැඳවන සේක. දෙවියන් වහන්සේ මවන ලද මැව්ලි අතුරෙන් මුදුන් මල්කඩ වන්නේ මනුෂ්‍යයාය. පාපය හැර අන් සෑම අතින්ම ජේසුස් වහන්සේ ද අප හා සමාන මනුෂ්‍යයෙකු වූ සේක. අපගේ සහෝදරයාගේ බඩගින්නට, පිපාසයට, නිර්වස්ත්‍ර වීමට, ලෙඩ වීමට, තනි වීමට, අපට ප්‍රතිචාර දැක්වීමට හැකිවන තරමටම දේව රාජ්‍යය අපට උරුමය.

අප කෙදිනක හෝ මෙලොවින් සමුගත් විට දේව රාජ්‍යයට ප්‍රවිශ්ට වීමට පෙර අප සැමගෙන් නගන ප්‍රශ්න ශු. මතෙව් තුමා මෙලෙස සඳහන් කරයි. ''එවිට රජ්ජුරුවන් වහන්සේ සිය දකුණු පැත්තේ හිඳ කතාකොට, මාගේ පියාණන්ගෙන් ආශිර්වාදය ලද්දෙනි. එන්න. ලෝකය පටන් ගැන්මේ සිට ඔබට සූදානම් කර තිබෙන දේව රාජ්‍ය උරුම කර ගන්න. මන්ද, මම සාගිනිව සිටියෙමි; පිපාසව සිටියෙමි; ආගන්තුකව සිටියෙමි; නිර්වස්ත්‍රව සිටියෙමි; සිර ගෙදර සිටියෙමි..... ඔබ මා බලගත්තහුය (මතෙව් 25:32) දේව රාජ්‍යයේ වටිනාකම; අන්තිවාරම මෙම උතුම් ධර්මයයි. දේව රාජ්‍යයේ උතුම්ම ආදර්ශය, දහම් පණිවිඩය අසන්නන් පමණක් නොවි එය පිළිපදින්නන් වීමයි (ජාකොබ් 1:22) අප ජීවිතවල අප කරන එකම දෙය ධර්මය දෙසන්නන්, ප්‍රචාරය කරන්නන්, චතුර ලෙස දේශනා කරන්නන් වීම වුවත් එම ධර්මය අප ජීවිතය නොවන්නේ නම් අපද ඝෝෂා කරන සාන්ධාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට සමාන වූවන් වේ (1 කොරෙන්ති 13:1).

දේව රාජ්‍ය තුළ ජීවිත වෙනසකට ශු. ජාකොබ් මුනිතුමා අපව කැඳවන්නේ මෙසේය. "යම් සහෝදරයකුට හෝ සහෝදරියකට ඇඳුම් නැතිව, දිනපතා කෑම නැතිව සිටියදී ඔබගෙන් යමෙක් ශාරීරික අවශ්‍යතා සපයා නොදී ''ඔබට දෙවි පිහිටයි; උණුසුමට ඇඳ පැළඳ කාබී සතුටු වන්න'' යැයි ඔවුන්ට කියන්නේ නම් මොන යහපතක් ද? ක්‍රියා විරහිත විශ්වාසය මළ විශ්වාසයකි'' (ජාකොබ් 2:13).

ජීවිත වෙනසක් ඇති කර ගැනීමට අපට අවශ්‍යතාවයක් ඇත්නම් සෑම විටම අන් අය වෙත විශේෂයෙන් දුගී දුප්පත්, අසරණයන් වෙත අපගේ මුළු ජීවිතයම පරිත්‍යාග කළ යුතු බව අප වටහා ගත යුතුය. ''එහෙත් සිය සහෝදරයාට වෛර කරන්නා අන්ධකාරයෙහි හැසිරෙයි. ඔහුගේ ඇස් අන්ධව තිබෙන බැවින් තමා යන්නේ කොහෙදැයි ඔහු නොදනී (1 ජොහන් 2:11).

දේව රාජ්‍යයේ වටිනාකම් තේරුම් ගෙන ජීවිත වෙනස් කර ගැනීමට අපට අවශ්‍ය වේ නම් ''මේ ලෝකයටවත්, එහි ඇති දේ වලටවත් ආලය නොකරන්න. යමෙක් ලෝකයට ආදරය කරන්නේ ද දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මන්ද ලෝකයේ තිබෙන සියල්ල එනම්; කාම රාගයත්,මාංශික තෘෂ්ණාවත්, අහංකාරකමවත් ඇති වන්නේ දේව රාජ්‍යයෙන් (දෙවි පියාණන්ගෙන්) නොව ලෝකයෙන්ය. ලෝකයත්, ලෝකානුරාගයත් පහවී යන්නේය. එහෙත් දෙවියන් වහන්සේගේ කැමැත්ත කරන්නා දේව රාජ්‍යයට උරුමකම් කියන්නේය." (1 ජුවාම් 2:13)

☛ ලබන සතියට

✍ **ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා**
හාල්දඬුවන - දන්කොටුව

# අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ ජීවිත කාලයේදීත් යම් යම් දේ සිදුවුණා



**අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ ජීවිතය ඉතා චාම් සරල නිහතමානී ශුද්ධවන්ත ජීවිතයක් එතුමාණන්ගේ කතාව ඉතා පැහැදිලි චතුර වාග් විලාසයයි. අත්දැකීම්වල පොහොසත් භාවයයි. අවබෝධ කරගැනීමේ ක්ෂණික දක්ෂතාවයයි සියුම් බුද්ධියයි හද තුළ පිටාර ගලා යන පීතෘක දයාව කරුණාවයි.**

උන්වහන්සේට ආධ්‍යාත්මික කරුණු මෙන්ම භෞතික කරුණු ඉතා පැහැදිලියි. ඉවසීම, දුක් කරදර වේදනා හද තුළ දරා ගැනීමේ ප්‍රබල ශක්තියයි. දිළිඳු අසරණ අය කෙරෙහි උණුවෙන හදවතයි. යමක් කිරීමේදී නිවැරැදිව හා කල්පැවැත්ම ගැන ධූර දර්ශිව කල්පනා කළා. පිරිසිදුකම ඉතා ඉහළින් අගය කළා. හැමටම "දරුවෙනි" යන ආදර වදනින් කතා කළා නිතරම සිනා මුසු මුහුණින් ජීවත් වුණා. උන්වහන්සේගේ ජීවිතයේ ප්‍රබල අවිය යාච්ඤාවයි. යාච්ඤාව තුළින් තමයි හැම දෙයක්ම කිරීමට වරම් ලැබුනේ මිනිස්කම හඳුනන නියම මනුස්සකම උන්වහන්සේ තුළ තිබුණා.

උන්වහන්සේ මහ ගංවතුර විපත් වලදි ඔරුවක නැගී ගොස් ආහාර ආධාර බෙදා දුන්නා. දිළිඳු ධීවර ජනයා සොයා ඉරනතිව්, මුලතිව්, කෝකිලාව, කොක්කු තොඩුවාව, නිලා ඇලිය, පේසාලේ, කුදිප්පාඩුව, මාන්කරන්, පනිච්චන්කරන් වැනි ඈත එපිට ඉතා දුෂ්කර ප්‍රදේශවලට ගොස් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සොයා බැලුවා.

එක්තරා ගුරු වසමක ඉතා භාරධූර ගැටලුවක් පැන නැගී තිබුණි. එහි ඇතැම් පිරිසක් විසින් බලහත්කාරයෙන් දෙව්මැඳුර වසා තහනම් කරගෙන සිටියාහ. ඔවුන් එය තමන්ගේ නිදහස් සභාවක් නොකීවා පමණයි. ඇත්තෙන්ම මෙය කැරලි ගැසීමක් විය. මීසමේ හොඳ හිත ඇති බොහෝ දෙනකු අසරණ තත්ත්වයකට පත්ව බලා සිටියහ. සති කීපයක් තිස්සේ දිග් ගැස්සුණු මේ අරගලය ඒ වන විට ලොකු ප්‍රසිද්ධියක් ලබා තිබුණි. මේ ගැන මහත් සේ සිත් තැවුලට පත් අගරදගුරු හිමිපාණන් යාච්ඤාවෙන් නිරාහාරයෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ දනින් වැටී මෙයට විසඳුමක් ඉල්ලා යාච්ඤා කළා. මෙය සාතන්ගේ උපායක් බව එතුමෝ විශ්වාස කළහ.

මීසම් සේවක පියතුමා මීසම් ගෘහය වසා යතුරු කැරැල්ල අගරදගුරු හිමිපාණන්ට භාර දෙන ලදි. එක්තරා පියතුමකු කැඳවා අගරදගුරු හිමිපාණන් යතුරු කැරැල්ල සහ බලකඩදාසිය පියතුමන්ට දී කීවේ මේ මීසමට ගොස් ඔවුන් හමුවන ලෙසයි. ඒ මගින් යම් කිසි සමථයකට පැමිණීම සඳහා මඟක් පාදා ගැනීමට භාර වූ කටයුත්තයි. මේ කලහකාරින් සිය කණගාටුව ප්‍රකාශ කළ යුතු බවත් එක් කොන්දේසියකින් දන්වන ලදි. අගරදගුරු හිමිපාණන් ගෞරව පූර්වකව පිළිගැනීමට සූදානම් කිරීම පියතුමාගේ කාර්යභාරය විය.

සෑහෙන දුෂ්කරතා මැද පියතුමාට භාර වූ වගකීම ඉටුකර ගැනීමට හැකි විය. එම ප්‍රතිඵලය අගරදගුරු හිමිපාණන්ට දන්වන ලදි. සම්මත කර ගන්නා දිනයෙහි අගරදගුරු හිමිපාණන්ගේ වාහනයෙන්ම පියතුමා උන්වහන්සේ සමඟ එහි ගියහ. දෙව්මැඳුර ඔවුන් හොඳින් පවිත්‍ර කර ලක්ෂණට සරසා තිබුණි. ප්‍රධාන දොරටුව දක්වා පයින් ගිය එතුමා එහි ඇතුල් නොවී වැලිතලාව මත මුනින් තලා වැටුනි. මිනිත්තු තුන හතරක්ම එම ඉරියව්වෙන්ම සිටියේ ය. බොහෝ දෙනාට එය උද්වේගකර අවස්ථාවක් විය. කාන්තාවෝ කඳුළු සලන්නට විය. කැරලිකාර කණ්ඩායම ඉතා හැඟුම්බරව බලා සිටියහ.

ඉන්පසු දෙව්මැඳුරේ පඩිය මත සිට අගරදගුරු හිමිපාණන් පැමිණ සිටියවුන් ඇමතීය. මාතෘකාව වූයේ විශ්වාසය නමැති දේව දීමනාව සහ එය රැක ගැනීම යනුයි. පාපයට අපි විරුද්ධයි. එහෙත් පව්කරුවාට සමාව දෙනවා මේක ඉතා පැරැණි කතෝලික මීසමක් මේ අයට මීට වඩා හොඳ පියවරක් ගන්ට තිබුණා. මේක නම් යක්ෂයාගේ වැඩක්. මෙය දෙතුන් වරක්ම කීවේය.

ඉන් අනතුරුව කැරැලිකාර කණ්ඩායමේ නායකයා විසින් කණගාටුව ප්‍රකාශ කිරීමේ ප්‍රකාශනය කියවන ලදි. ඉන්පසු අගරදගුරු හිමිපාණන් පූජා වස්ත්‍රයෙන් සැරසී කෙළින්ම දෙව්මැඳුරට ඇතුල් නොවී පැදකුණු කරමින් බිත්ති වලට ආසිරි පැන් යහමින් ඉස්සේය. ඉන්පසුවයි දේවස්ථානයට ඇතුල් වී දිව්‍ය පූජාව සිදු කළේ. ඉතා විශාල පිරිසක් සහභාගි වුවත් දිව්‍ය පූජාවට පූප ගැනලා ගත්තේ නැහැ නොවැ. ඒ උනත් අවසාන තැනැත්තේ ලබා ගත්තේ අවසාන පූපයයි. සියළු දෙනාම ඉතා හැඟුම්බරව භක්තියෙන් දිව්‍ය පූජාවට සහභාගි වූහ. ආ පසු එන ගමනේ දී අගරදගුරු හිමිපාණෝ පියතුමාගෙන් පැනයක් ඇසූහ.

"පියතුමෙනි, ඔබවහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීමේදී යම් කිසි විශේෂත්වයක් එහෙම දුටුවාද? ඔව්, පියාණනි, මම ද එසේ කීවේ ඒ ඒ ගැන සිතමින් සිටි නිසාය. සියල්ල හරි ලෙසට සිදු වූ බවට ස්වර්ගයෙන් ලද සලකුණකැයි අගරදගුරු හිමිපාණෝ කල්පනා කර තිබුණි. ඇත්තෙන්ම එය ජයග්‍රහණයකි. එම ගුරු වසමේ එම අරගලය ඉන් සමාප්ත වී ඉක්මනින් යථා තත්ත්වයට පත්විය.

✍ **දොන් වින්සන්ට් රූපසිංහ**
මහරගම

# ශුද්ධෝත්තම පියතුමන්ගේ ඡායාරූප ඡන්ද ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීම



**කතුතුමනි,**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඡන්ද ප්‍රචාරක කටයුතු සඳහා ඇතැම් අපේක්ෂකයින් පාප්වහන්සේගේ ඡායාරූප ඇතුලත් කර විශාල ප්‍රමාණයේ බැනර් කටවුට් ඇතැම් ප්‍රසිද්ධ ස්ථානවල සවිකර ඇත.

පසුගිය ඥානාර්ථ ප්‍රදීපය කතු වැකියකින්ද පෙන්වා දී ඇති පරිදි උන්වහන්සේ පැමිණෙන්නේ අධ්‍යාත්මික චාරිකාවකට මිස යුද්ධයෙන් සිදුවූ හානි ගැන විමසීමටවත්, ඒ ගැන කතා කිරීමටවත් නොවන අතර කිසිදු දේශපාලනික පක්ෂයකට ආවැඩීමකට හෝ නොවේ. මේ සංචාරය මෙවැන්නකට යොදා ගන්නේ නම් එය පිටු දැකිය යුතු බවද සඳහන් කර ඇත.

තවද එවැනි ප්‍රචාරක කටයුතු සිදුකරන්නේ නම් එය අප ශුද්ධෝත්තම පියතුමන්ට කරන අගෞරවයක් අපහාසයක් බවද කිව යුතුය.

මේ පිළිබඳව කිතුනු ජනතාවගේත් සභා ශ්‍රේෂ්ඨයන්ගේත් අවධානයට ලක්විය යුතු අතර එය දේශපාලනික නායකයන්ද අවබෝධ කරගෙන උන්වහන්සේ පැමිණෙන ආධ්‍යාත්මික කටයුත්ත කිසිදු අපහසුතාවයකින් තොරව ඉෂ්ට සිද්ධ කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත

# කිතුනුවන් ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරීම

**කතුතුමනි,**

මුස්ලිම්වරුන් බහුතරයක් සිටින රටක් වන ඉරාකයේදී, අන්තවාදී ආගමික සංවිධානයක් විසින් කිතුනුවන් ඝාතනය කර, දේපල හානි සිදු කරමින් ඉරාකයේ කිතුනුවන් නැත්තටම නැති වෙන තත්ත්වයක් මේ වන විට පවතී.

භය හතර නොදත් කිතුනු දරුවන් විශාල ප්‍රමාණයක් මේ වන විට ඝාතනය කොට අවසානය.

එදා, පළමු සියවස් තුනේදී, අපගේ ගැළවීමේ සංකේතය වූ, කුරුසය හා කිතු දහම වැළඳගත් නිසා රෝම අධිරාජයන් විසින් කිතුනුවන් ඝාතනය කරන ලදි. නමුත්, අද මේ සිදුවන ඉරාකයේ කිතුනු ඝාතන රැල්ලට එරෙහිව හඬක් නැඟිය යුතු නොවේද?

**නිපුන් නවෝද**
සරික්කාලිමුල්ල



# රාජ්‍ය විශ්‍රාමිකයා කබලෙන් ලිපට ඇද නොදමන්න

**කතුතුමනි,**

අද අප රට තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අතර විශ්‍රාමිකයන් රටට සුවිශේෂී මෙහෙවරක් කර සැදෑ සමයේ පසුවන පරිණත පිරිසක් ලෙස හැඳින්විය හැකිය.

සැම අයවැයකදී මේ පිරිස ඇඟිලි ගණන් කරමින් පසුවන්නේ අහස උසට ඉහලයන ජීවන වියදමට සරිලන මුදලක් වැටුපට එක්වන්න කියාය. ඉතා ශෝචනීය කරුණ වී ඇත්තේ එම පිරිස ලිප්ටන් වටරවුම වටා රොක්වී විශ්‍රාමික වැටුප් විෂමතා ඉවත් කරන ලෙස අඳෝනා නැගීමයි.

ඒවා පසුගිය රජයන්ට මෙන්ම වත්මන් රජයන්ටද කරන බීරි අලින්ට වීණා වැයීමක් බවට පත්ව තිබේ. ඉතාමත් සුපිරි වරප්‍රසාද හිමි මැති ඇමති වරුන්ට ගෙවන විශ්‍රාමික වැටුපට වඩා සොච්චමක් රජයේ විශ්‍රාමිකයාට ලැබේ.

ලඟදි රජය විසින් සියලුම විශ්‍රාමිකයන්ට බැංකුවලින් පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමට නියෝග කිරීම ගහෙන් වැටුන මිනිහාට ගොනා ඇන්නා වැනි දෙයකි. දෙපාවාරු නැති වයෝවෘද්ධ විශ්‍රාමිකයන් බහුතරයක් සිය විශ්‍රාමික වැටුප ලබාගත්තේ තමන් ජීවත් වන පෙදෙසට සමීප තැපැල් කාර්යාලයෙනි. රාජ්‍ය විශ්‍රාමිකයා ගැන සෙනෙහසක් ඇති ජනතා රජයක යුතුකම වන්නේ තැපැල් කාර්යාලය මගින් විශ්‍රාමික වැටුප ලබාගැනීමේ අයිතිය රැකදීමය.

**ඩී. අර්නස්ට් සමරතුංග**
රාගම

# ආගමික ගැටුම් හා ධර්මද්වීපය

**කතුතුමනි,**

ගෙවීගිය පසුගිය දශක හතර දෙස බැලීමේදී ශ්‍රී ලංකාවේ ජාතිවාදී හැඟීම් නිසා ජීවිත දහස් ගණනක් විනාශ වූ හැටි අප සැමගේ මතකයෙන් ඈත්ව නොයන්නකි. මානුෂිය යුද සංග්‍රාමයෙන් පසු නිදහස් නිවහල් දේශයක් ඇතිවූවත් නැවත ලේ වැගිරීමකට අතවනන්නාක් වැනි සිදුවීම් රාශියක් අප පසුගියදා දුටුවෙමු.

එහි උච්චතම අවස්ථාව ලෙස අළුත්ගම බේරුවල නගර තුළවූ සිද්ධිය පෙන්වා දියහැකිය. මෙවැනි ආගමික ගැටුම් අපට සාධාරණී කරණය කළ නොහැකිය. මන්දයත් ඉස්ලාම් රටවල සිදුවන උග්‍ර කිතුනු සංහාරය, ඇතැම් බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් වපුරන ආගම්වාදි හැඟීම්, අදහස් සියල්ල පෙර ලෙස සාධාරණීකරණය කළ නොහැකිය. නමුත් මෙහි අනියත වැදගත් කරුණ වනුයේ ජාතිවාදය, ආගම්වාදය අනුමත නොකරන, සාමය, සහෝදර ප්‍රේමය අගයන කතෝලික, බෞද්ධ, ඉස්ලාම්, හින්දුන් බොහෝ සිටින බවය. මානව දෘෂ්ටි කෝණයෙන් බලන කල මිනිස් වර්ග හැම එක හා සමානය. මිනිසා භෞතිකමය ලෙස වෙනස් වූවත්, අධ්‍යාත්මික ලෙස වෙනස් වීම අන් අයට හානිකර විය හැකිය. ඒ ඔවුන් තුළ හටගන්නා විවිධාකාර හැඟීම් ආකල්ප නිසාය. කිසිදු ආගමික ශාස්තෘතුමෙක් අනෙකාට වෛරකරන්න, අනෙකා විනාශ කරන්න යනුවෙන් පවසා නැත. නමුත් වර්තමානයේ විවිධාකාර වෛරි පුද්ගලයින් තුළ හට ගන්නා හැඟීම් ආකල්ප නිසාම ආගම දඩමීමා කරගෙන කටයුතු කිරීම මනුෂ්‍ය වර්ගයාටම කෙරෙන නිගාවකි. කිසි විටෙක අනෙක් ධර්මයක් පහත් ලෙස කථා කළ යුතු නැත. මිනිසාගේ ක්‍රියාවන් නිසා ධර්මයන් තුළ පවතින උතුම් බව කෙළෙසිය නොහැකිය.

පසුගියදා එක්තරා භික්ෂුන් වහන්සේ නමක් මාධ්‍යයට මෙලෙස ප්‍රකාශයක් කර තිබුණි. 'පාප්වහන්සේ අපෙන් සමාව ගන්න ඕනේ' යනුවෙනි. ඒ පිළිබඳ පසුගිය ප්‍රදීපය පුරාවටම හරවත් විචාර මඟින් පැහැදිලි කර තිබුණු. සත්‍යතාවයන් බුද්ධිමත් පාඨකයන්අවබෝධකරග න්නට ඇත. එමෙන්ම කිසිදු ලෙසකට තවත් ආගමිකයෙක්, තවත් ජාතිකයෙක් වෙනස් ආගමකට, ජාතියකට බලෙන් හැරවිය නොහැකිය. පසුගිය වර්ෂ කිහිපය පුරාවට එවැනි සිදුවීම් විශාල ලෙස සිදු වී ඇතැයි හඳුනාගෙන තිබේ. කිතුනුවන් වශයෙන් අපට එල්ල වන චෝදනාව වනුයේ අප අන් ආගම් හැල්ලු කරනා බවයි. නමුත් අප අවධානය යොමු කළ යුත්තේ මෙවැනි ක්‍රියා සිදුකරන්නේ කතෝලික සභාව නොව හතු පිපෙන්නාක්මෙන් ඇති වන මූලධර්මවාදි කිතුනු සභාවන්ය.

මෙවැනි සභාවක් නිසා කතෝලික සභාවට සිදුවන කැළල අතිමහත්ය. අනෙක් කරුණු වන්නේ ආගමෙන් ආගමට පනවන නීතිරීති පිළිබඳවයි. විහාරස්ථානවල ගාථා මෙන්ම මුස්ලිම් පල්ලි වල යාච්ඥා ශබ්ද විකාශන වලින් ප්‍රචාරය කිරීමට පුළුවන්කම තිබුණත් ඇතැම් අයට දේවස්ථානවල ශබ්ද විකාශන භාවිත කිරිමට නීතිමය බාධා ඇතිවේ. ධර්මද්වීපය යැයි කියා ගන්නා ශ්‍රී ලංකාව තුළ සිදුවන අධම ක්‍රියාවන්න් කණගාටුවකට කරුණකි. මේ වෙනුවෙන් කතෝලිකයන් ලෙස අන් ආගම් දෙස වෛරීභාවයෙන් නොබැලිය යුතුය. මන්ද කිතු දහමේ අපට උගන්වා ඇත්තේ 'වෛරය පිරුනු වියළි බිමකට සාමයේ දිය පොදක් විය යුතු බවයි.' එය අප සැම විටම මතක තබා ගත යුතුය.

**ඩබ්. වියානි පියුමන්ත පෙරේරා** - දළුගම

# කළුතර කතෝලික නීතිඥ සංගමය පසසමු

**කතුතුමනි,**

කළුතර කටුකුරුන්ද සාන්ත පිලිප්නේරි දෙව්මැඳුරට ප්‍රවේශවන මංසන්ධියේ කතෝලික සැදැහැවතුන් ස්ථාපිත කළ ප්‍රතිමාව පොලිසිය විසින් උසාවි නියෝගයකින් රැගෙනයාම හේතුවෙන් ඇති නොසන්සුන්කාරි වාතාවරණය කිතුනු ජනතාව අතර ඇඩි සංවාදයකට ලක්විය. ආගමික නිදහස ගරුකරන රටක මෙවැනි නොමනා ක්‍රියාවන් සිදුවන්නේ කාගේ මනදොළ පිනවීමට දැයි අපට ඇත්තේ ප්‍රශ්නයකි.

ඓතිහාසික අතින් සුවිශේෂී වටිනාකමක් ඇති මෙම දෙව්මැඳුර කේන්ද්‍රකර ගෙන අදාල ස්ථානයේ



මෙම ප්‍රතිමාව ස්ථාපිත කරතැබීමෙන් සිදුවන අයහපත කුමක්දැයි පෙන්වා දෙන ලෙස අප වගකිව යුත්තන් ගෙන් අසමු. සමාජ පරිහානියට දැඩි සේ හේතු කාරකවන සදාචාර විරෝධි දෑ ඉතා නිදහසේ සැරිසරමින් සාරධර්ම පද්ධතිය ඇතුළු මිනිස් වටිනාකම් කාදමන විට ශිෂ්ට මිනිසාගේ භූමිකාව ආගමික ගැටුම් ඇතිවන මෙවැනි පහත් ක්‍රියා සිදුකිරීම නම් අපි ඒ ගැන අතිශයින් කණගාටුවෙමු. කෙසේ හෝ මෙම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත්වන කිතුනු ප්‍රජාවට සිදුකළ මෙම බලවත් අසාධාරණය දැඩි සේ හෙළාදකිමින් අවැසි නීති ආධාර සැපයීමට ක්ෂණිකව ක්‍රියාත්මක වූ කළුතර කතෝලික නීතිඥ සංගමයට අපගේ කෘතවේදි බව මෙසේ ප්‍රශංසාත්මකව සටහන් කරමු.

**රොෂාන් ලින්කන්**
දියලගොඩ

# අධික ජීවන වියදම් බර උහුලන්න බැහැ!

**කතුතුමනි,**

අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල දිනෙන් දින ඉහල යාම නිසා අසරණ පාරිභෝගික ජනතාව මහත් කරදර හිරිහැරවලට මුහුණපාති.

තම තමන් සුලු රැකියාවක නිරතව එයින් ලැබෙන සොච්චම් වැටුපෙන් පවුලේ සියලුම අත්‍යවශ්‍ය සේවාවන් කරගැනීමට සිදුවී ඇත. වත්මන් වෙළඳපොලේ සහල් මිල රු. 75 ත්, රු. 90 ත්, රු. 100 ත් අතර ප්‍රමාණයක වේ.

ඉදිරි අනාගතයේ සාධාරණ මිළ ගණන් යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පමණක් හෝ ලබාදෙන්න. ලක්බිමේ දිවි ගෙවනු ලබන අසරණ සියලු පාරිභෝගික ජනතාව වෙනුවෙන්ම කරනු ලබන මගේ අවසන් හෘදයාංගම පැතුමයි ඒ.

**වෝල්ටර් නික්ලස් පෙරේරා**
නැගෙනහිර නයිනමඩම



# කතෝලික සංඝය ස්වර්ගීය මනාලි යයි සසුන් පියා පවසයි



ඔක්තෝබර් මස 15 වෙනිදා, පොදු හමුවේදී සසුන් පියා, එළිදරව්ව පොතේ ප්‍රකාශයට අනුගත වෙමින්, කතෝලික සංඝයේ මනාලිය ස්වභාවය මෙනෙහි කිරීමට ලක් කළ සේක.

තවද එතුමා මෙලෙසින් ද ප්‍රකාශ කළ සේක. "කතෝලික සංඝය ක්‍රිස්තුස් නමැති සිය මනාලයා හමුවීමේ පරම අභිලාශයෙන් දිනපතා සූදානම් වෙනවා ඇත. පාවුළු තුමා සමගින් "අපි සැමදා ස්වාමින් වහන්සේ සමගයි" කියා තුන් වරක් හඬ නගන්න යි" පැවැසිය. රැස්ව සිටි සියල්ලෝ එම පාඨය තුන් වරක් ප්‍රකාශ කරමින් මොර දුන්හ.

එතුමා විසින් තවදුරටත් අනුශාසනා කරනු ලැබුවේ, "දේවාදරයේ අභිරහස්" අත්දැකීමේ මග හුදු ආශාවක් නොව තිර ලෙස එළ දරනා බලාපොරොත්තුව බවය. එබැවින් සැබෑ ආදරය අත්දැකීම කරා යන ගමන සැක සහිත නොවන සැබෑ බලාපොරොත්තුව බවට අපි සාක්ෂි දැරිය යුතු වෙමු." යි ද අනුශාසනා කළ සේක.

# පවුල් නංවාලමින් සංවර්ධනය වඩවාලන්නයි වතිකාන නියෝජිත ඉල්ලයි

එක්සත් ජාතින්ගේ සංගමයේ, වතිකාන නිත්‍ය නියෝජිත බර්නාඩිතෝ අයුෂා රදගුරු හිමිපාණන් විසින්, ජනගහනය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සැමරුම් අළලා, ප්‍රකාශ කරනු ලැබුවේ, පොදු සමාජ හා ආර්ථික සංවර්ධනය නංවාලීම සඳහා ප්‍රධාන දායකත්වය ලබා දෙනුයේ, පවුල බලසම්පන්න හා වර්ධනය කරනු ලැබීම මගින් බවයි.

අගරදගුරු බර්නාඩිතෝ අයුෂා උතුමාණන් විසින් තවදුරටත් අවධාරණය කරනු ලැබුවේ. යුද කෝලාහල ද, ස්වභාවික ව්‍යසනයන් ද, මිනිස් වර්ගීකරණයන් ද මගින් බෙදා වෙන් කරනු ලැබීමෙන් ද, තවත් බොහෝ ආකාරයෙන් ද පීඩාවන්ට පාත්‍ර කරති ඒ ඒ පවුල්, ඒ ඒ රජයන් විසින් ඒකරාශි කිරීමේ විශේෂ ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කළ යුතු බවයි.

තවද බර්නාඩිතෝ අයුෂා අගරදගුරු හිමිපාණන් විසින් එක්සත් ජාතින්ගේ සමාජිකයන් වෙතැ අවධාරණය කරනු ලැබුවේ, ජනතාවන් වෙතැ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් අත්දැකීමේ අවස්ථාවන් විවර කැරුම ආර්ථික සංවර්ධනයේ අතිශය වැදගත් මං පෙත් බවයි; සංවර්ධනය වෙමින් පවත්නා රටවලැ වනිතාවන්ගේ අතිශය වැදගත් අවශ්‍යතාව වන්නේ. 'ගබ්සාව සඳහා අයිතිය නොව ප්‍රමාණවත් සෞඛ්‍ය සංරක්ෂණය බවයයි.



# ඉන්දියාවේ, මැයි සිට ඔක්තෝබර් දක්වා සුළුතර ආගමික පහරදීම් 600 ඉක්මවයි

ඉන්දියාවේ පවත්නා 'සමාජ ක්‍රියාකාරිත්වය' නම් ජේසු නිකායට අයත් සංවිධානයක් විසින් හෙළි දක්වා ඇති පරිදි, මේ වසරේ මැයි මාසයේ සිට ඔක්තෝබර් දක්වා ඒ රටේ ඒ ඒ පළාත් වලැ සිදුවී ඇති කිතුනු හා මුස්ලිම් ආගමිකයන්ට පහරදීම් 600 වතාවක් ඉක්මවා ඇත.

සිදුවී ඇති සුළුතර ආගමික පීඩනයන් පාදක කොට ගෙන එම සංවිධානය මෙලෙසද ප්‍රකාශ කරයි. "සුළුතර ආගමිකයන් කෙරෙහි දක්වනු ලබන වෛරය හා ක්‍රෝධය නිසාවෙන් එවන් පහරදීම් දිගින් දිගට කරගෙන යාමෙන් පෙනී යන්නේ, සුළුතර ආගමිකයන් කෙරෙහි නොතිත් ක්‍රෝධයක් වපුරුවාලීම ඇතැමුන්ගේ අරමුණු වී ඇති බවයි. එහෙත් කිතුනු හා මුස්ලිම් සුළුතර ආගමිකයන් අතවරයන්ට භාජනය කරවීමෙන් ඇතැම් නගර හා ගම් තුළැ පවත්නා සංහිඳියාව හා සහෝදරත්වය බිඳී යාම මැනැවින් හුවා දක්වනු ලැබ ඇත.

තවද, නව අගමැති නරේන්ද්‍ර මෝඩි මහතාගේ නව රජයේ පළමු දින 100 ක කාල පරාසය තුළදී, ඒ ඒ ප්‍රදේශයන් හී ඇතැම් හින්දු ආගමික නායකයන් විසින් මුස්ලිම් හා කිතුනු ආගමිකයන් අවමානයටත් හැල්ලුවටත් පාත්‍ර කැරෙමින්, ජනතාවන් හමුවේ ප්‍රසිද්ධියේ ජන ඇමැතීම් කර ඇති බැව් බොහෝ අංශ මගින් වාර්තා වන බැව් ද ජේසු නිකායේ 'සමාජ ක්‍රියාකාරිත්වය' නම් සංවිධානය විසින් හුවා දක්වනු ලැබ ඇත.

# බටහිර සහයෙන් ඉස්ලාම් රාජ්‍යය වර්ධනය වූයේ යයි චෝදනාවක්

සිරියානු ත්‍රස්තයන්ට ඇමෙරිකා එක්සත් ජනපදය, ඊශ්‍රායලය හා තවත් බටහිර රටවලින්, ලබාදුන් සහාය හේතුකොට ගෙන 'ඉස්ලාම් රාජ්‍යය' බලය වර්ධනය වූ බැව් සිරියානු ජාතික කතෝලික පූජක වරයකු වන මටිනෝස් හඩාඩ් චෝදනා කරයි. දැනට රෝමයේ පූජක සේවයේ නිරත එම පූජක තුමා විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, බටහිර රටවලැ සහාය සිරියානු ත්‍රස්තයන්ට මොනයම් ආකාරයකින් හෝ ලබාදුනහොත්, ඉස්ලාම් රාජ්‍යය වර්ධනය වළකාලීමට බැරිවන බවයි.

එම පියතුමා තව දුරටත් මෙලෙසින් ද ප්‍රකාශ කළේය. 'සිරියාවේ ප්‍රජාතන්ත්‍රවාදි ත්‍රස්තයන් නොමැත. ඔවුන් සැම කෙනෙකු අතම ඇත්තේ, මාරාන්තික ආයුධය. ඔවුන් එම ආයුධ යොදා ගන්නේ, කතෝලික සභාව යටපත් කරවා ගැනීමටයි. යුරෝපාකරයෙන් ලද සහාය උපයෝගි කරගෙන ජිහාඩ් වරුන්ගේ බලය තව තවත් ශක්තිමත් වී ඇත. එමගින් දේශයෙන් කිතුනුවන් පන්නා දැමීමේ කාර්යයෙහි ත්‍රස්තයෝ දිගින් දිගට නිරතව සිටිති.

# බලෙන් කිතු දහමට බඳවා ගන්නේ යැයි 7 දෙනෙක් බන්ධනාගාරයට

පසුගිය සතියේ ඉන්දියාවේ මධ්‍ය ප්‍රාන්තයේ පොලීසිය විසින් සත් දෙනෙකු සිර භාරයට ගෙන ඇත්තේ, ඔවුන් විසින් බලහත්කාරයෙන් හින්දු භක්තිකයන් කිතුනු දහමට බඳවා ගන්නේය යන චෝදනාව මතය; මෙලෙසින් වාර්තා කරනු ලැබ ඇත්තේ, ඉන්දීය 'එක්ස්ප්‍රස්' නම් මාධ්‍ය ඒජන්සිය මගිනි.

සිරභාරයට ගනු ලැබ ඇත්තේ, පුරුෂයන් 5 දෙනෙක් හා ගැහැනු දෙදෙනෙක්ය. චෝදනාව වන්නේ එම 7 දෙනාගේ කණ්ඩායම තමන්ගේ මුදල් තවත් කෙනෙකුට දී, ඔහු කිතුනු දහමට හරවා ගෙන ඔහු මගින් තවත් කීප දෙනෙක් ද හරවා ගැනීමට ක්‍රියා කරවීම යන්නය; එහෙත් එම දහම් සේවක සේවිකාවෝ තමන්ට එරෙහි චෝදනා ප්‍රතික්ෂේප කරති; සියල්ල වාචික චෝදනා හා කට උත්තර වන අතර, චෝදනා කිසියම් ආකාරයකින් හෝ ඔප්පු කිරීමට නොහැකි යැයි, කිතුනු නීතිඥවරු ද තර්ක කරති. එහෙත් මේ සත් දෙනාම තවමත් බන්ධනාගාර ගත වී ඇතැයි වාර්තා වේ.

# චීනයේ 20 වසරක් හිරේ සිටි රදගුරුහිමි ස්වර්ගස්ථ වෙයි

චීනයේ උපත ලද වයස අවුරුදු 90 ක් වූ ජෝන් බැප්ටිස්ට් චොං රදගුරු හිමිපාණෝ, ඔක්තෝබර් මස 10 වැනිදා, ස්වර්ගස්ථ වූ සේක. එතුමාගේ පූජක දිවියේ අති අභියෝගාත්මක කාල පරිච්ඡේදය වූයේ, එතුමා චීනයේ කොමියුනිස්ට් සමයේදී, සිරගතව සිටි 20 වසරක කාල පරාසයයි; එසේ සිරගත සිටියේ වර්ෂ 1965 සිට 1985 දක්වාය; සිරකඳවුරු තුළ පවා කොතෙකුත් හිරිහැර බාධක අත්වින්දත් එතුමා සිය ඇදැහිල්ලේ නොසැළී සිටි අයුරු ගිහි පැවිදි සියල්ලන්ට ඉමහත් ආදර්ශයක් වී ඇත.



එතුමා පූජක දිවියට එළැඹීමට සූදානම් වූ කාලයද පවා, අතිශය අභියෝගාත්මක විය. චීනය කොමියුනිස්ට් පාලනය යටතට පත්වීමත් සමග විශේෂයෙන් කතෝලිකයෝ ඉමහත් පීඩනයන්ට පත් වූහ. ජෝන් බැප්ටිස්ට් තුමාද, සිය පූජක පුහුණු කාලය අවසන් කර ගැන්ම සඳහා හොංකොං බලා ගියේ අතිශය දුෂ්කර තාවයන් තුළය; එතුමා වර්ෂ 1951 දී පූජක වරම් ලබා ගත්තේය. දේශයේ පාලකයන්ගෙන් කොතෙක් හිරිහැර බාධක පැමිණියත් එතුමා ශුද්ධාසනයේ පාලනය යටතේ සිය දූත මෙහෙවර ඉදිරියට ගෙන ගිය සේක; එතුමා 75 වියේදී, ශුද්ධාසනය විසින් රදගුරු වශයෙන් ආලේපනය කරනු ලැබීය.

එතුමා රදගුරු වශයෙන් අවසන් හුස්ම හෙළන්නට කලින් අවසන් 15 වසරක කාලය තුළදී, 15 දෙනෙක් පූජක වරයට ඔසවනු ලැබීය. සමිඳුන් තුළ පරිපූර්ණ ජීවිතයක් ගතකළ එතුමා, විශේෂයෙන් චීනයේ ගිහි පැවිදි සියල්ලන්ට පරම ආදර්ශයක් යැයි ප්‍රකාශ කැරේ.

# සිරියාවේ ගමක පියතුමා හා කතෝලිකයන් පැහැර ගැනේ

ඔක්තෝබර් මස 05 වැනි ඉරිදා රාත්‍රියේ සිරියාවේ එක් දිළිඳු ගමක විසූ පූජක තුමා හා කතෝලිකයන් පිරිසක් පැහැරගෙන ගොස් ඇති බැව් කතෝලික පුවත් වාර්තා කරයි; මෙම පැහැර ගැනීම රිෂාඩ් ත්‍රස්ත කණ්ඩායමේ පිරිස් විසින් සිදු කරන්නට ඇතැයි සැක කරනු ලැබුවත්, නිශ්චිත තොරතුරු තවමැ ලැබී නැත. තවද පැහැර ගත් සියලු දෙනා කොහේ සිටිනවාද, නැතහොත් මරා දමා ඇද්ද කියාද නිශ්චිත ලෙසින් නොදන්නා බැව් ප්‍රකාශිතය.

ප්‍රැන්සිස්කාන නිකායට අයත් හන්නා පෝල්අවුට් නම් පූජක තුමාද ඇදැහිළි වන්තයින් 25 දෙනෙක් ද පැහැරගෙන ගොස් ඇතැයි දක්වා ඇත. තවද එම ගම්මානයේ විසූ සියලු කිතුනුවන් වෙතැ කඩා වැදි පහරදීම හේතුකොට ඔවුන්ට සිය ගෙවල් දොරවල් හැර පියා ආරක්ෂක ස්ථාන කරා ගොස් සැඟවී සිටීමට සිදුව ඇත. සිරියාවේ අලෙප්පෝ නගරයේ ජීවත්වන ශුද්ධාසන නියෝජිත ජෝර්ජස් අබෝ රදගුරු හිමි තුමා විසින් ද මෙම පැහැර ගැනීම් සත්‍ය බැව් ප්‍රකාශ කරනු ලබන අතර, අදාළ ගමේ වූ කන්‍යාරාමයක් ද මුළුමණින්මැ විනාශ කොට ඇති බැව් එතුමා සනාථ කරයි. දැන් දැන් ලැබී ඇති ආරංචි අනුව පියතුමා නිවසක සිරකොට තබා ඇතැයි ආරංචි ලැබී ඇත.

# කැමරූන් හී බොකෝ හරාම් පීඩන හමුවේ දේව සේවකයෝ රැඳී සිටිති

උතුරු කැමරන් වටකොට 'බොකෝ හරාම්' ත්‍රස්ත කංඩායම විසින් මිනිස් ඝාතනයන් දිගින් දිගට කරගෙන යද්දී, පොන්ටිපිකල් ආයතනයෙන් එහි පැමිණ ඇති දේව සේවකයන්, එම ප්‍රදේශ අතහැර නොයාමට තීරණය කරති බැව් වාර්තා වේ.

උතුරු කැමරන් හී වෙසෙනා හබ්ලෝ මූයි නම් පූජක තුමා ප්‍රකාශ කරන පරිදි, උන් හිටි තැන් අහිමිව, සරණාගතව සිටිනා එම ජනතාවන්ට ආධාර උපකාර කිරීමට එහි රැඳී සිටිනුයේ කතෝලික සභාව පමණි. පියතුමා විසින් තවදුරටත් හෙළි දක්වා ඇත්තේ. ආරක්ෂක හේතුන් මත ජාත්‍යන්තර සංවිධාන පවා කැමරන් අත්හැර ගොස් ඇත. එතුමා තවදුරටත් මෙලෙසින් ද පැවැසුවේය. 'අපි කැමරන් හී කතෝලික සභාව වශයෙන් සරණාගතයන්ට ආහාර පානාදිය ලබාදීම, සියළු බාධක හමුවේ නොනවත්වා කරගෙන යන්නෙමු."

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග

# දියමන්ති වසරට ළඟා වන නුවර දෙව්සත්හල



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම් **ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**185**

නුවර අම්පිටියේ ජාතික දෙව්සත්හල මේ මස පළමු දින 2014 - 2015 අධ්‍යයන වර්ෂය ආරම්භ කළේ ය. මේ සමඟ එම පූජනීය ආයතනය පා තැබුවේ එහි 60 වැනි හෙවත් දියමන්ති ජයන්ති වසරට යි.

නුවර ජාතික දෙව්සත්හලේ ඉතිහාසය යුග දෙකකට අයත් වන්නේ ය. පළමු යුගය "පේපල් සෙමිනර්" හෙවත් පාප් වහන්සේ නමින් වූ දෙව්සත්හලයි. දෙවැනි යුගය "ලංකා අප ස්වාමිදූ ගේ ජාතික දෙව්සත්හල" යි.

"පේපල් සෙමිනේරිය" නමින් වූ දෙව්සත්හල ආරම්භ කරන ලද්දේ ක්‍රි.ව. 1893 දී ය. 13 වැනි ලියෝ ශුද්ධෝත්තම පාප් වහන්සේ දුර දැක්මෙන් හා දහම් උද්යෝග යෙන් සැලැසුම් යොදා සිටියේ දකුණු ආසියාව තුළ ධර්ම ප්‍රචාරය සඳහා දකුණු ආසියාතික ජාතින්ටම අයත් පිරිස පූජකවරය සඳහා පුහුණු කැර පත්කරලීම යි. ඒ අනුව එවකට ඉන්දියාවේ තානාපතිව සිටි (අපෝස්තලික තානාපති) මාහිමි ඇන්ටෝනියෝ අලිගාර්ඩ් තුමන්ට මේ ප්‍රදේශයේ දෙව්සත්හලක් ඉදිකිරීම සඳහා සුදුසු බිමක් තෝරා නම් කරන ලෙස උපදෙස් දී තිබිණි.

එහෙත් කල් ගතවීමත් සමඟ එතුමා ඉන්දියාවෙන් බැහැරව ගියේ ය. මේ කාලය තුළ එතුමා වඩාත් මනාපය දැක්වූයේ ඉන්දියාවේ ම බැංගලෝර් නුවරට හෝ පූනේ නුවරට යි.

අලිගාර්ඩ් හිමිපාණන් ඉන්දියාවෙන් සමුගැනීමත් සමඟ එම තනතුරට පත් වූයේ කලක් එතුමන් ගේ ලේකම්ව සිටි මාහිමි ලැඩිස් ලෝස් මයිකල් සැලෙස්කි හිමිපාණන් ය. දකුණු ආසියාව හොඳින් දැන සිටි එතුමන් ගේ ඒකාන්ත තීරණය වූයේ මේ දෙව්සත්හල ලංකාවේ නුවර ඉදිවිය යුතු බව යි. රෝමයේ 13 වැනි ලියෝ පාප් වහන්සේ ද එම යෝජනාව පිළිගෙන අනුමත කළහ. මේ අනුව ඉතා අලංකාර ලෙස එහි ගොඩනැඟිලි ඉදිකෙරිණි.

මෙම දෙව්සත්හල විශ්ව විද්‍යාලයක් ලෙසද පිළිගැනුණි. මෙය රෝම සරසවියට අනුබද්ධ කොට දේව ධර්මය සහ දර්ශන ශාස්ත්‍රය යන ක්ෂේත්‍රයන් තුළ උපාධි පිරීමේ අවසරය ලබා ගත්තේ ය. එවකට මෙහි පරිපාලනය බාර වූයේ ජේසු නිකායේ පියවරුන් වෙත යි. මෙය දිවයිනේ ප්‍රථම සරසවිය ලෙස සැලැකේ.

මෙහි පූජක පුහුණුව ලද්දෝ ඉන්දියානුවෝ, පාකිස්ථාන හා බංගලිදේශිකයෝ වූහ. එ කල මේ සියල්ල එක ම උප මහාද්වීපයක් ලෙස ඉන්දියාව විය.

මේ අතර 60 දෙනකු රදගුරු හා අගරදගුරු තනතුරුවලට ද ඔසවන ලදි. ඉන්දියාවේ ප්‍රථම කාදිනල් හිමිපාණන් වන අති උතුම් වැලේරියන් ග්‍රේෂස් හිමිපාණන් කරාචියේ ජෝසප් කොර්ඩියේරෝ සහ අර්නාකුලම්හි ජෝසප් පරකට්ටිල් කාදිනල් හිමිවරු ද මෙහි ආදි සිසුවෝ වෙති.

ලංකාවෙන් මෙම දෙව්සත්හලට සිසුන් යවන ලද්දේ ගාල්ල, නුවර, ත්‍රිකුණාමලය සහ හලාවත රදගුරු වසම් තුළින් පමණි. සෙසු පූජක සිසුවෝ කොළඹ සා. බර්නාඩ් දෙව්සත්හලේ පුහුණුව ලදහ. නුවර පූජක සිසුන් සුදු ලෝගුවට රතු බඳ පටිය බැඳ සිටි හෙයින් පහසුවෙන් හඳුනාගත හැකි විය. නිමල මරිය නිකායේ පූජක සිසුන් පුහුණුව ලැබුවේ තමන් සඳහා ම කොහුවල ග්‍රීන් පාත් හි පිහිටි පුහුණු මධ්‍යස්ථානයේ ම ය.

ලංකාව, ඉන්දියාව, පාකිස්තානය ආදි දකුණු ආසියානු රටවල් දේශපාලන නිදහස ලැබීමත් සමඟ තත්ත්වය හාත්පසින් වෙනස් විය. මේ අතර ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ ලංකාවට ඉන්දියානුවන් ගේ පැමිණීම සීමා කිරීම යි. දකුණු ඉන්දියාවෙන් ලංකාවට රහසේ සංක්‍රමණය වන "කල්ලතෝනි" නමින් හඳුන්වනු ලැබූ පිරිස එ කල රටට විශාල ප්‍රශ්නයක් වී තිබිණි.

මේ නිසා වීසා බලපත්‍ර ලබා ගැනීම වැනි ප්‍රශ්න රැසකට මේ සිසු පිරිසට ද මුහුණ පාන්නට සිදුවිය. මේවා සලකා බලා දෙව්සත්හල ඉන්දියාවේ පූනා නගරයට ගෙන යන්නට තීරණය කරන ලදි. ඒ අනුව ක්‍රි.ව. 1955 මැයි මස අධ්‍යාපන වසර නිමවීමත් සමඟ පේපල් සෙමිනේරිය හෙවත් දෙව්සත්හල දිවයිනෙන් ඉවත් විය.

එහි සිටි ලාංකික සහෝදරතුමන්ලා ස්වල්ප දෙනෙක් පමණක් නව ලංකා අප ස්වාමිදූගේ ජාතික දෙව්සත්හලට ඇතුළුවනු සඳහා මෙහි රැඳී සිටියහ. එම ගරු සහෝදරතුමන් වූයේ ලූක් ජයසූරිය (ගාල්ල) පිලිප්නේරි ප්‍රනාන්දු, ලෙනාඩ් ද කොස්තා සහ පැන්ටලියන් ජයවර්ධන (හලාවත), ඩෙන්සිල් පෙරේරා (මහනුවර), ජෝසප් කොස්තා (ත්‍රිකුණාමලය) ය.

පේපල් සෙමිනේරිය ඉවත් කැර ගැනීම ආරම්භ වූයේ 1955 මැයි මස 23 වැනි දා ය. මැයි මස 21 සිට 23 වැනි දා දක්වා ජේසු නිකාය වෙනුවෙන් එවකට අධ්‍යක්ෂ තනතුර දැරූ ගරු ඇන්කොට් පියතුමා නි. ම. නිකායේ ප්‍රාදේශාධිපති ගරු ජෙරාඩ් ෆෝටයින් පියතුමන් වෙත සියල්ල බාර කළේය. ඉනික්බිති මැයි 23 වැනි දා දෙව්සත්හලේ සිටි සහෝදර තුමන් 120 දෙනා ම තම නිල ඇඳුම හෙවත් නිල් ලෝගුව සහ රතු පටියෙන් සැරසී නුවර දුම්රිය පොළට පැමිණියහ. මහනුවරින් ආරම්භ කළ දුම්රිය ගමන පොල්ගහවෙල හරහා තලේමන්නාරම දක්වා ගෙන ගියේ ය. එ කල ගමන් පිළිවෙල අනුව තලේමන්නාරම සිට දනුෂ්කොඩි දක්වා කුඩා යාත්‍රාවකින් ගමන් ගන්නට සිදුවිය. මෙය නිම කළ පිරිස යළි වරක් එහි සිට චෙන්නායි (මදුරාසිය) දක්වා ද එතැන් සිට පූනේ දක්වා ද දුම්රියෙන් ම ගමන් කළහ.

අවසානකොට පූනේ නගරයට මෙහි සිට සැතැපුම් 1275 ක් ගෙවා සම්ප්‍රාප්ත වූයේ පස් දවසකට පසු මැයි මස 28 වැනි දා ය. (ගරු ඇලෙක්ස් දසනායක පියතුමාගේ ලිපියක් ඇසුරෙන් ගමන පිළිබඳ දත්ත ලබා ගත් බව සලකන්න.

මෙතෙක් ජේසු නිකායේ පියවරුන් යටතේ පැවැති දෙව්සත්හල් පාලනය නිමල මරිය නිකායේ පියවරුන් වෙත පවරනු ලැබීමත් සමඟ ජේසු නිකායේ පාලන කාලය තුළ ශුද්ධවූ ෆ්‍රැන්සිස් සවියර් මුනිතුමන් ගේ නමින් එහි අලංකාර දෙව්මැඳුර කැප වී තිබුණ නමුත් එය නිමල මරිය නිකායේ පාලනයට බාරවීමත් සමඟ දිවයිනේ ජාතික දෙව්සත්හල බවට ද පත්වීමත් සමඟ "ලංකා අප ස්වාමිදූ" නමින් කැපකරන ලදි. නිල වශයෙන් ෆ්‍රැන්සිස් සවියර් මුනිතුමා ද එහි සම අනුග්‍රාහක මුනිවරයාණන් වන්නේ ය. මේ සඳහා පාප් වහන්සේගෙන් විශේෂ අවසරය ලබා ගත් බව අප අති උතුම් තෝමස් කුරේ කාදිනල් උතුමාණන් සඳහන් කළා මට මතක යි.

ක්‍රි.ව. 1955 මැයි මස මැද සිට සැප්තැම්බර මස දක්වා වූ කාලය තුළ නව දෙව්සත්හල ඇරැඹීමේ කටයුතු සූදානම් කෙරෙමින් තිබිණි. ඒ කාලය තුළ නි. ම. නිකාය වෙනුවෙන් බාරව සිටියේ ගරු රුවෙල් නි.ම.නි. පියතුමා සහ ගරු වික්ටර් විල්ෆ්‍රඩ් නි.ම.නි. සහෝදර තුමා ය.

**(ඉතිරි කොටස ලබන සතියේ)**

# ඉස්ලාමීය මූලධර්මවාදය පරාජය කිරීම සඳහා සමස්ත ලෝකයම ඒකරාශී විය යුතුය

**පසුගිය සතියෙන්**

**කිතුනු අපගේ කාර්යභාරය වන්නේ දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය තුළ ප්‍රේමයේ බලයෙන් ලෝකය පුරා පැතිර යමින් පවතින සෑම ආකාරයකම මූලධර්මවාදී ත්‍රස්තවාදය පරාජය කිරීමයි. ඒ සඳහා ත්‍රස්තවාදීන්ගේ ලේ පිපාසිත, ම්ලේච්ඡ, අහස පොළොව නුහුලන, තිරිසන් ක්‍රියාවන් දැඩිව, නිර්දය ලෙස සහ නිර්භීතව හෙලා දැකිය යුතු අතර ත්‍රස්තවාදීන්ට ආදරය කළ යුතු වේ.**

ත්‍රස්තවාදීන්ව පරාජය කිරීමේ අරගලයේදී අපත් ත්‍රස්තවාදීන් බවට පත්විය යුතු නොවේ. ලෝකයේ බොහෝ රටවල ත්‍රස්තවාදීන් පරාජය කිරීමේ අරගලයේදී ත්‍රස්තවාදී ක්‍රියාවල නියැලුනු බව සාධක සහිතව වාර්තාවුනු දෙයකි. ලංකාව තුළ ද එවැනි තත්ත්වයක් ඇති නොවුණා යයි කිව නොහැකිය. ත්‍රස්තවාදී ක්‍රියාවන් මඟින් ත්‍රස්තවාදීන්ට දීර්ඝකාලීන වශයෙන් පරාජය කළ නොහැකිය. ත්‍රස්තවාදී ක්‍රියාවන් වලින් ත්‍රස්තවාදය පරාජය කිරීමට උත්සාහ කිරීම ත්‍රස්තවාදීන්ව තව තවත් උල්පන්දම් දීමකි.

ත්‍රස්තවාදය පරාජය කිරීමට ඊට එරෙහිව සමස්ත ලෝකය පුරාම ජනමතයක් ගොඩනැගිය යුතුයි. එමෙන්ම ත්‍රස්තවාදය බිහිවීමට හේතු වූ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික, මනෝ විද්‍යාත්මක, ඓතිහාසික, ජාත්‍යන්තර, භූගෝලීය, මූල්‍යමය සහ ජනවාර්ගික හේතු වලට නිශ්චිත සහ ආධ්‍යාත්මික පිළියම් සෙවීමට සහ ඒවාට දායක වීමට සෑම ලෝක පුරවැසියෙක්ම කැප විය යුතු වේ.

ලෝකයේ ත්‍රස්තවාදි ව්‍යාපාර ඇති නොවන ආකාරයට අපි ජීවත් විය යුත්තෙමු. ජාතින් අතර දුප්පත් පොහොසත් පරතරය ඇති නොවන ආකාරයට, කිසිදු ජන කණ්ඩායමකට, ආගමික ජන කොටසකට, අයුක්තියක්, අසාධාරණයක්, කොන්වීමක්, හාස්‍යයට ලක් වීමක් සිදු නොවන ආකාරයට, කිසිදු මානව අයිතිවාසිකමක් අහිමි නොවන ආකාරයට කිසිදු ජන වාර්ගික කණ්ඩායමකට පීඩාවක් සිදු නොවන ආකාරයට ජීවත් විය යුත්තෙමු.

අප ජීවත් වන ආකාරයෙන් ලෝකයේ දැවෙන ප්‍රශ්න තවත් අවුල් කිරීමට අප දායක වී ඇත්නම් ඒ තත්ත්වය තේරුම් ගෙන අපි විසඳුමේ කොටසක් බවට පත් විය යුත්තෙමු. අපි සෑම මොහොතකම අන්‍යයන්ට ආශිර්වාදයක්, ආදර්ශයක් සහ ආශ්වාදයක් ලෙස ජීවත් විය යුත්තෙමු. ත්‍රස්තවාදීන් මානව වර්ගයාට ආදරය නොකරති. ත්‍රස්තවාදීන් මානව සංහතියේ සතුරන් ය.

සමස්ත මානව සංහතියට යහපත් අනාගතයක් අවශ්‍ය නම්, සෑම ආකාරයකම ත්‍රස්තවාදයන් තීරණාත්මකව පරාජය කළ යුතු වේ. නමුත් ඒ සඳහා අවසාන වශයෙන් යුදමය ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට සිදුවේ නම්, එය කළ යුතු වන්නේ ශා. අගුස්තීනු තුමා, ශාන්ත තෝමස් ඇක්වයිනස් තුමා යනාදීන් විසින් සංකල්ප ගත කරන ලද "සාධාරණ යුද්ධ නියාමයට" (Bellum Iustum = Just War) අනුවය. එමගින් අහිංසක පුද්ගලයන්ට අසාධාරණයක් සිදු නොවේ. එහි පරමාර්ථය කාටවත් අසාධාරණයක් හෝ හිංසාවක් හෝ කිරීම නොව, සිදුවෙමින් පවතින විනාශකාරී ක්‍රියාවක් නවතාලීමය. ඒ තුළින් සෑම දෙනාටම සාධාරණය ඉටු කිරීමය.

ඉස්ලාමීය ත්‍රස්තවාදය පරාජය කළ යුත්තේ අපගේ මුස්ලිම් සහෝදර සහෝදරියන්ට තිබෙන සැබෑ ආදරය සහ කැක්කුම නිසාය. ඉස්ලාමීය ත්‍රස්තවාදය පරාජය කිරීම මුස්ලිම් විරෝධී ක්‍රියාවක් නොව ඉස්ලාම් දහම ආරක්ෂා කරන ක්‍රියාවකි.

ඉස්ලාම් දහම සැබවින්ම විනාශයට පත් කරමින් සිටින්නේ වෙන කිසිදු බලවේග යක් නොව ඉස්ලාමීය ත්‍රස්තවාදීන් විසින්ම ය. හේතුව අහිංසක නිරායුධ මිනිසුන්ව ඝාතනය කිරීමට දහමක්, ධර්මයක් ආගමක් අවශ්‍ය නැති වීමයි. ඕනෑම තිරිසනෙකුට එය කළ හැකිය. අහිංසක මිනිසුන්ව ඝාතනය කරන්නා කිසිදු දහමක්, ආගමක්, ධර්මයක්, ආධ්‍යාත්මික මාර්ගයක් අනුගමනය කරන්නෙක් නොව, යක්ෂාවේශ වූ ම්ලේච්ඡයකි. කුරිරු වනචාරියෙකි. තිරිසනෙකි. බාගෙට පරිනාමණය වූවෙකි. එවැන්නෙක් කිසිසේත්ම ඉස්ලාම් භක්තිකයකු විය නොහැකිය.

එම නිසා කිතුනුවන් ලෙස අපට කළ හැකි එක දෙයක් නම් මෙම ම්ලේච්ඡ ත්‍රස්තවාදීන්ගේ සිත් හැරී ඔවුන් සැබෑ ඉස්ලාම් දහම හඳුනාගෙන එය වැළඳ ගැනීමට මාර්ග යක් සැලසෙන මෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා යාච්ඤා කිරීමයි. එමෙන්ම සැබෑ මුස්ලිම්වරයකු වීම සඳහා කිතුනු දහමෙන් විශාල ආභාෂයක් ලබා ගත හැකිය.

✍ **මහාචාර්ය ඇන්ටන් මීමන**



## මාසික ආර්ථික විමසුම

# ශ්‍රී ලංකාවේ සංවර්ධනයට චීන සහයෝගිතාව

ඉදිරිපත් කිරීම ප්‍රවීන ආර්ථික විශ්ලේෂක **වින්සන් මර්වින් ප්‍රනාන්දු**

**ශ්‍රී ලංකාවේ වේගවත් ආර්ථික සංවර්ධනයට මෑතක සිට චීනයෙන් ලැබෙන සහයෝගිතාව විමසුමට ලක් කිරීම කාලෝචිතය යයි අපි සිතමු. එම සහයෝගිතාව තිව්‍ර කරමින් මහජන චීන සමුහාණ්ඩුවේ ජනාධිපති ශී ජින් පිං (XI JINPING) මැතිඳුන්ට ශ්‍රී ලංකාවට සැපැමිණීමද සිදුවිය. එක් කාලයක දී එනම් 1978 විවෘත ආර්ථිකය ක්‍රියාත්මක වීමත් සමග එවක සිටි පාලකයින් ශ්‍රී ලංකාව සිංගප්පූරුවක් කළ යුතු යයි ප්‍රකාශ කළේය.**

එහෙත් යටත් විජිත වාදයෙන් 1948 දී අපට උරුම වූ විවෘත ආර්ථිකය සමග එවක ලංකාවේ දියුණුව ගැන ඇසු සිංගප්පූරු අගමැති ලී ක්වාන් යු ප්‍රකාශ කර ඇත්තේ සිංගප්පූරුව ශ්‍රී ලංකාවක් කළ යුතුය කියාය. දෛවයේ සරදමක් නිසාදෝ ලංකාවේ ඒ කාලයේ තිව්‍ර සෞභාග්‍යය 1950 දශකයේ අගභාගයේ හඳුන්වා දුන් ආවෘත ආර්ථික ප්‍රතිපත්තිය විනාශ වන්නට විය. "සිය රට දේ සිරි සැපදේ" කියා ආරම්භ කළ එම ප්‍රතිපත්තිය අවසානයේ නතර වූයේ 'සිය රට දේ හරිම වදේ" කියාය. එහි ආදිනව තේරුම් ගිය නිසාදෝ 1977 අග භාගයේ බලයට පත් එක්සත් ජාතික පක්ෂ රජය ශ්‍රී ලංකාවට යළිත් විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් රට ඉදිරියට ගෙන යෑමේ ක්‍රියාවලිය ආරම්භ කළේය. ඒ කාලයේ ශ්‍රී ලංකාවේ දියුණුවට අත දුන්නේ බටහිර රටවල් ය. ඇමරිකාව හා යුරෝපය එහිලා ප්‍රමුඛ විය. එම ආධාර ලබාගෙන ශ්‍රී ලංකාව ඉහළ සෞභාග්‍යයක් කරා යෑමේ ගමන අඩපණ වූයේ අද සිරගත වී සිටින ජය ලලිතා ප්‍රමුඛ තමිල්නාඩුවේ බලපෑම් පිට ශ්‍රී ලංකාව තුළ 'ඊළම්' බිහිකිරීමට මෙරට කොටි ත්‍රස්තවාදින් මෙහෙය වු දැවන්ත යුද්ධමය තත්ත්වයන් නිසාය. මේ කරුණේදී ඉන්දියාව ද අපට එරෙහිව ක්‍රියා කළේ ශ්‍රී ලංකාව බටහිර රටවල ආධාර ලබාගෙන විශාල වශයෙන් ඉදිරියට ගොස් ඉන්දියාවට තර්ජනයක්



එල්ල වීමට ඉඩක් මතු වෙමින් පැවැති නිසාය. කෙසේ වුවද 2005 බලයට පත් මහින්ද රාජපක්ෂ ජනපති තුමා 2009 වන විට කොටි ත්‍රස්තවාදි යුද්ධය මුළු මනින්ම නවතා දමා රට ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන යෑමට දරන උත්සහයේදී දෙමළ ඩයස් පෝරාවේ බලපෑම් පිට මෙන්ම ගෝලීය මූල්‍ය ආර්ථික අර්බුද හමුවේ බටහිර ලෝකය අපට උරණ විය. යුද්ධයේදී අප හැසුරුණු ආකාරය ගැන ප්‍රශ්න කරන්නට විය. මේ අනුව බටහිර උදව් උපකාර අඩපණ විය. ඉන්දියාවේද සහය නොලැබිණ. මේ තත්ත්වය හමුවේ අපේ පිහිටට ආවේ චීනය යි; එය අපට ලොකු ශක්තියක් වූයේ චීනය ඒ වන විට ලෝකයේ දෙවැනි බලවතා තත්ත්වයට පත් ව තිබූ නිසාය.

චීනය හා ශ්‍රී ලංකාව අතර සබඳතාවලට මුල පිරුණේ අද ඊයේ නොවේ. 1952 ශ්‍රී ලංකාව තම රබර් වලට චීනයේ සහල් හුවමාරු කර ගැනීමට 'සහල් - රබර් ගිවිසුම' අස්සන් කිරීම 1973 BMICH සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම දක්වා එය දිව යන්නේය. එහෙත් මෑත කාලය වන තුරු චීනය හා ශ්‍රී ලංකාව අතර සැලකිය යුතු ආකාරයේ සහයෝගිතාවක් රටේ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් වාර්තා වූයේ නැත. 1971 - 2004 දක්වා වසර 23 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා චීනයේ දායකත්වය වූයේ ඩොලර් මිලියන 351 කි. එහෙත් 2005-2013 දක්වා වසර 8 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට චීනයේ දායකත්වය ඩොලර් 5664 ක් විය. 2014 ඔක්තෝබර් දක්වා වු පසුගිය වසර 9 ක කාලය තුළ දි චීනයෙන් ලද ණය අරමුදල් නිසා අපට අලුත් වරායක් ඇති විය. අලුත් ගුවන් තොටුපලක් ඇතිවිය. විදුලිබලාගාර ඇති විය. අධිවේගි මාර්ග බිහිවිය. වාරිමාර්ග ඉදිවිය. මුහුද ගොඩ කිරීමෙන් කොළඹ නගරයට අතිරේක ඉඩම් ප්‍රමානයක් එක් කරමින් ශ්‍රී ලංකාවේ භූමි වර්ගඵලය තවත් සුවිශාල කරන කොළඹ 'PORT CITY' ව්‍යාපෘතිය බිහිවිය. මෙය මෙතෙක් අප රටේ සිදුවන සුවිශාලතම සෘජු විදේශ ආයෝජන සංවර්ධන ව්‍යාපෘතිය ද වන්නේය මේ හරහා මුහුදෙන් ගොඩකරන සමස්ත භූමි ප්‍රදේශය හෙක්ටයාර් 233 කට නො අඩුය. මෙයින් හෙක්ටයාර් 170 ක් සංවර්ධනය කළ හැකි ඉඩම්ය. ඉතිරි 63 පොදු පහසුකම් ලෙස ජල තීරුව මාවත් හා උද්‍යාන වෙනුවෙන් වෙන් කෙරේ. මේ ව්‍යාපෘතිය නිම වීමෙන් පසු ශ්‍රී ලංකාවේ සිතියමද වෙනස් වන බව පැවසේ. මේ සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 1.4 ක විදේශ ආයෝජන ලැබේ. සියළුම වැඩකටයුතු නිම වීමට වසර 8 ක් ගත වන බවද පැවසේ.

ශ්‍රී ලංකාවට චීනයෙන් වාර්ෂිකව ඇමරිකන් ඩොලර් මිලියන 800-1000 ත් අතර ප්‍රමාණයක මූල්‍යාධාර ලැබේ. මෙයින් මිලියන 600 ක් පමණ යෙදැවනුයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ය. ශ්‍රී ලංකා රජයට චීන ආධාර ලැබෙන ක්‍රම කිහිපයකි, එය මෙසේ දක්වමු.

| | |
|---|---|
| **චීන ආනයන අපනයන** (EXIM) **බැංකුවෙන්** | **77%** |
| **චීන සංවර්ධන බැංකුවෙන්** | **14%** |
| **චීන කාර්මික හා වානිජ බැංකුවෙන්** | **1%** |
| **චීන රජයෙන් පොළී රහිත ණය** | **5%** |
| **පරිත්‍යාග** | **3%** |

2013 - 2014 වසර සඳහා පමණක් චීනයෙන් ලද මුළු මුදල ඩොලර් මිලියන 3300 කි. මේ මුදල්වලින් සිදුකිරීමට නියමිත ව්‍යාපෘති කිහිපයක් පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ කඩවත - කෙරවලපිටිය මාර්ග කොටස, ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය කුරුණෑගල ජල සම්පාදන හා සනිපාරක්ෂක ව්‍යාපෘතිය හම්බන්තොට ජාත්‍යන්තර කේන්ද්‍රස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය, මත්තල ගුවන් තොටුපලේ යටිතල පහසුකම් සංවර්ධනය, දක්ෂිණ ප්‍රදේශවල මහ මාර්ග ප්‍රතිසංස්කරණය මොරටු විශ්ව විද්‍යාලයේ තාක්ෂණ විද්‍යායතනය සංවර්ධනය කිරීම.

දක්ෂිණ අධිවේගි මාර්ගය මාතර සිට මත්තලට දීර්ඝ කිරීම එම ව්‍යාපෘති අතර වේ. මේ දක්වා ලැබුණු ආධාර වෙන් වූයේ පහත දැක්වෙන ආකාරයටය.

මාර්ග හා ප්‍රවාහන 34%
විදුලිබල හා බලශක්ති 30%
වරායට 26%
ගුවන් තොටුපල සඳහා 4%
වාරිමාර්ගවලට 4%
විදුලි සංදේශ 2%

චීන ආධාර ඇතිව ශ්‍රී ලංකාවේ සිදුවන මේ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති හරහා කෙරෙන සංවර්ධනයට දැඩි විවේචන ද තිබේ. වරායක් හැදුවත් නැව් එන්නේ නැත. ගවන් තොටුපලක් හැදුවත් ගුවන් යානා එන්නේ නැත. විදුලිබලාගාර නිතරම අඩපණ වෙනවාය යන්න එම චෝදනා අතර ප්‍රමුඛවේ. එහෙත් මුල් කාලයේ එසේ විවේචනය කළ අය අද වන විට මේ රජයේ ම මහ ඇමැතිවරු බවට පත්ව තිබේ. තවත් අය එසේ කියන්නේ එවැනි තනතුරු ලබා ගන්න දැයි කෙනකුට ඒ නිසා සැක මතුවේ. කෙසේ වුවද නිදහස ලැබුනු කාලයේ සිට බලයට පත් වූ රජයන්ට මේවා ඉතා අඩු වියදමකින් ඒ කාලයේ කරන්නට ඉඩ ප්‍රස්ථා තිබුනි. ඒ කාලයේ ශ්‍රී ලංකාවට රට සල්ලිවලද හිඟයක් නො තිබුනි. නිදහසින් පසු වසර 60 ක් යන තුරුත් අධිවේගි මාර්ගයක් නැතිව සිටි ලෝකයේ රටවල් අතලොස්සේ ශ්‍රී ලංකාව ද විය. ඇත්තවශයෙන්ම රටක් සංවර්ධනය වන විට අවශ්‍ය වන මේ ව්‍යාපෘති කඩි මුඩියේ සකස් කරන්නට ද නොහැකිය. ඒ අනුව මේ ව්‍යාපෘතිවල පල නෙලන්නේ වත්මන් පරපුර නොව අනාගත පරපුර යයි අපට සිතේ.

සාමාන්‍ය ජනයා කියන්නේ යුද්ධය නවතා දමා රට සංවර්ධනය කිරීමට රජය ඉදිරිපත් වීම හොඳ දෙයක් වූවත්, තමන්ට එදිනෙදා ජීවත් වීමට ජීවන බර අඩුකර දීමද රජයේ යුතුකම බවය. ළඟ ළඟ එන ජනාධිපතිවරණය නිසා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ දැන් දැන් දවස ගානේම අඩුවන විවිධ බඩු මිල ගණන් (විදුලි බිල අඩුවීම. ගෑස් මිල අඩුවීම) හා 2015 අයවැය හරහා ලබාදෙන සහන මල්ල හමුවේ ජනයා රජය කෙරෙහි දක්වන එම වැරදි ආකල්පයද වෙනස්වන තත්ත්වයක් ඇති වේදෝයි කියන්නට තවම කල් මදිය.

# හතලිස් වසර පිරි මරිය වන්දනය පිළිබඳ එඩේරිය උපදේශනය

පසුගිය සතියෙන්.....

**මරිය වන්දනය එඩේරිය උපදේශනයෙහි මෙම දෙවන කොටස ඉතාම වැදගත් කොටස ලෙස හෝ මෙතෙක් සඳහන් කළ සියල්ල කැටිකොට දක්වන කොටස ලෙස සලකා ඇති බවක් පෙනෙයි. මෙමගින් වත්මන් කාලයට ගැළපෙන සේ නැවත සකස් විය යුතු හා දේව වන්දනාත්මක නොවුවත් සැබවින්ම මරියතුමිය වෙත පිදෙන භක්ති අභ්‍යාසයන් වැඩි දියුණු කිරීම ගැන සඳහන් කරයි.**

කෙසේ වුවද ඉහත කී භක්ති අභ්‍යාසයන් නැවත සකස් කිරීමේදී දේව ධර්මීය සංකල්පයන් වෙත සිත් යොමු කිරීමත් සම්ප්‍රදායන් ගරු කිරීමත් අවශ්‍ය කරුණකි. එසේ කිරීමට සැබවින්ම සැබෑ ශක්තියක් හා ධෛර්යයක් තිබිය යුතුය. (24, 28, 40) භක්ති අභ්‍යාසයන් නවීකරණය කිරීම ගැන ද කරුණු දෙකක් මරිය වන්දනයෙහි දක්වා ඇත. පළමුවැන්න දේව ධර්මිය සිද්ධාන්ත වෙත සිත් යොමු කිරීමයි. (25, 28) දෙවැන්න මගින් නවීකරණය කිරීමේදී යොදා ගත හැකි ප්‍රායෝගික උපදෙස් යෝජනා කරයි.

### දේව ධාර්මිය සිද්ධාන්ත

මරිය තුමිය හා සම්බන්ධ යාච්ඤා නවීකරණය කිරිමේදී හෝ නැවත සකස් කිරීමේදී ඒවාටම සම්බන්ධ ත්‍රිත්වියෙක, ක්‍රිස්තුවේදීය සහ ශාසනීය සංකල්පයන් පිළිබිඹු විය යුතුය. සභාවේ වන්දනාවේදී ක්‍රිස්තුන් වහන්සේ මගින් ශුද්ධාත්මයාණන් තුළ පියාණන් වහන්සේ වෙත යොමුවන්නකි. මේ හේතුව නිසා සභාවේ වන්දනාවට වෙනස් ආකාරයකින් හෝ පාස්කු අභිරහසට සම්බන්ධ මරියතුමියවත් ඇතුළත් කළ යුතුය. මරියතුමිය ගැන කියන කරන සියල්ලට ක්‍රිස්තුන් වහන්සේ හා සමග ද සම්බන්ධයක් ඇත.

මන්දයත් අනාදිමත් කාලයක සිට එතුමියව තෝරාගනු ලැබුයේ මෙම දේව මාතෘත්වය සඳහාම වන හෙයිනි. (25) මේ නිසා මරියතුමිය වෙනුවෙන් කරන ඕනෑම භක්ති අභ්‍යාසයක් අනිවාර්යයෙන්ම ක්‍රිස්තුවේදීයද වෙයි. මරියතුමිය හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති මෙම සම්බන්ධය නිසා මරියතුමියට පුද කෙරෙන ඕනෑම භක්ති අභ්‍යාසයක් ක්‍රිස්තුන් වහන්සේ වෙත වූ භක්තිය ද ශක්තිමත් කරයි. "මවට දෙන ඕනෑම දෙයක් පුතුටද හිමිවෙයි." (25)

මරිය බැතිය ක්‍රිස්තුවේදීය වීමේදී ශුද්ධාත්මයාණන්ද සැලකිල්ලට ගත යුතු වෙයි. මන්දයත් ඉතිහාසයේ වැදගත්ම වූ සිද්ධියක් මරියතුමිය තුළ සිදුවන්නේ ශුද්ධාත්මයාණන් කරණ කොට ගෙන වන හෙයිනි. මරියතුමිය සහ ශුද්ධාත්මයාණන් අතර වූ මෙම සමීප සම්බන්ධය දැඩි ලෙස හුවා දක්වන මරිය වන්දනය ඒඩේරිය උපදේශනය ගැළවීමේ ඉතිහාසය තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය පිළිබඳ ගැඹුරු දැක්මකට ආරාධනය කරයි. ශුද්ධ වු සභාව සහ මරිය තුමිය අතර ඇති කිට්ටු සම්බන්ධතාවය දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් ගෙන හැර දක්වන අතර නිසියාකාර මරිය වන්දනයක් සඳහා මෙය අත්‍යවශ්‍ය වෙයි.

### ප්‍රායෝගික මග පෙන්වීම්

මරියතුමිය වෙත දක්වන භක්තිය නිසි මගට ගැනීම පිණිස මරිය වන්දනය එඩේරිය උපදේශනය මගින් ශුද්ධෝත්තම පියාණන් බොහෝ දේ යෝජනා කරයි. එතුමාණෝ මෙය කොටස් හතරක් යටතේ සාකච්ඡා කරයි. ඒවානම්, බයිබලීය, දේව වන්දනාත්මක සභා එකමුතුව හා මානවීය වශයෙනි.

මෙහිදී මරියතුමියට පිදෙන යාච්ඤා සහ ගායනා ශුද්ධ ලියවිල්ලේ ආනුභාවය අනුව සිදුවිය යුතු බව කියැවෙයි. මරියතුමියට පිදෙන භක්තිය ක්‍රිස්තියානි පණිවුඩය ගෙනහැර පාන්නක් විය යුතු බවද සඳහන් කර ඇත. (30)

දේව වන්දනාවෙන් ආනුභාවය ලැබීමට හා දේව වන්දනාව කරා යොමු වීම් වස් දේව වන්දනාත්මක නොවන භක්ති අභ්‍යාසයන් පවා දේව වන්දනාව සමග අනුරූප විය යුතු බව දේව වන්දනාව පිළිබඳ වතිකාන ප්‍රකාශනයෙහි අංක 13 හි සඳහන් වෙයි. මේ සම්බන්ධයෙන් ශුද්ධෝත්තම පියතුමා කරුණු දෙකක් දක්වමින් අනතුරු හඟවයි. පළමුවැන්න නම්, දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ස්ප්‍රිතුව අනුගමනය කරමින් කිසිදු භක්ති අභ්‍යාසයක් හෙලා නොදකින ලෙස පැවසීමයි.

දෙවැන්න නම්, දේව වන්දනාත්මක වතාවත් පුද්ගලික භක්ති අභ්‍යාසයන් හා මුසුකර නොගැනීම හා විශේෂයෙන් ඒවා දිව්‍ය යාගය සමග සම්බන්ධ කර නොගැනීමය. මන්දයත් එවිට මුළු සමුහය දෙවියන්ට පුදන වන්දනාව මස්තකප්‍රාප්තිය කරා එළඹීම වෙනුවට, ඒවා භක්තිමත් ක්‍රියාවන් බවට පමණක් පත්වීමට ඉඩ ඇති හෙයිනි. සභා එකමුතුව ගැන කථා කිරීමේදී මෑත කාලයේදී මරියතුමිය සම්බන්ධයෙන් කෙරෙන අධ්‍යයනයන් හා වෙනත් කිතුනු සභා අතර මරිය බැතිය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ප්‍රබෝධය ගැන ද ශුද්ධෝත්තම පියතුමා සඳහන් කරයි. මේ නිසා මරිය තුමිය වෙත පිදෙන භක්ති ප්‍රණාමයේදි පමණ ඉක්මවා යන යම් යම් වතාව ගෙන් වැළකී සිටීමටත් එසේ කිරීමෙන් අන් ක්‍රිස්තියානි සභාවන්ට අයත් සැදැහැවතුන්ට සභාවේ සැබෑ මරිය බැතිය සම්බන්ධයෙන් වැරදි වැටහීමක් ඇතිකර ගැනීමට ඉඩ නොතබන ලෙසත් ශුද්ධෝත්තම පියතුමා අවවාද කරයි. (32).

**ලබන සතියට...**

දොමිනිකාන නිකායික
**ගරු ජයලත් බලගල්ල පියතුමා**

දැල්වෙන පහන්

# හා. ජුසේවාස් තුමන් සුදුවරයට එසවීමට මඟ පෑදු ශාස්ත්‍රීය ග්‍රන්ථයේ නිර්මාපකයාණෝ

**ශ්‍රී ලංකාවේ අපෝස්තුලුවරයා ලෙස විරුදාවලි ලද ජුසේ වාස් පියතුමන් ශුද්ධවරයට ඔසවාලීමේ අභිලාෂය ශ්‍රී ලාංකික කිතුනුවන් හට ප්‍රකාශ කර, එම භාරදූර කර්තව්‍යය සඳහා දේවාශිර්වාදය ඉල්ලා යදින ලෙස ඔවුන්ගෙන් ඉල්ලා ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය 1911 දී ලිපියක් නිකුත් කිරීමේ සිට ගතවූ සියවසකට වැඩි කාලය තුළ මෙරට කිතුනු ජනතාවගේ බලාපොරොත්තුව ඉටුවීමේ ඓතිහාසික මොහොත ළඟාවී ඇත.**

එම ආනන්දජනක අවස්ථාව උදාවීමට පාදක වූ හා ප්‍රධානතම සාධකය වූ ජුසේ වාස් පියතුමන් හා උන්වහන්සේගේ ශ්‍රී ලංකාවේ දූත මෙහෙවර පිළිබඳ සියළු තොරතුරු ඇතුලත් පර්යේෂණ ග්‍රන්ථය (POSITIO) සම්පාදනය කළ ගරු ජෝ. ක්වින්ටස් පෙරේරා පියතුමා ශ්‍රී ලංකා කිතුනු ජනතාවගේ ගෞරවයට හා ස්තුතියට පාත්‍ර විය යුතු විද්වතෙකි. මෙම ලිපිය එතුමන් පිළිබඳ මතක සටහනකි.

ජයසූරිය අලංකාරගේ පේදුරු අලෙන්සු පෙරේරා, අන්තෝනි මරියා ප්‍රනාන්දු යුවළට දාව ජෝර්ජ් ක්වින්ටස් දරුවා 1915 පෙබරවාරි 02 වැනි දින හලාවතදී උපත ලැබීය. හලාවත සාන්ත මරියා පිරිමි පාසලේ ප්‍රාථමික අධ්‍යාපනය ලද ඔහු ද්විතීය අධ්‍යාපනය ලද්දේ කොළඹ ශාන්ත ජෝශප් විදුහලේය. එම විදුහලේ දක්ෂතම සිසුන් අතර ගැණුනු ඔහු විදුහලේ පැසිපන්දු හා ක්‍රිකට් කණ්ඩායම්වල දීප්තිමත් ක්‍රීඩකයකු ද විය. 1933 දී ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගයෙන් මෙරට පළමුවැනියා ලෙස සමත්වූ ක්වින්ටස් පෙරේරා සිසුවා කොළඹ යුනිවර්සිටි කොලීජියට ඇතුළුව මෙරට විශ්ව විද්‍යාල නොවූ එම අවධියේ සිසුන් පෙනී සිටියේ ලන්ඩන් විශ්ව විද්‍යාලයයේ විභාගවලටය. 1936 වසරේදී මෙම තරුණයා එම විශ්ව විද්‍යාලයයෙන් අපරදිග භාෂා (ලතින් සහ ග්‍රීක්) සඳහා ශාස්ත්‍රවේදී උපාධිය දිනාගත්තේය.

අනතුරුව එතුමා දේව කැඳවීමට හිස නමමින් කොළඹ දෙව්සත්හලට ඇතුළු වූයේ රාජ්‍ය



**ගරු ජෝ. ක්වින්ටස් පෙරේරා පියතුමා**

සේවාව තුළ විවර වූ රැකියා අවස්ථා ඉවත ලමිනි. මඳ කලකින් සභා පාලකයන් විසින් රෝමයට යවන ලදුව ක්වින්ටස් පෙරේරා පූජක සිසුවා වතිකානයේ විශ්වාසය වර්ධනය පිළිබඳ ආයතනයට ඇතුළු විය. එහිදී දේවධර්මය හා දර්ශනවාදය සඳහා ආවසරිතය ලැබීමෙන් පසු 1942 දෙසැම්බර් 20 වැනි දින කාර්දිනල් ප්‍රමසෝනි බියොන්ඩි හිමිපාණන් අතින් එතුමා පූජක වරම් ලද්දේය. එදින තවත් සුවිශේෂි කාර්යයක් සිදුවිය. 12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් පිළිබඳව වතිකාන ගුවන් විදුලියෙන් පළමුවරට සම්පාදිත සිංහල වැඩ සටහනක් ක්වින්ටස් පෙරේරා පියතුමාගේ කට හඬින් ලංකා ගුවන් විදුලි සේවය ඔස්සේ මෙරට ප්‍රචාරය විය. වතිකානයේ සිට ශ්‍රී ලාංකිකයින් සිංහලෙන් ඇමතූ පළමුවැන්නා එතුමා විය.

මේ වනවිට දෙවන ලෝක මහා සංග්‍රාමය පැවති හෙයින් එතුමා තම පූජක සගයන් වූ ගරු දියෝගු පිල්ලේ (පසුව යාපනයේ රදගුරු), ඉග්නේෂස් පෙරේරා, මර්වින් වීරක්කොඩි හා කරුණාකර් පියවරුන් සමඟ බ්‍රිතාන්‍ය හමුදාවේ යුද නැවකින් ඉතාලියේ සිට පැමිණ 1945 පෙබරවාරි 07 වන දින ශ්‍රී ලංකාවට ළඟා වී ඇත. ඒ සමගම පෙබරවාරි 26 වැනි දින එතුමා මාරවිල සාන්ත සේවියර් විදුහලේ විදුහල්පති ලෙස වැඩ භාරගත්තේය. මෙම වකවානුව වනවිට කන්නන්ගර මැතිතුමන් නිදහස් අධ්‍යාපනය මෙරට ආරම්භකර සිංහල භාෂාවේ පුනරුදය වෙනුවෙන් කටයුතු කරමින් සිටියේය. සිංහල රාජ්‍යය භාෂාව කරන ලෙසද ශ්‍රී ලාංකීක දරුවන්ට සිය මව්බසින් විද්‍යාව උගන්වන ලෙසද ඉල්ලමින් ගොඩනැගී තිබූ ස්වභාෂා ව්‍යාපාරයට එක්වූ ක්වින්ටස් පෙරේරා පියතුමා බඹරන්දේ සිරිසීවලී හිමි, කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි, මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්, මහාචාර්ය ගුණපාල මලලසේකර, මහාචාර්ය එම්.බී.ආරියපාල ආදී සම්භාව්‍ය විද්වතුන් සමඟ ව්‍යාපාරයේ පතාක යෝධයකු විය.

1947 අප්‍රියෙල් 19 වැනි දින පියතුමා මාදම්පේ සාන්ත සෙබස්තියන් විදුහලේ විදුහල්පති තනතුරට පත්කරනු ලැබීය. සිසුන් සුළු සංඛ්‍යාවක් සිටි ගම්බද පාසලක තත්ත්වයේ පැවති එම විදුහලේ නව දෙමහල් ගොඩනැගිලි ඉදිකිරීමටද, විදුහල හලාවත ප්‍රදේශයේ උසස් අධ්‍යාපන මට්ටමකින් යුත් සිප් හලක් කිරීමටද ගම්වාසීන් හා විදුහලේ ආචාර්ය මණ්ඩලය හා එක්ව එතුමා දැඩිව වෙහෙස විය. ඒ අතරම උසස් අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා ''විදු රැස'' නමින් ත්‍රෛමාසික සඟරාවක් ද එතුමා ආරම්භ කළේය. එම සඟරාවට ලිපි සැපයුවන් අතර මාර්ටින් වික්‍රමසිංහ, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, මහාචාර්ය ගුණපාල මලලසේකර ආදී එවක මෙරට සිටි විද්වත් ලේඛකයින් විය.

1957 අගෝස්තු 06 වැනි දින පුත්තලමේ සාන්ත ඇන්ඩෘ විදුහලේ විදුහල්පති ලෙස ක්වින්ටස් පෙරේරා පියතුමා වැඩ භාරගත්තේ නගරයේ සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර විරසකයන් ඇති වී උණුසුම් වූ වාතාවරණයක් මධ්‍යයේ ය. එහෙත් වැඩිකල් නොයා සිංහල මුස්ලිම් සමගිය යළි තහවුරු කළ එතුමාට මුස්ලිම් ජනනායකයින්ගේ ප්‍රසාදය හා ගෞරවය හිමිවිය. විදුහලේ කුදු මහත් රාජකාරි අතරම 1959 දී පියතුමා දෙවනවරට ශාස්ත්‍රවේ දී උපාධිය (ගෞරව) දිනාගත්තේ පෙරදිග භාෂා (සිංහල, පාලි සහ සංස්කෘත) සඳහාය.

1963 වසරේදී ක්වින්ටස් පෙරේරා පියතුමා ශුද්ධ ලියවිලි හැදෑරීම හා ශුද්ධ බයිබලය සිංහලයට පරිවර්තනය කිරීමේ කාර්යය සඳහා යළි රෝමයට ගියේය. වසර තුනකටද අඩු කාලයක දී ශුද්ධ ලියවිලි පර්යේෂණය කර ආවසරිතය දිනාගත් එතුමා යළි ශ්‍රී ලංකාවට ළඟාවුවද සභා සේවාවන්ගෙන් තරමක් ඈත්ව නිහඬ ජීවිතයක් ගත කිරීමට පෙළඹුනේය. එම නිහඬ සමය තුළ පෙර අපර දෙදිග භාෂා රාශියක් ඉගෙනීමට එතුමා කටයුතු කළේය. ඒ අතරම කොළඹ නීති විද්‍යාලයට එක්වී නීතිය හදාරා 1972 දී නීති උපාධිය (LLB) ලැබීය. එතුමා සමඟ නීතිවරය ලැබූ සෙසු පිරිස එච්.එන්.ජී.ප්‍රනාන්දු අගවිනිසුරුතුමන් හමුවෙහි ඉංග්‍රීසි බසින් දිවුරුම් දෙද්දී පූජක ඇඳුමෙන් සැරසී සිටි එතුමා දිවුරුම් දී ඇත්තේ සිංහලයෙනි. නීතිය හදාරන අතරම දෙමටගොඩ සාන්ත මැතිව් විදුහලේ උප විදුහල්පති ලෙසද කළුබෝවිල මහා විද්‍යාලයේ විදුහල්පති ලෙසද එතුමා සේවය කර ඇත. නීතිඥයකු ලෙස දිවුරුම් දීමෙන් පසුව නීතිඥ සමාගමකට එක්වී කොළඹ අළුත්කඩේ නීතිඥ වෘත්තියේ ද ගරු ක්වින්ටස් පෙරේරා පියතුමා යෙදී සිට ඇත.

දිගින් දිගටම විවිධ භාෂා ඉගෙනීමටද පුවත් පත් හා වාර සඟරාවලට ද කාලය වෙන්කළ එසමයෙහි එතුමාගේ ලිපි විද්වතුන් අතර සංවාදයට භාජනය විය. මෙරට සිටි විද්වත් බෞද්ධ භික්ෂූන් රාශියකගේ සමීපතම මිතුරකුව සිටි පියතුමා පාලි භාෂාව උගෙන ඇත්තේ පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගෙනි.

15 වන පිටුවට... »

**ලිඩ්වින් කිරිඇල්දෙණිය**

# මෙල්බන් නුවර සුරදූතික නිකායේ සේවයට පනස් වසරක් පිරෙයි

**ශ්‍රී ලාංකික සම්භවයක් ඇති සුරදූතික නිකායේ පැවිදි සොහොයුරියන්, ඕස්ට්‍රේලියාව තුළ ඕස්ට්‍රේලියානුවන්ට, ශ්‍රී ලාංකිකයින්ට සහ අනිකුත් ජනවාර්ගිකයින්ට සිදුකළ මහගු සේවයට වසර 50 ක් සපිරි ඇත. සම්ප්‍රදායික ඉගැන්වීම අනුව දෙවිඳුන් තෝරාගන්නේ සහ යොදාගන්නේ දෙවියන් වහන්සේගේ විශේෂ රාජදූතයින් ලෙසයි. ඉගිලීමට තටු නොතිබුනත්, දෙවියන් වහන්සේගේ අභිරහස් පණිවුඩ කරුවන් ලෙස සුරදූතික පැවිදි සොහොයුරියන්, අද පවතින වානිජ සමාජය තුළ අසරණවී සිටින වරප්‍රසාදයන් නොලත් සැමට දයාව සහ අස්වැසීම දෙමින් දූතගමනක යෙදෙමින් සිටියි. භෞමික සීමා, ජනවාර්ගික සහ ජාතිවාදි අගතිගාමිත්වයට නිර්මුක්ත වූ ඔවුන්, සමහර විටදි පිළිකුලට සහ අපකීර්තියටත් මුහුණ දෙමින් අවශ්‍යතාවයන් අධිකවූ තැන්හි, තම සේවය යහතින් ඉටුකර සිටිති. සුරදූතික පැවිදි සොහොයුරියන්ගේ අනන්‍යතාවය මෙයයි.**

රොසරි ගුණවර්ධන පැවිදි සොහොයුරිය තබා ඇති සටහනක් අනුව එදා ශ්‍රී ලංකාවෙන් තිබූ දේශපාලන වාතාවරණය අනුව, සුරදූතික නිකායේ පැවිදි සොහොයුරියන්ට ශ්‍රී ලාංකිකාවන් පිට සේවාදායකත්වයක් සෙවිය යුතු බව Laudia රාජගුරු ප්‍රසාදින්වහන්සේ විසින් තීරණය කරන ලදී. මේ අනුව එවකට සිටි මෙල්බර්න් අගරදගුරු තුමා වන Justin Simonds ගේ මැදිහත් වීමෙන් මෙල්බර්න් ප්‍රදේශයේ පැවති ආසියානු ජාතික තරුණියන්ගෙ නේවාසිකාගාරයක් පාලනය කිරීමට සුදුසුම වන්නේ සුරදූතික පැවිදි සොහොයුරියන් බව තීරණය කරන ලදී.

පැවිදි සොහොයුරියන්ට මෙල්බර්න් නුවරට පැමිණීමට බොහෝ බාධක ජය ගැනීමට සිදුවිය. රටින් පිටවීමට ඇති අවහිරකම්, ඕස්ට්‍රේලියාවට ඇතුල්වීමට අවසර පත් ලබා ගැනීමේ අපහසුතාවය, ගුවන් ගමන් වල තිබූ දුර්ලභ බව මේ අතර විය. එවකට සිටි Geelong පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ මැදිහත් වීමෙන් පැවිදි සොහොයුරියන්ට ඕස්ට්‍රේලියාවට ඇතුල්වීමට අවසර පත් ලබා ගැනීමේ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකිවිය. සියලු බාධක ජයගෙන එවකට නිකායේ ප්‍රධානියාව සිටි Martina පැවිදි සොහොයුරිය සහ





තවත් තිදෙනෙක්, 1964 සැප්තැම්බර් 11 වන දින ඩොලර් 10 වැනි සුළු මුදලක් අතැතිව මෙල්බර්න් නුවර බලා ශ්‍රී ලංකාවෙන් පිටත් වන ලදී. එම වසරේ නොවැම්බර් මස 22 වන දින Martina, Philomina Don, Dorothy Affleck සහ Immaculate Ferdinandz යන පැවිදි සොහොයුරියන් මෙල්බරන් නුවරට ගොඩබැසීම සමග පැවිදි සොහොයුරියන්ගේ දීර්ඝ සහ හුදකලා ඕස්ට්‍රේලියානු ධර්මදුත සේවාව එසේ ආරම්භ විය.

ඕස්ට්‍රේලියාවට ගොඩබැසි සුරදූතිකාවන් මෙල්බර්න් අගරදගුරුතුමා විසින් පිළිගෙන, Geelong වල පිහිටි කාන්තා නේවාසිකාගාරයක්, පැවිදි සොහොයුරියන්ගේ නව අඩිතාලම තබා ගැනීම සඳහා පිළියෙල කර දුනි. මෙම නේවාසිකාගාරය සුරදූතික නිකායේ අනුග්‍රාහිකාවවු සුරදූතිකා ශාන්ත මරියා දෙව්මාතාවට කැපවී තිබීම විශේෂත්වයකි. එවකට, Geelong නගරය තුළ ව්‍යාපාර වල සේවය කළ තරුණියන්ට තිබූ එකම නේවාසිකාගාරය මෙය විය. පැවිදි සොහොයුරියන් යටතේ මෙම නේවාසිකාගාරය, සැනසීම සහ ආරක්ෂාව පැතූ තරුණියන්ට ක්ෂේමභූමියක් විය.

සමහරු විනාශවී ගිය පවුල් වලින්ද තවත් සමහරු අන්දමන්ද කමින් පෙලෙන අයවිය. හේතුව කුමක් වූවත්, ඔවුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන්දී ඔවුන්ට ඇප උපකාර කිරීම සුරදූතික පැවිදි සොහොයුරියන් සැම විටම තම කාර්ය කර ගන්නා ලදී.

මේ අතර තම ජීවිතයේ සැඳෑ භාගය ගත කරන කාන්තාවන්ද, සොහොයුරියන්ගේ කාරුණික සාත්තුසේවය ලබා ගැනීමට මෙහි



පැමිණුනි. 1977 හිදී Wangarata වල වැඩිහිටි පිරිමි සහ කාන්තා නිවාසයක් බලා ගැනීමේ වගකීම සොහොයුරියන්ට බාර දෙන ලදී. පැවිදි සොහොයුරියන්ගේ සේවය නිවාස තුළට පමණක් සීමා වූවේ නැත. තටු ඇති සුරදූතිකාවන් මෙන්ම, ප්‍රජාවේ ගිලන්ව වයස්ගතව හුදකලාව තම නිවෙස්වල හෝ ප්‍රදේශයේ වැඩිහිටි නිවාස වල විසූ මව්පියන් බැහැදැක, ඔවුන් දිරිමත් කරමින් අස්වැසීම මොවුන්ගේ ප්‍රේමණීය සේවයේ කොටසක් කර ගන්නා ලදි.

වසර 2000 වන විට පැවිදි සොහොයුරියන්ගේ සේවය ලබා ගන්නන්ගේ අඩුවක් සිදුවූ හෙයින් වසර 39 ක් තුළ නොකඩවා කළ සේවය වෙනස් කිරීමට සිදුවිය. වසම බාර ගත් නව පියතුමාගේ (Kevin Dillon) ඉල්ලීම පරිදි කුඩා භූමියක සිට ඔවුන්ගේ ප්‍රේමණීය සේවය, මෙතෙක් ඉටුකළා හා සමානව උදාරතම අයුරින් ඉටුකිරීමට සුරදූතිකාවන් එකඟවිය. මේ අනුව විවිධ ජනවාර්ගික පවුල් වල ගිලන් වූ හා ආබාධිතයින්ගේ අධ්‍යාත්මික අවශ්‍යතා සඳහා තම සේවයේ නව අදියර අලුත් වූ ප්‍රාණවත්කමකින් සහ උද්‍යෝගයකින් Bell Park වල සිට 2002 සැප්තැම්බර් 12 දින ආරම්භ කෙරිනි. නව අභියෝගයන්ට මුහුණ දීමට ඔවුනට උපාය මාර්ගවල විපර්යාසයක් කිරීමට සිදුවිය. ඔවුන් වෙත පැමිණෙනවා වෙනුවට දැන් ගිලන් වූවන් සහ හුදකලා වූවන් සොයා සුරදූතිකාවෝ පියාසර කළහ.

මෙල්බර්න් වල සිටින ශ්‍රී ලාංකිකයින්ගේ අධ්‍යාත්මික අවශ්‍යතා සඳහා නිල වශයෙන් ශ්‍රී ලාංකික පියතුමෙක් නැති අඩුපාඩුව පිරිමැසීමටද පැවිදි සොහොයුරියන් ඉදිරිපත් විය. ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ සුරදූතිකාවන්ට ලැබෙන ගෞරවය සහ සැලකිල්ල මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. ඔවුන්ගේ නායකත්වය සහ මඟපෙන්වීම යටතේ, ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා කතෝලික සංගමය තුළින් පවුල් සඳහා සාකච්ඡා සංවිධානය කිරීම, තරුණ තරුණියන්ගේ ප්‍රශ්න වලට සංවේදීව ඇහුන්කන්දීම, ශුද්ධ වූ සතිය තුළ විශේෂ මෙහෙයන් සංවිධානය. කුඩා දරුවන් සඳහා ආගමික පංති පැවැත්වීම සිදු වේ.

කොළඹ සිට Geelong දක්වා පැමිණි දීර්ඝ සහ අසීරු ගමන සුරදූතික පැවිදි සොහොයුරියන්ගේ මතකයේ රැඳී තිබෙන බව නොරහසකි. මතකයේ ඇති මේ සියලුම ධර්මදූත සේවාවන් දෙව්පියාණන්ගේ මහිමය උදෙසාය. අද සුරදූතික නිකායේ නිර්දය දූත මෙහෙය කොන්සෙප්ටා, නිර්මලී, ස්ටැන්ස්කෙලාස් සහ කර්මල් යන පැවිදි සොහොයුරියනගේ නිර්භය සුරතේය. සුරදූතික පැවිදි සෙහොයුරියන් මෙල්බර්න් ඉතිහාසයේ නොමැකිය හැකි භූමිකාවක් ඉටුකර ඇත. ඔවුන්ගේ හුදු ධර්මදුත සේවාව තුළින් අද පැවිදි සොහොයුරියන්, 'මිනිස් වෙස්ගත් සුරදූතිකාවෝ' යන විරුදනාමය ලබන බව නම් නියතය. ඔවුන්ගේ තටු ස්වර්ගය ස්පර්ශ කරද්දි ඔවුන්ගේ පා මේ මිහිතලය මත ශක්තිමත් ලෙස රෝපණය වී ඇත.

**ගරු ඔස්වල්ඩ් බී ෆර්ත් නි.ම.නි. පියතුමා**

**සිංහල පරිවර්තනය : සේනක පෙරේරා**

## ශුභ මරණයක .. 5 පිටුවෙන්

මෙලොව හා ශාරීරික මරණය නියතයකි. මෙය නොදැන සිටීම අප හට අභාග්‍යය ගෙන එයි. මරණය ගැන නොදන්නා නොමැරෙන සේ කල් යවයි. ධනය උපැයීමටම කාලය යොදවයි. පසිඳුරන් පිනවන්නටම සිත යොමු කරයි. ආත්මාර්ථයම වඩවයි. දයා කරුණාව පසෙකට දමයි. බලය පසුපසම හඹා යයි. මෙකී කරුණු නිසාවෙන් අන්ධ වන හෙතෙම ලෝ තලය තුළ හැල්මේ දුවයි. හදිසියේම මරණය හමු වූ විට හේ අන්දමන්ද වේ. මන්දයත් ඔහු ජීවත් වූයේ නොමැරෙන සංකල්පය තුළ නිසාය. “නොමැරෙන සංකල්පය ද පරම සත්‍යයකි” එනම් නොමැරෙන ආත්මය නම් වූ සංකල්පයයි. අප විසින් තරයේ වැලඳ ගත යුත්තේ මෙයයි. මැරෙන සිරුර තාවකාලිකය. නොමැරෙන ආත්මය සදාකාලිකය. එබැවින් තාවකාලික සිරුර හා තාවකාලික ආසාවන් ත්‍යාජකොට සදාකාලික ආත්මය හා ස්වර්ගීය ආසාවන් වර්ධනය කර ගැනීමට අප්‍රමාද වෙමු. මේ සඳහා අපගේ මනසට පෝෂණය සලසන සමය මේ මළවුන්ගේ සමයයි. එබැවින් මළවුන් ද, අප ද දෙවිඳුන්ද අතර ඇති සම්බන්ධතාවය ජීවමානව අත්දකින ආධ්‍යාත්මික විවෘතභාවයක් අත්දකින්නට අපි ප්‍රාර්ථනා කරමු.

## හා. ජුසේ වාස් පියතුමන් .. 14 පිටුවෙන්

බුද්ධදත්ත හිමියන්ගේ ආදාහන පූජෝත්සවයේ දී ගුණ සමරු දෙසුමකට ද ගරු ක්වින්ටස් පෙරේරා පියතුමා තෝරා ගැනීමටද එම හිමියන් සමඟ පැවති සමීප ඇසුර හේතුවී ඇත. පියතුමා පෙර අපර දෙදිග භාෂාවන් දහසයක් ප්‍රගුණ කර තිබීම එතුමාගේ පාණ්ඩිත්වයට එක් උදාහරණයකි. එහෙත් එතුමා කිසිවිටෙක තම උගත්කම පිළිබඳව අහංකාර වූයේ නැත.

ජුසේ වාස් තුමන් ශුද්ධවරයට එසවීමේ කටයුතු සඳහා ලේකම් කාර්යාංශයක් සංස්ථාපන කළ ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය ගැටලුවකට මුහුණ පෑවේය. එනම් ජුසේවාස් තුමන් ශුද්ධවරයට එසවීමේ කාර්යභාරයේ මූලික අවශ්‍යතාවයක් වූ ජුසේ වාස් තුමන් හා උන්වහන්සේගේ ශ්‍රී ලංකාවේ දූත මෙහෙවර පිළිබඳව වතිකානයට ඉතාලි බසින් ඉදිරිපත් කළ යුතු ශාස්ත්‍රීය පර්යේෂණ ලේඛනය (POSITIO) සැකසීමට උගත් පියතුමකු තෝරාගැනීමය. රදගුරු සම්මේලනයේ ඒකමතික තෝරාගැනීම වූයේ ගරු ක්වින්ටස් පෙරේරා පියතුමා ය. රදගුරු සම්මේලනය විසින් පවරන ලද භාරදූර වගකීම හිසෙහි දරාගෙන එතුමා තෙවන වරට රෝමයට ගියේය.

රෝමයට ගිය එතුමා ශ්‍රී ලංකාවෙන් සපයාගත් ඓතිහාසික ලේඛනවලට අමතරව වතිකාන ලේඛනාගාරයෙන් සොයාගත් ලේඛනවලින් ද, ලිස්බන් නගරයේ ලේඛනාගාරයේ වූ පැරණි ලේඛනවලින් ද කරුණු රැස්කරගෙන ඒවා ගවේෂණාත්මකව අධ්‍යයනය කර ජුසේ වාස් තුමා පිළිබඳව ශාස්ත්‍රීය පර්යේෂණ ග්‍රන්ථය 1985 දී එළිදැක් වීය. ඒ සඳහා ගරු ක්වින්ටස් පෙරේරා පියතුමා වසර දහයක් පුරා දැඩි වෙහෙසකර කාර්යයක යෙදුනේය. ‘‘ජුසේ වාස් පියතුමා තමයි මගේ පූජක ජීවිතයේ ආලෝකය වුණේ. උන්වහන්සේට මගෙ සිතේ ලොකු ආදරයක්, ගෞරවයක් තිබුනා. ඒක තමයි ඒ භාරදූර කාර්යයට මට ලොකු ශක්තියක් වුනේ. උන්වහන්සේ භාග්‍යවරයකු වීම මට විශාල සතුටක්’’ ජුසේ වාස් තුමන් භාග්‍යවරයට එසවී දින කීපයකට පසු ගරු ක්වින්ටස් පෙරේරා පියතුමා ලියුම්කරුට පැවසීය. එහෙත් අවාසනාවට ශ්‍රී ලංකා කතෝලික ශාසන වංශ කතාවට නව පරිච්ඡේදයක් එක්කරමින් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් 1995 ජනවාරි 21 වැනි දින කොළඹ ගෝල්ෆේස් පිටියේ දී ජුසේ වාස් පියතුමන් භාග්‍යවරයට එසවීමේ උත්සවය සඳහා ගරු ක්වින්ටස් පෙරේරා පියතුමාට ආරාධනා පත්‍රයක් හෝ ලැබුනේ නැත.

ශ්‍රී ලංකාවේ කිතුනු පූජක පරපුරෙහි දිදුලන මාණික්‍යයක් වැනි ගරු ජෝ. ක්වින්ටස් පෙරේරා පියතුමා වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම බහුශ්‍රැතියකු විය. එතුමන් විසින් ජුසේවාස් පියතුමන් අරභයා සම්පාදිත පිටු 1045 කින් සමන්විත යෝධ ග්‍රන්ථය එතුමාගේ බුද්ධි මහිමයට ජීවමාන සාක්ෂි සපයයි. පසුකාලීනව ජුසේ වාස් තුමන් පිළිබඳව ලියැවුනු සෑම පත පොතකටම ගුරුකොට ගැනුනේ එම විශිෂ්ට කෘතියය.

ගරු ක්වින්ටස් පෙරේරා පියතුමා රාජකීය ආසියාතික සංගමයේ ද, ශ්‍රී ලංකා ඉතිහාස සංගමයේ ද යාවජීව සාමාජිකත්වය දැරීය. එතුමාගෙන් ඉටුවූ ජාතික මෙහෙවර අගයමින් වයඹ පළාත් සභාව එතුමා ‘‘පරම විඥාන’’ සම්මානයෙන් පිදීය. වසර 87 ක් ආයු වළඳා ස්වර්ගස්ථ වන තෙක් ඉතාමත් නිරෝගීව කායික හා මානසික සුවයෙන් එතුමා පිරිපුන්ව සිටියේය. සිය දිවියේ සැඳෑ සමය හලාවත රදගුරු නිවෙසේ ගත කළ එතුමා 2002 සැප්තැම්බර් 25 වැනි දින ස්වර්ගස්ථ විය. එතුමාගේ දේහය සැප්තැම්බර් 28 වැනි දින හලාවත කතෝලික සුසාන භූමියේ මිහිදන් කරනු ලැබීය.

ගරු ක්වින්ටස් පෙරේරා පියතුමන් සමිඳු අබියස සමාදානයේ සැතපේවා!

## ප්‍රදීප වාර්තාකරු යුග දිවි රජත සමරුව



**මීගමුව, තලාහේන ඥානාර්ථ ප්‍රදීපය වාර්තාකරු එන්. ඩබ්. පීටර් සෙබස්තියන් පෙරේරා මහතා ඊ. ප්‍රීඩා සිල්වා මහත්මිය හා විවාහ වී වසර 25 ක් පිරීමේ රජත ජයන්තිය ඉකුත් දා සැමරීය.**

1981 සිට මේ දක්වා ඥානාර්ථ ප්‍රදීපය සුහද සේවා වාර්තාකරු ලෙස කටයුතු කරන ඒ මහතා කලක් දහම් පාසල් ගුරුවරයකු ලෙසද එහි විදුහල්පති ලෙස ද කටයුතු කර ඇත. විසෙන්ති පාවුලා සේවාවේ කැපවූ නායකයෙකි.

තලාහේන රෝ.ක. පාසලෙන් හා පිටිපන මහ විදුහලින් සිප් සතර හැදෑරූ ඒ මහතා ධීවර අමාත්‍යාංශයේ සේවය කර පසුව ඉවත් විය. ග්‍රාම සංවර්ධන සමිතිය, නවහිරු යෞවන සමාජය, මීසම් ධර්ම සේවා සභාව ආදියේ ද සේවය කර ඇත. දුන්ගාල්පිටිය දොන් බොස්කෝ ආයතනයේ සැලේසියාන සහකරුවකු ලෙස වර්තමානයේ කටයුතු කරන එම යුවළට එක් පුතකු සිටී. එම යුවළට ප්‍රදීප සුබපැතුම්!

# ශා. ජුඩ් දෙව්මැඳුර - වැල්ලබඩ, පමුණුගම



**කොළඹ, මීගමුව, පමුණුගම හරහා මුහුදුබඩ නව කොන්ක්‍රිට් මාර්ග යේ පමුණුගම පසු කළ පසු හමුවන වැල්ලබඩ මුහුදු වෙරළ ආසන්නයේ පිහිටි රමණීය ග්‍රාමයකි. මෙම ගම් පෙදෙසෙහි, බහුතර ජනතාව ධීවර රැකියාවෙහි නියැලුනු අය වෙති.**

බෝපිටිය සා. නිකුලා දෙව්මැඳුරට ද, පමුණුගම ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරට ද, උස්වැටකෙයියාව සා. මරියා දෙව්මැඳුරට ද දුරස්ථව පිහිටි මෙම ගම් පෙදෙස් ජනතාව කලක් ආගමික කටයුතු වලින් දුරස්ථව සිටියෝ ය. මෙම ආධ්‍යාත්මික ඌනතාවය දුටු එකල පමුණුගම දෙව්මැඳුරට සම්බන්ධ පස්වන නුවානයේ අන්නාවි තනතුර දැරූ බැතිමත් කිතුනුවකු වූ ජේ. ඩී. රෝගුස් ගුරු මහතා ප්‍රමුඛ ප්‍රදේශයේ බැතිමතුන් පිරිස් විසින් එවකට පමුණුගම මීසම් සේවක සග සැපත් කිතුනු දහම් විරුවකු වූ ගරු අබා කොස්තා පියතුමන්ගේ අනුග්‍රහය ලබාගෙන මෙහි ආගමික මධ්‍යස්ථානයක් පිහිටුවා ගැනීමට තීරණය කරන ලදි.

ඉහත කී ආගමික අරමුණ සපුරාලීම සඳහා පරණම්බලම ග්‍රාමයේ නොමසුරු බැතිමත් දානපතියකු වූ ඩී. ඩී. සෙබස්තියන් එඩ්මන්ඩ් සපරමාදු මහතා වැල්ලබඩ පිහිටි තම ඉඩමෙන් අක්කර කාලක පමණ භූමි ප්‍රමාණයක් එම ආගමික මධ්‍යස්ථානය සෑදීමට නොමසුරුව පරිත්‍යාග කළේ ය. ඉහත කී ඉඩම් කොටස පරිත්‍යාග කිරීමෙන් පසුව දිරිමත් වූ බැතිමත් ගම්වැසියන් එකී ඉඩම් කොටස එළිපෙහෙළිකොට තාවකාලික ආවරණයක පුදසුනක් තනා 1975 ජනවාරි මස 01 දින එහි පළමුවන දිව්‍ය යාගය පමුණුගම මීසම් සේවක ගරු අබා කොස්තා පියතුමා විසින් සිදු කරන ලදි. ඉහත කී සංවිධායක මණ්ඩලය විවිධ ක්‍රමවේදයන් උපයෝගි කරගෙන අරමුදල් සපයාගෙන ලෑලි ගසා පොල් අතු සෙවිලි කළ තාවකාලික ගොඩනැගිල්ලක් තනා සා. ජූඩ් මුනිඳුන්ගේ දෙව්මැඳුර ලෙස නම්කර ආගමික කටයුතු පවත්වාගෙන යන ලදි. ඉන්පසු මෙම කුඩා දෙව්මැඳුරේ ඉරුදින දිව්‍ය පූජා යාගය සහ බ්‍රහස්පතින්දා ජූඩ් මුනිඳුන්ගේ නොවානය සහ දිව්‍ය පූජාව සිදු කරන ලදි.

දෙව්මැඳුරට තම ඉඩම් ප්‍රමාණය පරිත්‍යාග කළ දානපති එඩ්මන් සපරමාදු මහතා විසින් නව දෙව්මැඳුරේ අත්තිවාරමට අවශ්‍ය කලු ගල්, සිමෙන්ති යනාදි අමුද්‍රව්‍ය සපයා දුන් බැවින් අත්තිවාරම දමන්නට යෙදින. ලොතරැයියක් පවත්වා ලබා ගත් මුදල් වලින් ද ග්‍රාමවාසීන්ගෙන් හා අවට ග්‍රාම වාසී සැදැහැවත් දානපති ප්‍රභූන්ගෙන් ද ප්‍රදේශයේ ධීවර ජනතාවගේ පරිත්‍යාගී මුදල් වලින්ද ගොඩනැගිලි කමිටුව විසින් උපයාගත් මුදල් වලින් ද නව දෙව්මැඳුර තැනීමේ කටයුතු ආරම්භ කිරීමට හැකි විය. එවකට පොකුරු මීසමේ අධිපති වශයෙන් ක්‍රියා කළ ගරු ලූෂන් ඩෙප් පියතුමා විසින් මෙම නව දෙව්මැඳුරු ගොඩනැගිල්ල තැනීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මඟ පෙන්වීම දෙන ලදි. 1982. 10. 18 වන දින නව දෙව්මැඳුරු ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කෙරුණි. වහලය තැනීම සඳහා අවශ්‍ය උළු ප්‍රමාණය ඉහත කී එඩ්මන්ඩ් සෙබස්තියන් සපරමාදු මහතා විසින් පරිත්‍යාග කරන ලද හෙයින් වහලය ගසා දෙව්මැඳුර තැනීමේ මූලික කටයුතු නිම කරන ලදි. ඉන්පසු නව දෙව්මැඳුරු ගොඩනැගිල්ලේ ආගමික මෙහෙයන් හා මංගල්‍ය කටයුතු දිනෙන් දින උත්සවාකාරයෙන් පැවැත්විණ.

වර්ෂ 1978 දී පමුණුගම මීසමට අයත්ව තිබුණ බෝපිටිය දෙව්මැඳුර වෙනම මීසමක් වූ පසු වැල්ලබඩ සා. ජූඩ් දෙව්මැඳුර ද බෝපිටිය මීසමට අයත් විය.

ජා-ඇල කලාපයේ අනුනායක අතිගරු ශාන්ති කුමාර් වැලිවිට පියතුමන් මෙම මීසම් ගෘහයේ නේවාසිකව සිටිමින් දෙව්මැඳුරේ ආගමික කටයුතු වලට සහය දක්වන්නේ ය. එසේම දෙව්මැඳුරට ගරාදි වැටක් තැනීම හා සංක්‍රිස්තියන් කාමරයක් ද තනා දීමට වත්මන් බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ දායකත්වය නොඅඩුව ලැබී ඇත්තේ ය.

මෙම දෙව්මැඳුර තැනීමට සභාවෙන් හෝ වෙනත් බාහිර ආයතනයකින් ආධාර නොලැබුනු අතර ප්‍රදේශයේ සැදැහැවත් ජනතාවගේ නොමසුරු ආධාරයෙන් හා ජනතා ශ්‍රමදානයෙන් ගොඩනැගුන දෙව්මැඳුරක් බව ආඩම්බරයෙන් සඳහන් කළ හැකිය. තවද දෙව්මැඳුරේ සියළු වැඩකටයුතු වලදී ආධාර දෙන භාණ්ඩාගාරික ප්‍රදේශයේ නොමසුරු දානපතියකු වන නිව්ටන් රුද්‍රිගු මහතාගේ පරිත්‍යාගශීලි කැපවීම ද අගේ කළ යුතුව ඇත.

මෙවර දෙව්මැඳුරේ ජූඩ් මුනි වාර්ෂික මංගල්‍යය ඔක්. 26 වන දා (අද) පැවැත්වේ.

**(බී. කේ. එම්. එස්. රුද්‍රිගු සහ ජෝ. සංගපාලආරච්චි)**



බටේපොල මීසමට අයත් දිවුලපිටිය ශු. කුඩා තෙරේසා දෙව්මැඳුරේ 85 වන වාර්ෂික මංගල්‍යය පසුගිය දා අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීය.

මීසම් සේවක ගරු සමන්ත කුරේරා පියතුමාගේ මෙහෙයවීම හා මගපෙන්වීම යටතේ එම දේවස්ථානයේ තරුණ සමිතියේ සාමාජික සාමාජිකාවන් හා ග්‍රාමවාසී බොහෝ දෙනාගේ ද සහය ඇතිව පොල්පිති ආධාරයෙන් අලංකාර වූ තොරණක් ඉදිකරනු ලැබීය. **(ප්‍රභාත් හැඳලගේ)**



**බඩල්ගම දේවස්ථානයේ තරුණයන් පොල් තොරණක් නිර්මාණය කරන ලදී. මීසම් පාලක ගරු ඇන්ටනී රංජිත් පියතුමාගේ සහ සහයක ගරු අජිත් සුරංග අප්පුහාමි පියතුමාගෙත් මග පෙන්වීම හා කැපවීම මේ සඳහා ලැබුණ අතර මෙම තොරණ නිර්මාණය කිරීමට නෙවිල් රූපස් මහතාගේ දායකත්වයද ලැබිණ. (කේ. අබේසේකර)**



**මොණරාගල දිසාවේ තරුණ තරුණියන් හා යොවුන් ළමුන් පිරිස සඳහා වැඩමුළුවක් පසුගියදා බිබිල ශුද්ධවූ පවුලේ දේවස්ථානයේ දී පැවැත්වූණි. මෙයට මොණරාගල දිසාවේ තරුණ හා යොවුන් පිරිස 100 කට අධික ප්‍රමාණයක් සහභාගි වූහ.**

**මෙහිදි යොවුන් ළමුන් මෙහෙයවන ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා වන අතර තරුණ පිරිස සඳහා වැඩමුළුව මෙහෙවනු ලැබුවේ ආචාර්ය මහින්ද නාමල් මහතා විසිනි. (අෂාන් විල්කන් කෲස්)**

## ආදර පියාණනි, ඔබට සග සුව!

### ශාන්තසිරි හෙට්ටිආරච්චි



ආදර තාත්තේ, සමිඳු සෙවණට ගොස් නොවැම්බර් මස 01 දිනට තෙවසරක් ගතවෙද්දි ඔබ සදා මතකය නැවත නැවත දෙවිඳුන් ඉදිරියේ දිග හරිමින් යාච්ඤා කරන්නේ, ඔබගේ ආදර දූ දරු පිරිස හා මුණුබුරු මිණිබිරියන් ය.

## ගුවන් විදුලි නත්තල් බැති ගී තරගය

**ඔබ කංඩායමත් නත්තල් බැති ගී තරගයට සහභාගි වීමට කැමති නම් විස්තර ලබා ගැනීමට පහත සඳහන් ලිපිනයෙන් විමසන්න. ලේකම්, කිතුනු උපදේශක සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07. දු. අංක 0772 981526**

## ඥානාර්ථ ප්‍රදීපයේ විරුවෝ



ලුණුවිල, පෙස්ටස් මාවතේ පදිංචි කේ. කේ. ඇන්ටනි ප්‍රනාන්දු මහතා 1965 වසරේ සිට බණ්ඩිරිප්පුව, ලුනුවිල ප්‍රදේශයේ ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත් අලෙවි කරන්නකු වේ.

තම දෙපයින් ගෙන් ගෙට යමින් මෙම දැහැමි ක්‍රියාවෙහි යෙදෙන ඒ මහතා දැනටත් ප්‍රදීපය අලෙවි කරන්නේ ඉමහත් කැපවීමකිනි. එතුමනට ප්‍රදීපයේ උපහාරය.



හලාවත රදගුරු වසමේ දුම්මලදෙනිය - තල්දෙක මීසමේ සියඹලාපිටියගේ ඔගස්ටින් ඇන්ටනි ද සිල්වා (මංගල) මහතා 80 විය සපිරූ ක්‍රියාකාරී කතෝලික බැතිමතෙකි.

සිය ජීවිත කාලයෙන් වසර 50 කට වැඩි කාලයක් ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත එම මීසම තුළ බෙදා හැරීම සඳහා සිය ශ්‍රමය පුද කළේය. කුරුණෑගල රදගුරු වසමේ ගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමාගේ පියාණන් වන මෙතුමාට පවුලේ සියලු දෙනාගේ ද සහය පුවත්පත බෙදා හැරීම සඳහා නොඅඩුව ලැබිණි.